ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත


ශුද්ධෝත්තම පියතුමාගේ 2012 ලෝක සාම දින පණිවුඩයෙන්...
**තරුණ පරපුර යුක්තිය හා සාමය පිළිබඳ දැනුවත් කරමු** 3 පිටුව


**2011 කිතුනු ඇසින්**
ගෙවුණු වසර පිළිබඳ කිතුනු ඇසකින් බලා කැරෙන ආවර්ජනයක්.. 8 පිටුව


**නත්තල් මිහිරියාව ගැන පළවූ ගිහි මත**
නොම්ලේ බෙදාහැරෙන, ගිහි නායකත්වයෙන් පළවන නත්තල් සඟරා පිළිබඳවයි. 10 පිටුව


**2010 වසරේ හොඳම ආගමික පුවත්පත**

# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජූනි 07


**පරිශුද්ධ දේවමාතාවන්ගේ මංගලෝත්සවය ජනවාරි 01 දා**

ක්‍රි.ව. 2012 ක් වූ ජනවාරි මස 01 ඉරිදා 146 වෙළුම 30 කලබ සතිපතා පත්‍රය - පිටු 20 - මිල රු. 20 QD/12/NEWS/2012 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි.

## සුබ නව වසරකට ප්‍රාර්ථනා!

උදාවූ 2012 නව වසර දෙව්ඳු ආශිර්වාදයෙන් සුබ වසරක් වේවා!යි "ඥානාර්ථ ප්‍රදීපය" ප්‍රධාන කර්තෘ ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා, උප කර්තෘ ශිරාන් මෛත්‍රි, සහය සංස්කාරක කුමර නයනජිත් සමඟ ලතා ප්‍රනාන්දු, ක්‍රිෂාන්ති පෙරේරා, රසික සම්පත්, සුරේෂ් දර්ශන සමඟින් කතෝලික මුද්‍රණාලයේ අධිපති ගරු රොහාන් ද අල්විස් පියතුමා ප්‍රදීප පාඨක, ලේඛක ඇතුළු සියලු ශ්‍රී ලංකා වාසීන්ට ප්‍රාර්ථනා කරති.

## ගාල්ල පදවියට නව කලාපීය නාහිමි නමක්!



මාතර රුහුණේ අප ස්වාමිදූ සිද්ධස්ථානයේ පාලක ගරු චාල්ස් හේවාවසම් පියතුමා ගාල්ල රදගුරු වසමේ නව කලාපීය නාහිමිපාණන් වශයෙන් පත් කරනු ලැබ තිබේ. ගාල්ල රදගුරු අති උතුම් රේමන්ඩ් වික්‍රමසිංහ හිමිපාණන් විසින් සිදුකරනු ලැබ ඇති මේ නව පත්වීමත් සමඟම අතිගරු චාල්ස් හේවාවසම් පියතුමා ගාල්ල රදගුරු වසමේ සාන්ත සේවියර් කනිටු දෙව්සත්හලේ අධ්‍යක්ෂ පියතුමන් ලෙස ද පත් කැර තිබේ. ගරු පියතුමාට ප්‍රදීප සුපැතුම්!

## ගී නළු ද්විත්වය මීගමුවේ දී වේදිකාගත වේ

අගරදගුරු පදවි තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරය, අගරදගුරු පදවි ළමා ධර්ම දූත ව්‍යාපාරය, අගරදගුරු පදවි ධර්මෝපදේශ අපොස්තලික සේවාව හා සෙත්සරණ කරිටාස් කොළඹ ආයතනය එක්ව සංවිධානය කරනු ලබන "හිරු දුටු පිණිබිඳු" සහ "අඳුර දුරුව පෑයූ හිරු" ගී නළු ද්විත්වය 2012 ජනවාරි මස 07 දා ප.ව. 2.30 ට සහ ප.ව. 6.30 ට මීගමුව මාරිස්ටෙලා විද්‍යාලයීය ශ්‍රවණාගාරයේ දී වේදිකාගත වීමට නියමිතය. ඒ සඳහා ප්‍රවේශ පත් කටාන, මීගමුව, නැගෙනහිර මීගමුව (බෝලවලාන) යන දිසාවන්ට අයත් සියලු මීසම් වලින් සහ සෙත් සරණ කොළඹ ආයතනයේ මීගමුව ශාඛාවෙන් ලබා ගත හැකිය.

## රටම වෙලාගත් මෙවර නත්තල් මහෝත්සවය තුළ

# සැදැහැබර බැතියාවට මුල්තැන

**ගෙවී ගිය නත්තල දිවයින පුරා කතෝලික බැතිමතුන් ආගමානුකූල පිළිවෙත් වලට හා ආධ්‍යාත්මිකත්වයට මුල් තැන දෙමින් සැමරූ බව "ඥානාර්ථ ප්‍රදීපය"ට වාර්තා වේ. නත්තල් මංගල්‍යය බාහිර ආටෝපයන්ට නතු කර ගනිමින් සිය වාණිජ අරමුණු සපුරා ගැනීම උදෙසා යොදා ගැනීමට වෙළෙඳ ප්‍රජාව මෙවරත් වෑයම් කළ අන්දමක් දක්නට ලැබුණි.**

මේ අතර නත්තලේ සැබෑ අරුත විකෘති කරමින් විවිධ මුසාවාදයන් මහා මතවාදයන් ලෙස ඉදිරිපත් කිරීමටත් ඒ ඔස්සේ නත්තලේ සාමය වෙනුවට වෛරය, ක්‍රෝධය වපුරමින් සසුන් නායකත්වයත්, කතෝලික සභාවත් භේද භින්න කිරීමේ වෑයම් ද ඊනියා දේවධර්මවාදීන් විවිධ මාධ්‍ය ඔස්සේ එළිදක්වන්නට තැත් දැරූ බවක් ද දක්නට ලැබිණ.

මේ සියල්ල මධ්‍යයේ සැදැහැබර බැතියාවත්, නත්තලේ බෙදා හදා ගැනීමේ හා ප්‍රේමය පතුරුවාලීමේ කිතුනු ගුණාංග විවිධ අංශ වලින් රට පුරා පැතිර වූ බැව් අපට ලැබෙන තොරතුරු වලින් අනාවරණය වේ. මේ සියල්ල අනාගාමිකයන් මහත් උපේක්ෂාවෙන් හා දයාර්ද්‍රව පිළිගත් අන්දම ද තැනින් තැන ඔවුන් ඒවාට දායක වීමෙන් ප්‍රත්‍යක්ෂ වූ බැව් වාර්තාකරුවෝ දක්වති.

මේ අතර පවුලේ මංගල්‍යයක් ලෙසින් පරම්පරා ගණනාවක් තිස්සේ පවත්වාගෙන එන නත්තල් මංගල්‍යයට සෙසු ආගමික කොටස් කිතුනු ආගමිකයන්ගේ ඇරියුමින් ප්‍රීති ප්‍රමෝදය බෙදා හදා ගැනීමට විවිධ ආකාරයෙන් දායක කාරක වූ අන්දම ද මෙවර නත්තලේ දී දක්නට ලැබිණි.

## "නව උපතක්" අත්දකින්නට එකමුතු වෙමින්...



පසුගිය නත්තල් දා රාවතාවත්ත "ප්‍රේම නිවසට" පැමිණි අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් සහ ශ්‍රී ලංකා - ඉන්දීය මහ කොමසාරිස් අශෝක් කේ. කාන්ත මහතා තෙරේසා මව්තුමියගේ දයාවේ ධර්මදූතිකාවන් හා කුඩා දරුවන් සමඟ නත්තල් එකමුතුව බෙදා ගත් මොහොතක්.... මේ අවස්ථාවට ගරු මේරි එලීසා පැවදි සොයුරිය ද, මහකොමසාරිස් කාර්යාලයේ නිලධාරීන් පිරිසක් ද එක්වූහ. (සේයා - ගරු ජූඩ් සමන්ත පියතුමා)

## නව වසරට සුබ පැතුම්



සුබ වෙයි ද? අසුබයි ද?
නව වසර අදින් උදාවන
සතුය ඔබ සියල්ල නොපැකිළව
කළහොත් මෙයාකාර

නැඹුරු වෙමු - යටගියාව
අමතක කොට
පසසමු - දුන් සියලු දේට
එලෙසම - නොදුන් දේටත්
සමගි වෙමු - කතා කරමු
වෙනදාටත් වැඩියෙන්
දෙවිඳුන් සමඟ
අත්වැල් බැඳ මිතුරකු සේ කලණ

හෙළා දකිමු - අසාධාරණය
පිටු දකිමු - අයුක්තිය
දුරස් කරමු - කුහකකම - කපටිකම
උදුරා දමමු - ඉරිසියාව - ක්‍රෝධය
කිසිදා යළිත් නූපදින්නට

ඇති කර ගනිමු - වපුරා ගනිමු
සරු බිමේ - අස්වැන්න සේ
පහන් සිතුවිලි
ආදරය - පිළිගැනීම - සාමය
හොඳ හිත
කිසිදා නොමැකෙන්නට
ගල මත ඉදි කළ අත්තිවාරමක් සේ
ඔබ සැමට නව වසරක් වේවා! සුබම සුබ

**වසන්ත පී. ඒ. රත්නායක**

## කතෝලික සභාවේ ආගමික සහජීවන පිළිවෙත අගය කළ යුතුයි

### දකුණු පළාත් ආණ්ඩුකාර කුමාරි බාලසූරිය මැතිනිය කියයි

**මංගල ජයවර්ධන විසිනි**

"දකුණු පළාත ආගමික හා සංස්කෘතික වටිනාකම් වලින් පූර්ණයි. ඊට දකුණු පළාත් කතෝලික සභාවෙන් ලැබෙන්නේ ඉමහත් ශක්තියක්. ක්‍රිස්තුන් වහන්සේ ලොවට ගෙනාවේ සාමය යි. ඒ සාමයට සාක්ෂි දරමින් කතෝලික සභාව ආගමික සහජීවනය රැක ගැනීමට ඇප කැපවීම අගය කළ යුතු "යැයි දකුණු පළාත් ආණ්ඩුකාර කුමාරි බාලසූරිය මැතිනිය ප්‍රකාශ කළාය.

ගාල්ල ශ්‍රී හෘදය කන්‍යාරාම බාලිකා පාසලේ නත්තල් උත්සවය ගාල්ල රදගුරු අති උතුම් රේමන්ඩ් වික්‍රමසිංහ හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැති අවස්ථාවට එක්වෙමින් දකුණු පළාත් ආණ්ඩුකාර තුමිය එසේ පළ කළාය.

මෙහිදී අනුශාසනාව කළ ගාල්ල රදගුරු අති උතුම් රේමන්ඩ් වික්‍රමසිංහ හිමිපාණෝ මෙසේ පැවසූහ.

"කුඩා දූ පුතුන්ගේ හැකියාවන් දක්ෂතාවයන් ඔවුන් ගේ ම නිර්මාණය දකින අපි සතුටු වී ඔවුන් අගය කරන අතර තවත් අන්දමකින් බියකරු සමාජ වටපිටාවක් ගොඩනැගෙමින් තිබෙන බව අප අමතක නොකළ යුතුයි. එය නම් අප කාටවත් රහසක් නොවන ගබ්සාව නම් මහා ඛේදවාචකයයි. කළල අවධියේ පටන් ම මිනිස් දිවියේ අයිතිය ඇත්තේ දෙවියන් වහන්සේට යි. ඒ ජීවිතය විනාශ කිරීමට අයිතියක්, බලයක් කිසිවෙකුටවත් නැහැ. අද, බිහිරි දරුවන් සිටි පවුලක ඊළඟට උපදින්නට සිටින දරුවා එදා ගබ්සා කළා නම් අපට ලෝක

15 පිටුවට ▶

## කතෝලික පියතුමන්ට විශේෂ හැඳුනුම් පතක්!



**මාණ්ඩලික වාර්තාකරුවකු විසිනි**

මෙරට කතෝලික පියතුමන්ගේ අනන්‍යතාවය ආරක්ෂා කර ගැනීමටත්, විවිධ පුද්ගලයන් කතෝලික පියතුමන්ගේ ස්වරූපයෙන් හැසිරෙමින් සිදුකරන කටයුතු අවම කිරීමටත්, කතෝලික පියතුමන් වෙනුවෙන් විශේෂ හැඳුනුම්පතක් නිකුත් කිරීමට යයි.

කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ මග පෙන්වීම යටතේ රජය මගින් මේ වැඩසටහන සකස් කර තිබේ. කතෝලික පියතුමන්ගේ ලෝගුවට සමාන ඇඳුම් පැළඳුමින් සැරසෙමින් හැසිරෙන ඇතැම් කතෝලික නොවන පිරිස් නිසා කතෝලික සැදැහැවතුන් විවිධ අවස්ථාවල නොමඟ යෑමේ සිද්ධීන් ගණනාවක් පිළිබඳව පැමිණිලි ලැබී ඇති බැව් ප්‍රදීපයට වාර්තා වේ.

## ජාතික කතෝලික ගිහි සංවිධානය "ප්‍රේම නිවාස" සිද්ධිය හෙළා දකී



**මාණ්ඩලික වාර්තාකරුවකු විසිනි**

මොරටුව රාවතාවත්ත "ප්‍රේම නිවාසය" වැටලීමේ අවාසනාවන්ත සිද්ධිය හෙළා දකිමින් ජාතික කතෝලික ගිහි සංවිධානය මගින් ප්‍රකාශයක් නිකුත් කර තිබේ.

ජාතික කතෝලික ගිහි සංවිධානයේ ලේකම් වික්ටර් සිල්වා මහතාගේ අත්සනින් නිකුත් කළ මේ ප්‍රකාශය මගින් අදාළ සිද්ධියේ දී ඇතැම් වගකිව යුත්තන් හැසිරුණු අවිනීත ආකාරයත්, ද්වේෂ සහගත අනිසි මාධ්‍ය ප්‍රචාරයත් තරයේ හෙළා දැක තිබේ.

**"ඔවුන් මාගේ නාමය කියා අයදින විට මම ද ඔවුන්ට ආසිරි වස්වමි" (ගණන් කථාව 6:22-27)**

## පදවියෙන් පදවියට

# ඥානාර්ථ ප්‍රදීපය කතෝලික මාධ්‍ය කඳවුර බලගැන්වූ මොහොතක්!





සිරිලක විසිරී පැතිරී සිටින ඥානාර්ථ ප්‍රදීපයේ කතෝලික ලේඛක ලේඛිකාවියන්ගේ සුහද හමුවක් පසුගියදා කතෝලික මුද්‍රණාල ශාලාවේදී සුහදත්වය, සහෝදරත්වය හා එකමුතු බව සංවේදීව පැවැත්විණ.

ඥානාර්ථ ප්‍රදීපය ප්‍රධාන සංස්කාරක ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි හා භක්ති ප්‍රබෝධනය සංස්කාරක ගරු ඩිලාන් පෙරේරා (නි.ම.නි) පියතුමන් විසින් අගරදගුරු මැඳුරේ දිව්‍යහෘදයේ දෙව්මැඳුරේදී සියලු මාධ්‍යවේදීන්ගේ සාමූහික බැතියෙන් දිව්‍ය පූජා යාගයක් පුදන ලදී.

කතෝලික මුද්‍රණාලයේ අධ්‍යක්ෂ ගරු රොහාන් ද අල්විස් පියතුමා ප්‍රදීපය උසුලාගෙන යන අයුරු විස්තර කළේය. දැන් ප්‍රදීපයේ බර සැහැල්ලු වී අළුත් ගමනක් යන්නට සුබ පෙර නිමිති පහලවී ඇති බවත්, නොදුරේම ප්‍රදීපය නවීකරනය වී ශක්තිමත්වී යෝධ පිම්මක් පැනීමට සූදානම් බවත් සියලු මාධ්‍යවේදීන් අමන්දානන්දයට පත් කරමින් ප්‍රකාශ කරන ලදි.

ඥානාර්ථ ප්‍රදිපය සංස්කාරක ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා කතා කරමින් ප්‍රදීපය දැන් සිරිලක අස්සක් මුල්ලක් නැර ජාති, ආගම් භේදයෙන් තොරව කියවන බවට හැම ප්‍රදේශයකින්ම ලැබෙනෙ ලිපි, විවේචන. චෝදනා, අපහාස උපහාස පැසසුම් වලින් පැහැදිලි වන බව ප්‍රකාශ කළේය. ලොව දසතම ප්‍රදීපය ගලාගෙන ගොස් ඇති බවට එම රටවලින් ලැබෙන ප්‍රතිචාර ගෙන හැර දක්වමින් සංස්කාරක පියතුමා තවදුරටත් ප්‍රකාශ කළේය. කාලීන ප්‍රශ්න ගැන අවදිව එඩිතරව ලියන මාධ්‍ය පිරිසක් දිරියෙන් යුතුව පෙරට ආයුතු බවද එතුමා ප්‍රකාශ කළේය. ‘භක්ති ප්‍රබෝධනය’ සංස්කාරක ගරු ඩිලාන් පෙරේරා (නි.ම.නි) පියතුමා කතා කරමින් ‘ප්‍රදීපය’ හා ‘ප්‍රබෝධනය’ එකම සොහොයරන් දෙදෙනෙකු සේ කිතුනු මාධ්‍යවේදීන් වැළඳගන්නා බවත් අපේ ප්‍රචාර මාධ්‍ය බලඇණිය තව තවත් සවිවත් ක යුතු බවත් ප්‍රකාශ කළේය. ප්‍රදීපය සහකාර සංස්කාරක ශිරාන් මෛත්‍රී මහතා අනතුරුව මාධ්‍යවේදීන් ඇමතුවේය.

දසතින් පැමිණි ප්‍රබුද්ධ කිතුනු මාධ්‍යවේදීන් සියල්ලන් තමන් හඳුන්වාදෙමින් සුහදත්වය, එකමුතුබව සහෝදරත්වය කුලුගන්වමින් ප්‍රදීපයත් කිතුනු මාධ්‍ය ප්‍රචාරක අංශත් තව තවත් සවිමත් කල යුතු බවත්, දේව වචනය පැතිරීමේ දූතික කාර්යය සඳහා පෙරමුණ ගත යුතු බවත් එකහෙළාම ප්‍රකාශ කරන්නට විය. මීසම්වල පියතුමන් මීට වඩා තම දෙව් සෙව්යේ මූලික කාර්යභාරය දේව වචනය තුළ දේව ජනතාව දැනවුත් කර සවිමත් කළ යුතු ප්‍රචාරක මාධ්‍ය සඳහා විධිමත්ව අවදිවී ක්‍රියා කළ යුතු බවත් කිතුනු මාධ්‍ය සවිමත් කිරීම සඳහා මීසම තුළ ඇපකැපවී ක්‍රියා කළ යුතු යන හඬ එකහෙලා ප්‍රකාශ කළේය.

සංවාදයෙන් පසුව සියලු මාධ්‍යවේදීන්ට දිවා භෝජන සංග්‍රහයක් පැවැත්විය.

ජෝ. සංගපාලආරච්චි

## ජපමාල නිකායේ නව ශ්‍රේෂ්ඨාධිපතිනිය

යාපනය අතිඋතුම් තෝමස් සෞන්ද්‍රනායගම් හිපාණන්ගේ ප්‍රධානත්වයෙන් 2011 පැවැත්වූ පොදු කතිකාවතෙන් ශ්‍රී ලංකා ජපමාල තාපසිකා නිකායේ නව ශ්‍රේෂ්ඨාධිපතිනිය ලෙස ගරු මේරි හෙලන් ජයන්ති මව්තුමිය තේරි පත් වී ඇත.

එතුමියගේ අනුශාසක සහෝදරියන් ලෙස ශ්‍රී ලංකාවෙන් ගරු මේරි හෙලේනා සහ මේරි එලිසබෙත් සහෝදරියන්ද, ඉන්දියාවෙන් ගරු මේරි රෝස්මේරි අනුනායක සහෝදරිය ලෙසද, ගරු මේරි පොලින් අනුශාසක සහෝදරිය ලෙසද තේරිපත්වී ඇත.

ගරු මේරි ජෝන් බැප්ටිස් සහෝදරිය

## තරුණ කාන්තා වැඩමුළුවක්

සීදුව සුපුවත් අරණ මධ්‍යස්ථානයට විවිධ ප්‍රදේශ වලින් එක්රුස් වූ තරුණ කාන්තාවන් 160 කගේ සහභාගීත්වයෙන් තරුණ කාන්තා වැඩමුළුවක් පැවැත්විණි. මේ වැඩමුළුවට සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් යන ජන වර්ග 04 නියෝජනය කරමින් කාන්තාවෝ සහභාගි වූහ.

අදහස් හුවමාරු කර ගැනීමේ දී භාෂාව පිළිබඳව විවිධ ගැටලු මතු වුව ද පසුව එය ඉතා රසවත් අත්දැකීමක් විය. එමෙන්ම මෙහි පැවති විවිධ භාවනා වැඩසටහන් හා කණ්ඩායම් ක්‍රියාකාරකම් ද ඒ හරහා ලබාගත් අත්දැකීම් හා පුහුණුව ද මතු දිනක සැබෑ නායකයකු වීමට අවශ්‍ය මගපෙන්වීම ලබාදීමට සමත්

## නිල නිවේදන

### ගාල්ල රදගුරු වසමේ පූජක මාරු හා නව පත්වීම්

**2012 පෙබරවාරි 1-15 දක්වා ක්‍රියාත්මක වේ**

අතිගරු නිහාල් නානායක්කාර පියතුමා - අනුනායක, කතෝලික පාසල් සාමාන්‍යාධිකාරි හා කතෝලික අධ්‍යාපන අධ්‍යක්ෂ, වැලිගම මීසම් සේවක අතිගරු චාල්ස් හේවාවසම් පියතුමා - කලාපීය නාහිමි, අපෝස්තලික සේවා සම්බන්ධීකාරක, කලේගාන සා. සේවියර් කනිටු දෙව්සත්හල් අධ්‍යක්ෂ ගරු රාජා රත්නප්‍රිය පෙරේරා පියතුමා - භාණ්ඩාගාරික, දේවධර්ම නිකේතනය, ආක්ලෝව් විදුහල, ගරු ලලිත් ප්‍රනාන්දු පියතුමා - සහයක භාණ්ඩාගාරික, පදවි වතු හා දේපල ලේඛනාගාරය ගරු සම්පත් විලේගොඩ පියතුමා, රදගුරු හිමි ලේකම් රදගුරු මැඳුරු භාණ්ඩාගාරික, පදවි ප්‍රකාශනයේ සංස්කාරක, ජනවන්දනා අධ්‍යක්ෂ ගරු බර්නාඩ් ප්‍රනාන්දු පියතුමා විවාහ අධිකරණය, ලේඛකාධිකාරි, කණිටු දෙව්සත්හල් ආචාර්ය මණ්ඩලය ගරු මයිකල් කොලින් නික්සන් පියතුමා, ගාල්ල මීසම් සේවක, පදවි ජනසන්නිවේදන අධ්‍යක්ෂ ගරු මෝසස් පෙරේරා පියතුමා බලපිටිය මීසම් සේවක, ගරු තියඩෝර් ලැම්බට් පියතුමා ඇල්පිටිය කුරුඳුගහ මීසම් සේවක ගරු ෂෙල්ටන් ප්‍රනාන්දු පියතුමා හල්පාතොට මීසම් සේවක, ගරු බොනිපස් පෙරේරා පියතුමා, ගනේගම මීසම් සේවක අසිපා පදවි අධ්‍යක්ෂ ගරු බීඩ් නිහාල් ද සිල්වා පියතුමා දෙනියාය මීසම් සේවක ගිහි දූත සේවා අධ්‍යක්ෂ ගරු හර්මන් ප්‍රනාන්දු පියතුමා කලේගාන මීසම් සේවක, ගරු මයිකල් රාජේන්ද්‍රම් පියතුමා සෙඩ්ගෝල් කොඩ්සෙප් අධ්‍යක්ෂ, කිතුනු ආගම් හා අන්තර් ආගම් සංවාද අධ්‍යක්ෂ ගරු ඩේමියන් අර්සකුලරත්න පියතුමා මාතර සිද්ධස්ථාන පාලක, ධර්මදූතාධාර සංගම් හා සරසවි අපෝස්තලික සේවා අධ්‍යක්ෂ, ගරු ඉන්දික ඇන්තනි පියතුමා හිනිදුම කල්වාරි සිද්ධස්ථාන පාලක හා ධර්මෝපදේශ අධ්‍යක්ෂ ගරු රෝලන්ඩ් රුද්‍රිගු පියතුමා තංගල්ල මීසම් සේවක, ගරු මරියලංකාරම් ග්‍රේෂන් පියතුමා හුලංදාව මීසම් සේවක, ගරු බර්නාඩ් විජේරත්න පියතුමා හම්බන්තොට මීසම් සේවක හා ලක්‍රිව් අධ්‍යක්ෂ, ගරු ලියෝ මෙරිල් පියතුමා දෙනියාය සහයක, කොඩ්සිප් සහයක ගරු රවීන්ද්‍ර සෙනවිරත්න පියතුමා ගාල්ල සහයක ශ්‍රම සංක්‍රමික හා බන්ධනාගාර උපාධ්‍ය හා දහම් ගුරු සේවා ගරු කැමිලස් කුරේ පියතුමා පැවිදි පාපොච්චාරණය ඇසීම, දිව්‍ය සංරක්ෂණ පැවිදි සොයුරියන්ගේ ආත්මික අධ්‍යක්ෂ දේවධර්ම නිකේතනය ගරු හැරල්ඩ් මාරසිංහ පියතුමා විශ්‍රාමික ගරු සන්දනම් ඩැනියල් පියතුමා වෛද්‍ය නිවාඩු ගරු ස්ටීවන් පෙරේරා ජේ.නි පවුල් හා ගිහි අපෝස්තලික සේවා ගරු ඇන්ටන් රංජිත් සැනි පියතුමා තරුණ අපෝස්තලික සේවාව.

## අගරදගුරු පදවි ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ වැඩ සටහන (AELT POST O/L) 2012

මෙවර අගරදගුරු පදවි ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ වැඩසටහන (AELT), අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට මෙම වසරේ පෙනී සිටින සිසු සිසුවියන් සඳහා 2012 ජනවාරි මස සිට මාර්තු මස දක්වා සති අන්ත අටක් නේවාසිකව පවත්වනු ලැබේ.

මේ වැඩසටහන හා සමගාමීව මෙවර පිළිගත් විශ්ව විද්‍යාල ආචාර්ය මඬුල්ලක් සම්පත් දායකයින් ලෙස මග පෙන්වනු ලබන පරිගණක පාඨමාලාවන් දෙකක් ඔබට හඳුන්වා දෙනු ලැබේ, එම පාඨමාලා “පරිගණක වැඩසටහන් ඩිප්ලෝමාව (DICA) සහ ග්‍රැෆික් ඩිසයිනින් පිළිබඳ සහතික පත්‍රය (CIGD) වේ.

අයදුම් පත් සහ විස්තර පත්‍රිකා රු. 100/= ක් ගෙවා පහත සඳහන් ලිපිනයෙන් හෝ තමන්ගේ නම සහ ලිපිනය ලියූ, දිග මුද්දර කවරයක් සමග රු. 100/= මුදල් ඇණවුමක් (ජා) ඇල තැපැල් කාර්යාලය ලෙස) එවා තැපෑලෙන් ද ලබාගත හැකිය.

අයදුම් පත් භාරගන්නා අවසාන දිනය 2012 ජනවාරි මස 10 වෙනිදායි.

ගරු අධ්‍යක්ෂ පියතුමා, දෙවන ජුවාම් පාවුළු මධ්‍යස්ථානය, මාළිගය, ජා ඇල. දු.ක. 011-2236251

# කතෝලික දේශපාලකයන්ගේ නත්තල් හමුවක්!



ලෝකය තුළ සාන්තුවරයින් වූ දේශපාලකයින් සිටිනවා. දේශපාලනය යනු පව්කරුවන්ගේ ක්ෂේත්‍රයක් නොවේ. දේශපාලනය කිරීම තුළින් ද ශුද්ධවන්තයින් බවට පත්වීමට හැකියාව තිබෙනවා. එහෙත් එසේ වන්නට නම් දේශපාලනයේ නියැලෙන්නන් සම්පූර්ණයෙන් තමන්ව අමතක කර ජනතාව වෙනුවෙන් සේවය කළයුතු යැයි කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ පවසති. එහිදී වැඩි දුරටත් කතා කළ කාදිනල් හිමි අවංකව ක්‍රිස්තියානි ධර්මයට හා ප්‍රතිපත්තියට අනුව තමන්ගේ දේශපාලන කටයුතු ඉටුකරන්නේ නම් දෙවියන් වහන්සේගේ ප්‍රසාදය මෙන්ම ජනතාවගේ ප්‍රසාදය ලබාගන්නට හැකි බවත් අවංකව වැඩකරන, කැපවෙන දේශපාලකයනට ජනතාවගේ ඡන්දය දිනාගැනීමට වඩාත් පහසුවන අතර ඒ වෙනුවෙන් අමතර වෙහෙසක් දැරීමට, කරදයක් වන්නට අවශ්‍ය නැති බවත් ඉබේම ජනතාවගේ ප්‍රසාදය මනාපය තමන් වෙත ලැබෙන බවත් පැවසීය.

සෙත් සරණ කරිටාස් කොළඹ ආයතනය මගින් සංවිධානය කරන ලද කතෝලික දේශපාලන නායක නායිකාවන්ගේ හමුව කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් අගරදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පසුගිය දා අගරදගුරු මැඳුරු ජුබිලි ශාලාවේ දී පැවැති අවස්ථාවේ උන්වහන්සේ මේ බැව් පැවසූහ.

අති ගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු පියතුමා නත්තල් හමුව ආරම්භ කළ අතර පිළිගැනීමේ කතාව සෙත්සරණ අධ්‍යජෂ ගරු ජූඩ් රාජ් ප්‍රනාන්දු පියතුමා සිදු කළේය.

ෂම්මිකා සුදර්ශනි

## නව සංයුක්ත තැටියක් 7 දා

කිතුනු ගායකයකු වන පයාගල මීසමේ එඩ්වඩ් අයිවන් පෙරේරා මහතාගේ නවතම සංයුක්ත තැටිය මගේ දෙව් උතුම් - 2 සුවය සමිඳුන්ගෙන්මයි ජනවාරි 07 සෙනසුරාදා සවස 3.30 කුඩා පයාගල දහම් පාසල් ශාලාවේදී එළිදකී. මේ උත්සවය සංනිවේදන ජාතික අධ්‍යක්ෂ ගරු බෙනඩික් ජෝශප් පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.

# හෝමාගම කලාපයේ පාසල් ප්‍රථම නත්තල් උලෙළ

ඇනුම කුසලතා ප්‍රගුණ කිරීමට අවශ්‍ය භෞතික සම්පත් සපයාගන්නට අධ්‍යාපනය යොදාගන්නවා. එහෙත් අධ්‍යාපනය එයට සීමා කරන්න බැහැ. අධ්‍යාපනය ඊට වඩා පුළුල් ගැඹුරු දෙයක් යැයි අගරදගුරු පදවි කතෝලික පාසල් සාමාන්‍යාධිකාරි මදුරාවල පියතුමා පැවසීය.

හෝමාගම කලාපයේ ප්‍රථමවරට සංවිධානය කළ නත්තල් උත්සවයට සමගාමීව පැවති තරග මාලාවේ ජයග්‍රාහකයන්ට සහතික පත් හා තෑගි පිරිනැමීමේ උත්සවයේදි පියතුමා මේ බව පැවසීය. හංවැල්ල රාජසිංහ මහා විදුහල් ශාලාවේදි උත්සවය පැවැත්විණි.

අධ්‍යාපන අමාත්‍යාංශයේ කතෝලික ධර්මය පිළිබඳ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ ගරු ග්‍රෙගරි ප්‍රනාන්දු පියතුමා, ජාතික අධ්‍යාපන ආයතනයේ ව්‍යාපෘති නිළධාරි ගරු කාල්ටන් ද සිල්වා පියතුමා, හෝමාගම අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂ කේ. ඒ. ඥානපති, සීතාවක කොට්ඨාශ අධ්‍යක්ෂ ජයසිරි ආරියරත්න, අගරදගුරු පදවි සහකාර කතෝලික අධ්‍යාපන අධ්‍යක්ෂ ගරු නිලන්ත හේෂාන් ප්‍රනාන්දු පියතුමා ඇතුලු පාසල්වල විදුහල්පතිවරු හෝමාගම



කලාපයේ කතෝලික ධර්මය පිළිබඳ ගුරු උපදේශක එල්. සී. ප්‍රසාද් යන මහත්ම මහත්මි ද මේ අවස්ථාවට එක්වූහ.

ජූඩ් රෝෂන් කස්තූරිආරච්චි

ඥානාර්ථ ප්‍රදීපය
ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත
කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk
ක්‍රි. ව. 2012 ජනවාරි 01 ඉරිදා

# පසු විපරම

ක්‍රිස්තුන් වහන්සේගේ උපත සිහිපත් කරන 'නත්තල' උදාවී දැන් සතියක් ගෙවී ගොස් හමාරයි. මෙවරද විවිධ මාධ්‍ය එහි අධ්‍යාත්මික පණිවුඩය පිළිබඳව කථා කරනවාට වඩා සාම්ප්‍රදායික අයුරින්ම වෙනත් පැතිකඩක් ඉස්මතු කිරීමට ගත් උත්සහය වෙනදා මෙන්ම කැපී පෙණිනි. එලෙසම ජාතික යැයි නම් කරන විවිධ පුවත් පත් වලද පලවූ ලිපි වල අන්තර්ගතයේ වැදගැම්මක් නොවූයේ ඒවා වලද සාම්ප්‍රදායික ලෙස පරිබාහිර අවැදගත් දේ හුවා දැක්වීමට පමණක්ම උත්සහ ගෙන තිබීමයි. විවිධ කතුවැකි වලින් පවා උත්සහ ගෙන තිබුනේ නත්තල් මංගලෝත්සවයට සැමදා ලබා දෙන්නට උත්සහ කරන ලේබලයම අලවා යාංහෑලි විස්තරයක් ගෙන ඒමටයි. සමහරුන් උත්සහ ගෙන තිබුනේ නත්තල් දිනය එනම් 25 වන දිනය සම්බන්ධයෙන් තමන්ට ආවේණික අර්ථ කථන ගෙන එමින් නත්තලේ අධ්‍යාත්මික පණිවුඩය වෙනතකට ගෙන යෑමේ කූප්‍රකට ප්‍රයත්නයට මුක්කු ගැසීමටයි. තවත් සමහරුන් උත්සහගෙන තිබුනේ කතෝලික සභාවට කතිකාවක් ගෙන ඒමේ සැමදා පවත්වන ඒක පුද්ගල සංදර්ශනයේ තවත් පිටපතක් එළිදැක්වීමටයි.

බාහිර දර්ශනය එලෙස දිස්වූවත් මෙවරද තමන්ගේ වර්ධනාත්මක කිතුනු ගුණාංග හා චර්යා ධර්ම තුළ පොදුවේ කතෝලිකයා මෙම උපතේ මංගල්‍යය සමරන්නට අධ්‍යාත්මිකව ගෙන තිබූ උත්සහය සහ කැපවීම ප්‍රශංසනීයයි. වෙන්කළ සති 4 ක් තුළ සූදානම් වෙමින් මුළු ආගමන සමය පුරාම තමන්ගේ පැවැත්ම පිළිබඳව මෙවර වැඩි වර්ධනයකින් කතෝලිකයා සූදානම් වීමට ගත් උත්සහය ගැන සතුටින්ම කථා කළ හැකියි. බහුතරයක් කතෝලිකයින් වෙසෙන ප්‍රදේශ වලත්, සුළුතරයක් වෙසෙන ප්‍රදේශවලත් ආගමික සමයේ සූදානම විවිධ පශ්චත්තාපී ක්‍රියා මගින් හා ධ්‍යානගත යැදුම් මෙහෙයන් තුළින්ම ගැඹුරු අධ්‍යාත්මික පිබිදීමක් හරහා ගෙන යාමට ගත් ප්‍රයත්නය පොදුවේ බාල, තරුණ, වැඩිහිටි පිරිස් අතර විහිදී පැවතීමත් වර්ධනයේ ලක්‍ෂණයක්මයි. මේ ඇගැයීම කළ යුත්තක් බවට අප විශ්වාස කරන්නේ එබැවිනි. පාසල් නිවාඩුවට පෙර කතෝලික පාසල් පද්ධතිය හරහා විවිධ ක්‍රියාකාරකම් තුළින් පාසල් දරුවන්ව අධ්‍යාත්මිකව සූදානම් කළ ආකාරය සැබවින්ම අනර්ඝයි. විවිධ මීසම් මට්ටමින් හා දේවස්ථාන මුල් කොට ගෙන ධර්ම විවේකයන් පවා පවත්වා දියත් කළ ආගමික වැඩසටහන් පසුබිම ගැනත් සඳහනක් කළ යුතුමයි. කිතු දන පුබුදුවේ විවිධ යැදුම් සංඝ හරහා සැදැහැවතුන් අධ්‍යාත්මිකව පෙළ ගස්වා තිබීමත් ඇගැයීමට ලක්විය යුතුයි. සුව දානය යැදුම් මෙහෙයන් මුල් කොට ගෙන ජනතාව පෙළ ගස්වා කළ සූදානම් පිළිබඳවත් මතක් කළ යුතුයි.

මේ සියල්ල තුළ වසරින් වසර කතෝලික සැදැහැවතා නත්තල් මංගල්‍යය වර්ධනයේ අධ්‍යාත්මික මංගල්ලයක් බවට පත්කරන්නට කරන කැපකිරීම පිළිබඳව ඇගැයීමක් තවමත් නොවන්නේ විවිධ කුහකකම් නිසා විය හැකියි. සැමදාම එකම තැටිය වාදනය කරමින් කන බොන නත්තලක් පිළිබඳව ආඩපාලි කියන්නේ ඒ නිසා විය යුතුයි. පොදු සමාජයේ මේ අධ්‍යාත්මය ගැන නොදත් සමහරුන් ඒ පැරණි ලේබලය කර පින්නා ගනු ලැබුවත් වසරින් වසර කතෝලික සැදැහැවතා තම අධ්‍යාත්මික පිබිදීමෙන් දෙවාලන පණිවුඩය නම් ඔවුනට නිහඬ අභියෝගයක්මයි.

මෙවරත් දකුණු පලාතේ කතෝලිකයින් ඉතාම අඩුවෙන් ජීවත් වන ප්‍රදේශයන්හි තානායම් හා හෝටල වල බාල් නටා විනෝද වූයේ කතෝලිකයින් නම් නොවේ. විවිධ සංදර්ශන තුළින් අගනගරයේ තරු පහේ හෝටල වල පෙළහර පෑවේ අධ්‍යාත්මික පරිනත කතෝලිකයින් නම් නොවේ. 24 දා මධ්‍යම රාත්‍රියේ මුහුදු වෙරළවල බාල් නැටුවේ කතෝලික සැදැහැවතුන් නම් නොවේ. මන්ද එදින රාත්‍රිය තුළ බහුතර කතෝලිකයන් සංඛ්‍යාවක් ජීවිත ගත කළේ දේවස්ථාන පරිසරය තුළ අධ්‍යාත්මික නත්තල් පණිවුඩය හා සමගාමීව යාච්ඤා අභ්‍යාස තුළ නිසායි.

එසේනම් සෑම නත්තලකම කතෝලිකයා හට එල්ල වන චෝදනාව අසත්‍යයම මුල් කොට ගන්නක් බව කියා පාන්නට කතෝලිකයා තව තවත් ශක්තිමත් විය යුතුයි. නත්තලේ යම් මිහිරියාවක් දකින්නට කතෝලිකයන් බහුතරයක් වෙසෙන ප්‍රදේශවල හෝටල් සහ කාමර වෙන්කර ගත්තේ කතෝලික නොවන අන්‍යලබ්ධිකයිනුයි. කා බී විනෝදවන්නට හෝ ඔවුන් එලෙස දවස වෙන්කොට ගත්තේ එය පවුලේ මංගල්‍යයක් බව ඔවුන්ද දැන් තේරුම්ගෙන ඇති නිසයි. පවුල් සමග එකට එකතුවන්නට අවස්ථාව ලබාදෙන එකම ආගමික මංගලෝත්සවය නත්තල් මංගල්‍යය බව දැන් රටම තේරුම් ගෙන ඇති බවක් පැහැදිලිව පෙනී යයි.

විශේෂයෙන්ම බටහිරි මුහුදු තීරය තුළ වෙසෙන කතෝලික ජනතාව දැන් දැන් පෙන්වන ආධ්‍යාත්මික ප්‍රබල බව හා ධෛර්යවත් භාවය නත්තල අරබයා පමණක් නොව අන් සෑම අවස්ථාවකත් දැකිය හැකියි. ගව මස් අනුභවයෙන් අද ඔවුන් බොහෝදුරට වැලකී ඇත. මත්පැන් පරිහරනයෙන් ද අද බහුතරයක් දුරස් වී ඇත. සමස්ත පින්තූරයම දැන් දැන් පැහැදිලි සුබවාදී ලකුණු පෙන්වයි.

එමනිසා නත්තල ගැන කතා කරන්නට සෑම වසරකම දමාග න්නා පාට කණ්නාඩි දැන්වත් වෙනස්කොට එහි තිබෙන සැබෑ ආධ්‍යාත්මයත් ඒ ආධ්‍යාත්මය හා බැඳෙන ජනතාවගේ වර්ධනාත්මක විශ්වාසයේ දිවි පැවැත්මත් ගැන කතා කරන්නට වඩා වඩාත් අවස්ථාවන් උදාකරගත යුතුයි. ඒ තත්ත්වයට යන්නට දැන් දැන්ම කතෝලිකයා අදිටන් කරගන්නේ නම් උදාවන 2012 වසරේත් නත්තල ප්‍රබලවම ආධ්‍යාත්මික හැඟීමකින්ම එළිදක්වන්නට යෝධ බලයක් උරුම කරගනු ඇත. උදාවන නව වසරේ මුල් දවසේ පටන් ඒ හැඟීම තිව්‍ර කරන්නට එක්සිත් මාවතක ගමන් කරන්නටයි, මේ ආරාධනා!
ඔබ සැමට සුබ නව වසරක් වේවා!

## ශුද්ධෝත්තම පියතුමාගේ 2012 ලෝක සාම දින පණිවුඩයෙන්



# තරුණ පරපුර යුක්තිය සහ සාමය තුළ දැනුවත් කරමු

**තරුණ පරපුර යුක්තිය හා සාමය තුළ දැනුවත් කරන්නැයි ශුද්ධෝත්තම පියතුමා 2012 ලෝක සාම දින පණිවුඩයෙන් ඉල්ලා සිටී**

නව වසරක් ආරම්භයේ මිනිස් වගට දෙවියන් වහන්සේ තිළිණ කල්නොයවා සියල්ලන් වෙත සුවිශේෂි විශ්වාසයකින් සහ දයාවකින්ද හද පත්ලෙන් නැගෙන සුබ පැතුමින්ද යුතුව පිරිනමන්නේ යුක්තිය හා සාමය සවිමත් වූ සමාජයක් උදෙසාය.

නව වසර සඳහා අපගේ ලීලාව කෙබඳුවේද? ගීතාවලියේ 130 හි චමත්කාර ජනක සිත්තමක් අපට හමුවේ. එහි කතුවරයා පවසන අන්දමට විශ්වාසයේ ජනතාව දෙවියන් වහන්සේගේ පැමිණීම උදෙසා සූදානමින් සිටිති. එළිය වැටෙන තුරු බලා සිටින මුරකරුවන්ට වඩා මම සමිඳුන් එනතුරු බලාසිටිමි (ගීතා 130:6) ඔවුන් උන්වහන්සේ එනතුරු ස්ථිර බලාපොරොත්තුවෙන් රැඳී සිටිනුයේ උන්වහන්සේ ආලෝකය. කමාව, ගැලවීම රැගෙන එන නිසාවෙනි. තෝරාගත් ජනතාවගේ අත්දැකීම් මත මේ රැඳී සිටීම පවතින අතර දෙවියන් වහන්සේ ඔවුන්ට උගන්වා වදාල පරිදි ලෝකයේ පවත්නා සත්‍යතාවන් මිස පීඩාවන් නිසා විනාශ කර නොදමන බව ඔවුහු වටහා ගත්හ. 2012 වසර දෙස මේ තත්ත්වය මත පිහිටා විශ්වාසයේ සත්‍යතාවයෙන් බලන ලෙස මම ඔබට ආරාධනා කරමි. ගෙවී යන වසර සමාජයේ විවිධ අර්බුදයන් නිසා හංගත්වයේ දැක්මකින් සලකුණු වූ බැව් සත්‍යයකි. වැඩකරන ජනතාවගේ හා ආර්ථික ලෝකයේ අර්බුදයන්හි අංකුරයන් මූලිකව සංස්කෘතික හා මානව වංශය තුළ පවතී. අපගේ කාලයේදී ඒ ඔස්සේ සෙවනැල්ලක් මානව වංශය තුළ පවතී. අපගේ කාලයේදී ඒ ඔස්සේ සෙවනැල්ලක් වැටෙන්නේ නම් දිනයේ ආලෝකයෙන් පැහැදිලිව අප ආරක්‍ෂා වනු දැකිය හැකිය.

කෙසේවෙතත් මේ සෙවනැල්ල තෙහිලි ගී කරු පවසන අරුණැල්ල එළැඹෙන තුරු මානව හදවත් නිරතුරු බලා හිඳී. මන්දයත් මේ බලාපොරොත්තුව විශේෂයෙන් තරුණ පරපුරට බලවත් සාක්ෂියක් වන නිසා මගේ සිතිවිලි ඔවුන් වෙත යොමුකරමින් සමාජයට ඔවුන්ගේ දායකත්වය කුමක් විය යුතුදැයි විමසා බලමු. එහෙයින් XLV ලෝක සාම දිනය සඳහා වූ මේ පණිවුඩය අධ්‍යාපනය වෙනුවෙන් වූ තේමාවකට කැපකරන්නට මම කැමැත්තෙමි. 'තරුණ පරපුර යුක්තිය සහ සාමය තුළ දැනුවත් කරන්න' යන්නෙන් තරුණ පරපුරේ උද්යෝග යෙන් සහ විඥානවාදයෙන් ලෝකයට නව බලාපොරොත්තුවක් පිරිනැමීමට හැකිය.

මගේ පණිවුඩය දෙමාපියන්ට, පවුල්වලට සහ අධ්‍යාපන ක්ෂෙත්‍රයේ සහ හැඩගැන්වීමේ විවිධ අංශයන්ට සම්බන්ධ සෑම සියලු දෙනා වෙත මෙන්ම ආගමික, සමාජික, දේශපාලනික සහ සංස්කෘතික විවිධ අංශයන්ට සහ මාධ්‍යයට කතා කරයි. තරුණ පරපුර හා ඔවුන්ගේ අභිප්‍රායයන් නොතකා හරින සමයක ඔවුනට සවන්දීමේ, ඔවුන් ඇග යීමේ හැකියාව මගින් සමස්ත සමාජය නියෝජනය කරමින් අනාගතයේ යුක්තිය හා සාමය ගොඩනැගීමට දායක විය යුතුය.

තරුණ පරපුරට ඇමතීමේදී එක් ගැටළුවක් වන්නේ ජීවිතය පිළිබඳ ධනාත්මක සිතිවිලි සඳහා ඇගයීමත්, යහපතේ සේවාවන් තුළ ඔවුන්ගේ ජීවිත ගත කිරිම උදෙසා ඔවුන් අගය කිරීමත්ය. මෙය අප සෑම කෙනකුම පෞද්ගලිකව නියැලිය යුතු අභියෝගාත්මක වගකීමකි.

ඉකුත් කාලයේ ලෝකය පුරා තරුණ පරපුර සිය අනාගතය පිළිබඳ ස්ථාවර බලාපොරොත්තුවක් උදෙසා විවිධ උද්ඝෝෂණයන්හි නියැළුනු අන්දම සැලකිල්ලට ගත යුතුය. වර්තමානයේ ඔවුහු භය හා සැක සිතෙන අත්දැකීම් සමුදායක් ලබමින් සිටිති. ඔවුනට සැබෑ ලෝකයේ යථාර්ථය සමඟ කටයුතු කිරීම සඳහා විධිමත් අධ්‍යාපනයක් අවශ්‍ය වී තිබේ. ඔවුන් අත්දකින ලෝකය තුළ පවුලක් ගොඩනැගීමේ සහ ස්ථිර රැකියාවක් සොයා ගැනීමේ අසීරුතා පවතී. ඔවුනට දේශපාලනික, සංස්කෘතික සහ ආර්ථික ජීවිත ඔස්සේ වඩාත් මානවවාදී හා සහෝදරාත්මක මුහුණු වරක් ගත් සමාජයක් ගොඩනැගීමට හැකිවේ නම් එය විමතියට කරුණක් වනු ඇත. මේ අපහසු එහෙත් වැදගත් සංකල්පය සමාජයේ සෑම කොටසකගේම දැඩි සැලකිල්ලට ලක්වීම ඉතා වැදගත් කාරණයකි. සභාව තරුණ පරපුර කෙරේ අවධානය යොමු කරන්නේ බලාපොරොත්තුවෙන් හා විශ්වාසයෙනි. සභා මාතාව ඔවුනට සත්‍ය සෙවීමට, පොදු යහපත රැක ගැනීමට, තමන් වටා ඇති ලෝකයට අනාවරණය වෙමින් නව දේවල් දැකීමේ අදිටනට නිරන්තරයෙන් දිරිගන්වන්නීය.

15 පිටුවට »

කැම්ලස්ගේ —— තිත්ත ඇත්ත



මීසමෙන් මීසමට

## බුලත්කොහුපිටිය 75 ජයන්තියට සැරසේ

1938 වසරේ දී බුලත්කොහුපිටිය සා. සෙබස්තියන් දෙව්මැඳුර ඉදිකෙරිණි. යටියන්තොට මීසමට අයත්ව තිබූ මේ දෙව්මැඳුර පසුව නව මීසමක් විය.

2012 වසරේ 75 ජයන්තිය සැමරීමට සූදානම් වන බුලත්කොහුපිටිය දේවස්ථානය අළුතින් ඉදිකිරීමට රත්නපුර රදගුරු අති උතුම් ක්ලීටස් චන්ද්‍රසිරි පෙරේරා හිමිපාණන් අතින් මුල්ගල තබන ලදී.

දැනට පවුල් 150 ක් පමණ මීසමට අයත් වන අතර උදුගොඩ සා. අන්තෝනි දේවස්ථානය ද බුලත්කොහුපිටිය මීසමට අයත්ව තිබේ. මෙහි සියලු කටයුතු මීසම් සේවක ගරු සතිෂ් සවරිමුත්තු පියතුමාගේ මෙහෙයවීමෙන් සිදුකැරේ.

ට්‍රීෂා රෝෂිණී

## උඳුවප් මිහිර ප්‍රසංගය මෙවරත් බඩල්ගමදී

බඩල්ගම මීසම් සේවක ගරු ඇන්ටන් රංජිත් පියතුමාගේ අගනා සංකල්පයක් වූ උඳුවප් මිහිර නත්තල් ප්‍රසංගය පස්වන වරටත් ඉතාමත් උත්කර්ෂවත් අන්දමින් බඩල්ගම දේවස්ථාන භූමියේ දී පැවැත්විණි.

එහිදී බඩල්ගම මීසමට අයත් වරාදල්, මැල්ලව ගෙදර, ගොඩිග මුව, මේස්ලන්ඩ්, කෙහෙල්ඇල්ල, බඩල්ගම යන සභා හයේ කිතුනු ජනතාවගේ එකමුතු කමින් ගවලෙන් තරග, කැරොල් ගායනා තරග, නත්තල් කාඩ්පත් තරග පවත්වමින් විවිධ ප්‍රසංගය ඉතාමත් සාර්ථක අන්දමින් පවත්වන ලදී.

විවිධ ප්‍රසංගයේ දී දහම් පාසල් දරුවන්, තරුණ තරුණියන්, වැඩිහිටියන් විසින් ජනතාව ප්‍රබෝධමත් කරන ලදී.

කේ. එම්. අබේසේකර



රත්නපුර පදවි ගිහි අපෝස්තලික සේවාව 15 වන වරටත් ඇහැලියගොඩ රජයේ රෝහලේ නේවාසික රෝගින් වෙනුවෙන් නත්තල් භක්ති ගීත ගායනයක් හා ත්‍යාග ප්‍රදානයක් සිදු කළේය. මෙම අවස්ථාවට රත්නපුර රදගුරු අති උතුම් ක්ලීටස් චන්ද්‍රසිරි පෙරේරා සා.බෙ.නි හිමිපාණන් ද එක්විය. ගිහි අපෝස්තලික සේවාවේ බ්‍රිජට් පෙරේරා මහත්මිය ඇතුළු කණ්ඩායම් ද හෙදියන් හා රෝගීන්ද ඡායා රූපයෙන් දිස්වේ.

තියබෝල්ඩ් සමරතුංග

### මොණරාගල දිසා කිතුනු ළමා රැළිය

## පරිසරය සුරකින්නා දෙවිඳුන් හඳුනයි



බදුල්ල පදවියේ මොණරාගල දිසාවට අයත් ලත්පඳුර මහියංග නය, බිබිල, මොණරාගල, වැලල්වාය, බුත්තල යන මීසම් පියතුමන් පැවිදි සොයුරියන්, දහම් ගුරුවර ගුරුවරියන් හා දූ පුතුන් එක්ව මොණරාගල මීසමේ පැවැත්වූ ළමා රැළියේ තේමාව වූයේ 'පරිසරය සුරකින්නා දෙවිඳුන් හඳුනයි' යන්නය.

එදින ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස බදුල්ල රදගුරු අති උතුම් වින්ස්ටන් ප්‍රනාන්දු දි.ස.නි. හිමි සහභාගි විය. දිව්‍ය පූජාවේ දී රදගුරු හිමි මෙසේ පැවසීය. මෙලොව අගනාම මැවිල්ල දෙවියන් වහන්සේගේ ස්වරූපයට මැවූ මිනිසා වන හෙයින්, එහි භාරකරු වන්නේ ද ඔහුමය. එබැවින් මැවිල්ල ජරාපත් හෝ විනාශ වන්නට ඉඩනොදී අනාගත පරපුරට දායාද කරන්නට ආරක්ෂා කිරීම අප සතු කිතුනු වගකීමකි.

දිව්‍ය පූජාවෙන් අනතුරුව තේමාවට අදාල බැනර් හා පෝස්ටර් රැගෙන පා ගමනින් මොණරාගල සා. අන්තෝනි කාර්මික විද්‍යාලය දක්වා පැමිණ එහිදී සොබා දහමත් දේව වචනයත් අතර ඇති වැදගත්කම මැයෙන් ගරු මොඩස්ටස් ප්‍රනාන්දු පියතුමාගේ ඉතා කාලෝචිත දේශනයට සවන් දුනි. සොබා දහම රැකීමේ වගකීම ඉටුකරන බවට දරුවන් ප්‍රතිඥා දීමෙන් පසුව සැම මීසමකම සහභාගිත්වයෙන් පැවැත් වූ සංස්කෘතික වැඩ සටහනකින් දවසේ වැඩකටයුතු නිමාවිය.

එස්. පී. නිමල්කා

# නත්තලයි ගවහලයි සාමයේ පදනමයි

**ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ, මුද්දර කාර්යාංශය විසින් ක්‍රිස්තියානි ආගමික කටයතු දෙපාර්තමේන්තුව සහ අනුරාධපුර කතෝලික රදගුරු පදවිය ද සාම්ප්‍රදායික ක්‍රිස්තියානි සභාවන් හා ඒකාබද්ධව 2011 නත්තල සැමරීම සඳහා නිකුත් කළ නත්තල් තැපැල් මුද්දර යුගලය, මුල් දින කවරය, සිහිවටන පත්‍රිකාව ප්‍රථම දින නිකුත් කිරීමේ උත්සවය පසුගියදා අනුරාධපුර රදගුරු අති උතුම් දේවධර්මාචාර්ය නෝබට් අන්ද්‍රාදි හිමිපාණන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් අනුරාධපුර ශාන්ත ජෝශප් ආසන දෙව්මැඳුරේදී පැවැත්විණි. මේ වසරේ නත්තල් මුද්දරය සඳහා තේමාව වූයේ "නත්තලයි - ගවහලයි - සාමයේ පදනමයි" යන්නයි.**



මේ සඳහා පාසල් සිසුන් අතර පැවැති තරගයේ දී පළමු ස්ථානය දිනාගනු ලැබුවේ පානදුර මීසමේ, මරදාන සා. ජෝශප් විද්‍යාලයේ උසස් පෙළ වාණිජ අංශයේ ලසිත් ක්‍රිස්මල් රුබේරු සිසුවා විසිනි. නත්තල් මුද්දරයට සමගාමීව වසරේ හොඳම නත්තල් සුබ පැතුම් පත නිර්මාණය කිරීමේ තරගයක් ද සංවිධානය කර තිබුණ අතර එහි පළමු ස්ථානය ගල්කිස්ස බෞද්ධ බාලිකා විද්‍යාලයයේ එම්. සුරක්ෂණි ජීවන්තිකා ප්‍රනාන්දු සිසුවිය විසින් දිනා ගන්නා ලදී. ඇය මොරටුව කඩලාන මීසමේ දියණියකි.

මේ මුද්දර සහ සුබ පැතුම්පත් පළමුව අනුරාධපුර රදගුරු අති උතුම් නෝබට් අන්ද්‍රාදි නි.ම.නි හිමිපාණන්ට පිළිගන්වනු ලැබුවේ තැපැල්පති එම්. බී. දිසානායක මහතා විසිනි.

මෙම කටයුත්ත සම්බන්ධීකරනය කරන ලද්දේ ක්‍රිස්තියානිආගමිකකටයුතුදෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ආර්. ඒ. ගුණවර්ධන මහතා විසිනි. අනුරාධපුර රදගුරු පදවිය වෙනුවෙන් මෙම උත්සවය සංවිධානය කරන ලද්දේ අනුරාධපුර රදගුරු පදවි ධර්මෝපදේශ සහ බයිබල් සේවා අධ්‍යක්ෂ ගරු එරික් ප්‍රනාන්දු පියතුමන් විසිනි.

ගරු ඩේමියන් පෙරේරා පියතුමා

# දිරිය මාතාවන්ගේ දූ දරුවන්ට දළුගම දී නත්තල් උලෙළක්



ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරයේ දළුගම කාන්තා අංශය සිය දිරිය මාතා කණ්ඩායමේ දරුවන් ඇතුළු මීසමේ ළමුන් සඳහා වාර්ෂිකව පවත්වන නත්තල් ප්‍රසංගය පසුගියදා දළුගම සා. ප්‍රැන්සිස් සාලෙස් දේවස්ථාන පරිශ්‍රයේදී මීසම් සේවක ගරු ජූඩ් ශ්‍යාමන් පියතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

දිරියමාතා ප්‍රතිලාභීන්ගේ දරුවන් වෙත ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම හා පාසල් පොත් බෙදාදීම ද මේ අවස්ථාවේදී සිදුවිය. මෙවර මේ අවස්ථාව සඳහා විශේෂ ආරාධිතයා වශයෙන් දළුගම, කොහල්විල, ගංගාරාමාධිපති පූජ්‍ය ශාස්ත්‍රපති හොරවල ධර්මාරාම නාහිමිපාණන් වහන්සේ වැඩම කළහ. ගමයි පන්සලයි, පල්ලියයි එකමුතුවීම ගැන සතුටුවන බව පැවසූ පූජ්‍ය ධර්මාරාම ස්වාමීන්ද්‍රයන් වහන්සේ මෙම දේවස්ථානයේ විවිධ අවස්ථාවලට සතුටින් සහභාගිවී ඇති බවද සිහිපත් කළහ. සෙසු ආරාධිතයන් අතර ක්‍රි.ක.ව හිටපු ජාතික සභාපති හා වත්මන් ජාත්‍යන්තර සම්බන්ධීකාරක ඇන්ටනී මංචනායක මහතා ද විය. පිළිගැනීමේ කථාව කාන්තා අංශයේ සභාපතිනි ස්වර්ණා ආර්. පෙරේරා මහත්මිය පැවැත්වූ අතර වැඩසටහන මෙහෙයවන ලද්දේ ක්‍රි.ක.ව්‍යා යේ ජාතික විධායක මණ්ඩලයේ කොන්සි වර්ණකුල මහත්මිය විසිනි. දිරිය මාතා ප්‍රතිලාභී කිතුනු/බොදුනු පවුල් ගණනාවක් මීට සහභාගී වූහ.

ඇල්ප්‍රඩ් පෙරේරා

# වයික්කාල සා. බෙනඩික් දෙව් මැඳුර

පුදබිමක අසිරිය



හලාවත පදවියේ වයික්කාල මංසංධියේ පිහිටි සා. බෙනඩික් දෙව් මැඳුර දිගු ඉතිහාසයකට නෑකම් කියයි. 1905 දී ගරු ඇල්බරේ (නි.ම.නි) පියතුමා පැරණි ලැගුම් ගෘහය හා දිව්‍ය පූජා සිදුකිරීම සඳහා අල්තාරය හා පූජා පීඨකය ඉදිරිපිට බිත්ති රහිත මණ්ඩපයක් ගොඩනැගීම ආරම්භ කළේය. ගරු වී. ඩී. ජෝශප් පියතුමා නව දෙව් මැඳුර තැනීම සඳහා අත්තිවාරම් කපා 1913 දි කොළඹ අගරදගුරු අති උතුම් අන්තෝනි කුදේර් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් මුල්ගල තැබීමේ උත්සවය පවත්වා ඇත.

1931 දී කොළඹ අගරදගුරු අති උතුම් පීටර් මාක් හිමිපාණන් නව දෙව් මැඳුර ආසිරි ගැන්වීය. කොළඹ පදවියට අයත්ව තිබූ වයික්කාල අළුතින් නම් කළ හලාවත පදවියට අයත් වූ අතර පදවි එඬේරාණන් වූයේ අති උතුම් එඩ්මන්ඩ් පීරිස් නි.ම.නි හිමිපාණන්ය.

ගරු ආතර් මාටින් ප්‍රනාන්දු පියතුමා මීසම් සේවක ලෙස පැමිණීම වයික්කාල සා. බෙනඩික් දෙව් මැඳුරට භාග්‍යවත් කාලයක් විය. දෙව් මැඳුරේ ඇතුලත පිටත කපරාරු කර සියලු අඩුපාඩු සම්පූර්ණ කර පදවියේ ඇති අලංකාර දෙව්මැඳුරු වලින් එකක් බවට පත් කළේය. 1944 පෙබරවාරි 10 මීසම් ආරක්ෂක රාජේස්වරියගේ ප්‍රතිමාව හලාවත පදවි විකරි ජෙනරාල් ගරු මොන්සිංඤෝර් හියුගෝ ප්‍රනාන්දු පියතුමා විසින් ආසිරි ගන්වා ඇත.

1948 අගෝස්තු 21 දින හලාවත රදගුරු අති උතුම් එඩ්මන් පීරිස් (නි.ම.නි) හිමිපාණන් විසින් මේ දෙව් මැඳුර හා අල්තාරය අභිෂේක කරනු ලැබ එදින දෙව් මැඳුරේ රජත ජයන්තිය ද උත්සවාකාරයෙන් සිදුකර ඇත.

1974 සැප්තැම්බර් 01 දින ස්වර්ණ ජයන්තිය හලාවත රදගරු අති උතුම් ප්‍රැන්ක් මාකස් හිමිපාණන් විසින් සිදුකරන ලදී. 1999 අගෝස්තු 03 දා දෙව් මැඳුරේ දියමන්ති ජයන්තිය හලාවත රදගුරු අති උතුම් ප්‍රැන්ක් මාකස් හිමිපාණන් විසින් පවත්වන ලදී.

2001 දී ගරු ප්‍රැන්සිස් පුල්ලේ පියතුමා මීසමෙන් සමුගත් අතර ගරු මොරිස් ඇන්ඩර්සන් පියතුමා නව මීසම් සේවක වශයෙන් පත්විය. මේ වන විට ලැගුම් ගෘහය වසර 100 ඉක්මවා තිබූ අතර, වසර තුනක සේවා කාලයකින් පසු පියතුමා සමුගන්නා විට දර්ශනීය ලැගුම් ගෘහයක් ලබා දීමට ක්‍රියා කළේය.

මේ දෙව් මැඳුර හා සම්බන්ධ කිතුනු පවුල් සංඛ්‍යාව 25 ට කටත් අඩුය. මරිය හමුදාව, කිතු දන පුබුදුව, දහම් පාසල, ගායනා කණ්ඩායම, වින්සන් ද පාවුලා, අසිපා, පූජා උදව් සමිති ඇතුළු සමිති සමාගම් රැසක් දැනට ක්‍රියාත්මක වේ. මීසම් සේවක ගරු ලක්සිරි ප්‍රනාන්දු පියතුමාගේ මෙහෙයවීමෙන් මාස ගණනාවක දී සියළු ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර වාර්ෂික මංගල්‍යය උත්සවාකාරයෙන් පැවැත්විය.

එච්. ඒ. සිරිල් පෙරේරා

## දියලගොඩ නත්තල් ප්‍රසංගයෙන්



නත්තල නිමිතිකොට දියලගොඩ සා. සෙබස්තියන් මුනිඳුන්ගේ දෙව්මැදුරේ නත්තල් කැරොල් ප්‍රසංගයක් පවත්වන ලදි. දහම් පාසල් දරු දැරියන් විසින් ඉදිරිපත් කර තිබූ කැරොල් ගීත සමඟින් නාට්‍ය, ගැයුම්, වැයුම්, නැටුම් ආදියෙන් මෙය ඔප ගැන්වූ අතර දහම් පාසල් දරු දැරියන් සඳහා වාර්ෂික ත්‍යාග ප්‍රදානය ද මෙදින සිදුකරන ලදි. මීසම් සේවක ගරු තුසිත් ප්‍රදීප් ප්‍රනාන්දු පියතුමන්ගේ සංකල්පයක් අනුව දියලගොඩ කිතුනු පියවරුන්ගේ සංගමය. තරුණ සංගමය, දහම් පාසල් දරු දැරියන් හා ගුරුවර ගුරුවරියන්ගේ සහයෝගයෙන් මෙම උලෙළ සංවිධානය කරන ලදි.

ඩී. ඇන්සලම් ප්‍රනාන්දු



# සභා පියවරු

19 කොටස

**මහාචාර්ය ඇන්ටන් මීමන විසිනි**

## අන්තියෝකියේ ඉග්නාසියස් තුමා

**2011. 12. 04. ලිපිය හා සබැඳේ....**

ස්වාමින් වහන්සේ විසින් ආලේපය ඔහු හිසට වැගිර වීමට සැලැස් වූ හේතුව වූයේ නොපිරිහිනු දෙයෙහි සුවඳ මත ඔහුව සභාව වෙත ගෙන එනු සඳහාය. මේ ලෝකයේ කුමාරයාගේ ඉගැන්වීමේ අප්‍රසන්න සුවඳින් ආලේපනය කරගනු නොලබන්න. එසේ නැත්නම් ඔහු නුඹලාගේ ඉදිරි ජීවිතය සොරකම් කිරීමට ඉඩ ඇත. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ නම් වූ දෙවියන් වහන්සේගේ දැනුම පිළිගෙන අපි අපගේ සිහි බුද්ධියට නොපැමිණෙන්නේ මන්ද? ස්වාමින් වහන්සේ සත්‍ය වශයෙන් අපට එවන ලද ත්‍යාගය නොසලකා හැර අනුවණ ලෙස අප විනාශ වී යන්නේ මන්ද?

විශ්වාස නොකරන්නන්ට අවහිරයක් වූ, නමුත් අපට ගැළවීම සහ අනන්ත ජීවිතය වූ ශ්‍රී කුරුසිය උදෙසා මම මගේ එතරම් නොවටිනා ජීවිතය දානය කරමි. "ප්‍රඥාවන්තයා කොයිද? ... මේ යුගයේ වාද කරන්නා කොයි ද?" ( 1 කොරින්ති 1:20) තමන් බුද්ධිමත් යයි සිතන්නන්ගේ පාරට්ටුව කොහේ ද?

අපගේ දෙවියන් වහන්සේ වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මරියාවන් විසින් පිළිසිඳගෙන දෙවියන් වහන්සේගේ සැලැස්ම තුළ දාවිත්ගේ වංශයෙන් ද, ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් ද ජනිත වූ සේක. එතුමා ඉපිද බව්තිස්ම ස්නාපනය ලබන ලදී. එවිට උන්වහන්සේගේ දුක් විඳීම මඟින් ජලය ශුද්ධවූ දෙයක් බවට උන්වහන්සේ පත් කරන සේක. අප ස්වාමින් වහන්සේගේ මරණය මෙන් ම, මරියාවන්ගේ කන්‍යාභාවය සහ ඇයගේ උපත දීම මේ ලෝකයේ කුමාරයාගේ (සාතන්) අවධානයෙන් ගිලිහී තිබුණේ ය. මෙම අභිරහස් තුන ප්‍රකාශ වීමට මොරගා හඬයි. නමුත් දෙවියන් වහන්සේගේ නිහඬතාවය තුළ ඒවා සඟවා තබන ලදී.

එසේ නම් විවිධ යුගයන් සඳහා ඒවා අනාවරණය වූයේ කෙසේ ද? සියලුම තාරකාවන්ට වඩා දීප්තිමත් වූ තාරකාවක් අහසෙහි බැබලුණේය. එහි ආලෝකය විස්තර කළ නොහැකිය. එහි අපූර්වත්වය විශ්මය ඇති කරවයි. අනෙකුත් තාරකාවන් සූර්යයා සහ සඳු සමඟ එම තාරකාව වටා වළල්ලක් සාදා ගත්හ. එහෙත් එය අනිකුත් තාරකාවන් අභිබවා දීප්තිමත්ව බැබළුණි. එමෙන්ම මෙම අද්විතීය අපූරු සිද්ධිය උදා වූ කල, එහි වික්ෂිප්ත බවක් ද ඇති විය.

මෙහි ප්‍රතිඵලයක් ලෙස සියලුම විජ්ජාවන් සහ මායාවන්වල බලය ශූන්‍ය වූ අතර සියලුම යකුන් බැලීමේ බලයන් නතර විය. අවිද්‍යාව පහව ගියේය. (යක්ෂයාගේ) පෞරාණික රාජධානිය සම්පූර්ණයෙන්ම විනාශ කරන ලදී. ඊට හේතුව වූයේ, සදාකාලික ජීවිතයේ නැවුම් බව ගෙන ඒම සඳහා දෙවියන් වහන්සේ තමන්ව මිනිසකු ලෙස අනාවරණය කරමින් සිටි නිසයි. දෙවියන් වහන්සේ සූදානම් කළ දේ දැන් ආරම්භ වෙමින් පවතී. මරණයේ විනාශය පාලනය කර ගනිමින් සිටි නිසා සියලුම දේවල් ව්‍යාකූල වී ඇත.

නුඹලාගේ යාච්ඤා වලට පිළිතුරක් ලෙස, ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මට අවසර දෙනවා නම් සහ එය උන්වහන්සේගේ අභිප්‍රාය නම්, මා ලිවීමට බලාපොරොත්තු වන දෙවන හසුනෙන් දෙවියන් වහන්සේගේ සැලසුම් ගැන වැඩි විස්තර නුඹලාට පැහැදිලි කරන්නෙමි. මා මෙම සැලැස්ම පිළිබඳව සළකා බලා ඇත්තේ නව මිනිසා වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සම්බන්ධයෙන් පමණි. එසේම උන්වහන්සේව ඇදහීමේ සහ උන්වහන්සේට ප්‍රේම කිරීම හා සම්බන්ධ වන්නේ කෙසේ ද යන්න සහ උන්වහන්සේගේ දුක් විඳීම සහ උත්ථානය එයට අයිති වන්නේ කෙසේ ද යන්නයි.

නුඹලා සියලු දෙනා සහ එකිනෙකා, මාංශික ලෙස දාවිත්ගේ වංශයෙන් පැවත ගෙන එන සහ මනුෂ්‍ය පුත්‍රයාණන් සහ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වන ක්‍රිස්තුන් වහන්සේ සමඟ එකම විශ්වාසයෙන් හා එක්සත්ව අප පක්ෂපාතීත්වය දක්වන නාමයේ (ක්‍රිස්තියානි) වරප්‍රසාදයේ ආනුභාවය යටතේ එකමුතුවනවා නම් මම එය විශේෂාකාරයෙන් කරමි.

මෙම හමුවීම් වලදී නුඹලා රදගුරුතුමාට සහ වැඩිහිටියනට සාවධානව ඇහුම්කන් දිය යුතුයි. එසේම සදාකාලිකත්වයේ ඖෂධය සහ මරණය වළක්වන විෂනාශකයක් වන එහෙත් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සමඟ එක්සත්ව නිම නොවන ජීවිතයක් ලබා දෙන එකම පූපය කැඩිය යුතුයි.

**ලබන සතියට ...**

# පරිශුද්ධ දේවමාතාවන්ගේ මාතෘත්වයේ මංගල්‍යය

ජනවාරි මස පළමු වන දින වන අද විශ්ව සභා මාතාවගේ අති උත්සවශ්‍රීයෙන් මරියෝත්තමාවන්ගේ මාතෘත්වයේ මංගල්‍යය සමරන්නීය. ඉපැරණි රෝම දින දර්ශනයට අනුව "ඔක්ටෙව්" දිනය හෙවත් **Holy day obligation** ලෙස පැවතුණු මෙම දිනය පසුකාලීනව කිතු දහම ව්‍යාප්ත වීමෙන් පසුව මුල් සියවස්වල සිටම මෙම මංගල්‍යය සමරනු ලැබුවේය.

මෙම මංගල්‍යය මුලින් ම ස්පාඤ්ඤයෙන් හා ප්‍රංශයෙන් ආරම්භ වී 7 වන සියවසේ දී රෝමානු පිළිවෙත් සංග්‍රහයට එක්විය. එනමුදු 4,5 සියවස්වල සිට ම පෙරදිග සභා පිළිවෙත් වල පැවති මේ මංගල්‍යය සිදුකරනු ලැබුවේ දෙසැම්බර් 26 දා ය. එය ශුද්ධවූ සදා කන්‍යා දේවමාතාවන්ගේ මංගල්‍යය" නමින් පෙරදිග පිළිවෙත්වල සඳහන් වුණි. 13,14 වන සියවස් වලදී මෙකී දේව මාතා මාතෘත්වයේ මංගල්‍යය වෙනුවට "සමිඳාණන් වහන්සේගේ චර්මඡේදන" මංගල්‍යය ලෙස ආදේශනය කරන ලදි. ක්‍රි.ව. 1570 දී v පියුස් පාප්තුමා ත්‍රිදෙන්තීනු පිළිවෙත් සංග්‍රහයට මේ නමින් ම එනම් "සමිඳාණන් වහන්සේගේ චර්මඡේදනය මංගල්‍යය නමින් එක්කළ අතර බෙහෙවින් ම මෙම මංගල්‍යය ප්‍රචලිත වූයේ පෘතුගාලයේ ය. ඒ ඔස්සේ පෙරදිග රටවල ද මෙම මංගල්‍යය ප්‍රචලිත විය. 1931 දී xi වන පියුස් සුදු පියාණෝ ඔක්තෝබර් 11 වන දින දේවමාතාවන්ගේ මාතෘත්වයේ මංගල්‍යය ලෙස සමස්ත සභාවට නිර්දේශ කෙරුණ ද ii වන වතිකාන කතිකාවතෙන් පසු vi වන පාවුලු ශුද්ධෝත්තම පියතුමාණෝ පෙර තිබූ පරිද්දෙන් ම "පරිශුද්ධ දේවමාතා මංගල්‍යය" ලෙස හඳුන්වා දෙමින් ජනවාරි පළමුවන දා සමරන්නට විශ්ව සභාවට ම නියෝග කරන ලදි. එම නිසා ම වත්මන් රෝමානු පිළිවෙත් සංග්‍රහය තුළ මෙම මංගල්‍යය අනිවාර්ය අනුස්මරණ මංගල්‍යයක් ද ලාංකේය කතෝලික අප හට එය ද ණය මංගල්‍යයක් වන්නේ ය.

### ශු. ලියැවිල්ලේ පදනම

දේවමාතාවන් Mother of God හෙවත් ග්‍රීක බසින් "තියෝටෝ - කොස්" යන දේවධාර්මික සත්‍යතාව ක්‍රි.ව. 413 පැවති නිසියානු මන්ත්‍රණ සභාවේ ගාම්භීරව සනාථ කරනු ලැබූ ශු. සභාවේ වේද සත්‍යතාවයකි. බිඳ වැටුණු දෙව් මිනිස් සබැඳියාව යළිදු එක්කරලීමට අභිමතය වූ දෙවිඳාණෝ ස්ත්‍රියගෙන් උපන් ස්වකීය පුත්‍රයාණන් එවූ සේක. (උත්. 3:15). උන්වහන්සේ ශුද්ධාත්මයාණන් කරණ කොටගෙන කන්‍යමරියෝත්තමාවන්ගෙන් මෙලොවට මාංශගත වූ සේක.

අසම්මත වූ ප්‍රබල දේව සැලැස්මට හිස නමා ලෝ මැවුම්කාර "වචන තෙම" (ජොහාන් 1:14) ලොව බිහිකරලන්නට දේව පණිවුඩය අනුව, දේව වචනය හදින් හා කයින් පිළිගෙන, ගැළවුම්කරුවාණන් බිහිකළ මරියෝත්තමාවෝ දෙවිපියාණන්ගේ ආදර දියණිය ද, දේවපුත්‍රයාණන්ගේ ආදර මෑණියන්ද ශුද්ධාත්මයාණන්ගේ වාසස්ථානය ලෙස අන් සියලු මැවිලි අභිබවා යන විපුල ප්‍රසාද ලත් උත්තමියක (ලූක් 1:28) ද පරම ශුද්ධාත්මික ක්‍රිස්තු ශරීරය වන ශු. සභාවේ මෑණියන් ලෙස ද (ජොහාන් 19:27) ඕ තොමෝ දේව ජනතාවගෙන් ගෞරව බුහුමන් ලබන්නීය. මන්ද මරියෝත්තමාවන් තරම් ලෝක වාසීන්ගේ අවධානයට යොමු වූ ලොව වෙන කිසිදු කාන්තාවක් නොමැත. එදා ඕ තොමෝ එළිසබෙත් තුමී හා එක්ව දෙවි සමිඳුන් ගැයූ උදම් ගීයේ ලෙස "හැම පරපුරක්ම මෙතැන් සිට භාග්‍යවන්තී යැයි මට කියනු ඇත..." (ලූක් 1:48). ඕතුමිය ගැලවීමේ සැලැස්මට හිස නමා සමිඳාණන් වහන්සේගේ මාංශගතවීමේ සිට, ඔවුන් වහන්සේගේ උපත ද එතැන් සිට කල්වාරි කඳු මුදුනේ ඔවුන් වහන්සේගේ ශ්‍රී මරණය දක්වා සැබෑ ලෙස සමිඳාණන්ගේ දාසිය වෙමින් ද (ලූක් 1:38). ගැලවීමේ සැලැස්මේ ක්‍රිස්තුන් වහන්සේගේ ආගමනයේ සිට වූ සියලු සිදුවීම් තම සිත් හි නිදන් කොට, ඒවා මෙනෙහි කළ (ලූක් 2:19, 2:51) ඒ උත්තරීතර දේව මාතෘත්වය වචනයෙන් කියා විස්තර කළ නොහැකිය. මෙහි දී සමස්ත සභාවම එදා එළිසබෙත්තුමී ප්‍රකාශ කළ අන්දමින් "මාගේ ස්වාමින් වහන්සේගේ මෑණියන් මා වෙත පැමිණීමට තරම් මම කවරෙක් ද?" (ලූක් 1:43) යන්නෙන් වචනයාණන් වූ මෙසියස්වරයාණන් මෙලොවට ජනිත කළාවූ ද කුරුසිය පාමුල අපට උරුම කළ මේ බලසම්පන්න දේව මාතෘත්වය දේව ජනතාව වන අපගේ බලාපොරොත්තුව හා අභියෝගය ද වන්නේ ය.

### සභා පිය දැක්ම

සභා මූලාරම්භයේ සිට ම මරියෝත්තමාවන් දේවමාතාවන් බව පිළිගැණුනි. තෙයෝටෝකෝස් හෙවත් දෙවියන් දරන්නී යන අරුත මුලින් ම අපට හමුවන්නේ හිපොලිටස් තුමාගේ කාලයේ ය. එතුමාගේ එකී මතය ම අතනේසියස්, බැසිලියස්, නසියාහී ග්‍රෙගරි ආදි සභා පිය ඉගැන්වීම් තුළ ප්‍රබල ලෙස දැක්වේ. ක්‍රි.ව. 431 දී එෆේ හි මන්ත්‍රණ සභාව පැවැත්වූයේ නෙස්ටෝරියස් නමැති රදගුරුතුමා ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වය හා මනුෂ්‍යත්වය පිළිබඳවත් මරියාවන් වන මැවිල්ල දේවමාතාවන් වන්නේ කෙසේදැයි වේද ධාර්මික ගැටළු සහිත ඉගැන්වීම් ඉදිරිපත් කළ නිසාවෙනි. මෙකී වතවාදයට එරෙහිව ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිරිල් තුමා පෙරටුකොට ගත් ශු. සභාව මෙම මතය බිඳ හැර ශු. කන්‍යාවිය වන මරියෝත්තමාවෝ දේවමාතාවන් ලෙස හඳුන්වා ඕතුමියට බැති පෙම් දක්නට නියෝග කරන ලදි. මේ නිසා ම ජනවාරි පළමු වන දා පැවැත්වෙන පරිශුද්ධ දේවමාතා මංගල්‍යයට මුල් කාලයේ සිට ම සවිමත් අත්තිවාරමක් හා පදනමක් දේවධාර්මිකව මෙන්ම සභා සම්ප්‍රදායානුකූලව ලැබුණි.

මෙකී දේවමාතෘත්වය ශු. ඉරනේවුස් මුනිඳුන් නිර්වචනය කරන්නේ, "දෙවිඳුන් වෙතින් ආ දේව හඬට අවනත වෙමින්, එයට හිස නමා මාංශගත වූ දෙවිඳුන් ඔසවා ගත් ප්‍රබල මාතෘත්වය ලෙසය. මුල් යුගයේ දී විසූ සභා පියවරු අතර හිපොලිටස්, මහා ග්‍රෙගරි, ජෙරුසලමේ සිරිල්, මෙතෝදියස්, සිරියාවේ එප්‍රයිම්, ඇලෙක්සැන්ඩ්‍රියාවේ පීටර්.... ආදි අයගේ නිර්වචන සමස්තයට ගත් කළ මෙසේ විග්‍රහ කළ හැකිය.

"යමෙකු මරියෝත්තමාවන් දේවමාතාවන් යැයි පිළිනොගන්නේ නම් ඔහු දේව විශ්වාසයට පිටස්තරයකු බවට පත් වේ. තවද මනුෂ්‍යයකු ලෙස බිහි වී පසුව ඔහු තුළට දෙවියන් වහන්සේ ඇතුළු වූවා යැයි කියා කියන කවර නමකුව හෙළා දැකිය යුතුය.

තවද එෆේසි මන්ත්‍රණ සභාව තුළ මරියෝත්තමාවන් දේවමාතාවන් බව යන සංකල්ප උකහා දක්වන්නට ශු. ජෙරොම් තුමාගේ ලිපි පරිශීලනය කරගත් ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිරිල් තුමාගේ ආයකත්වය සුවිශේෂී වේ.

### ධාර්මික අරුත

එකම මධ්‍යස්ථකයාණන් වන ක්‍රිස්තුන් වහන්සේගේ (තිමති 2:5-6) ගැලවීමේ සැලැස්ම සෘජුවම සම්බන්ධ වෙමින් දේව සැලැස්ම අනුව මෙසියස් වරයාණන් බිහිකරමින් ද ඔවුන් වහන්සේගේ සහකාරිය ද බැහැපත් දාසිය ද ලෙස පූර්ණ ආකාරයෙන් ම ජේසුස් සමිඳුන්ගේ මෑණියන් වූවාය. ආත්මික බන්ධනය තුළ ඕතුමිය අපගේ මෑණියෝ වන්නේ ප්‍රථමයෙන් ඕ තොමෝ ජේසු



සමිඳුන්ගේ මෑණියන් වන නිසාය. (L. G. 60)

★ ගැලවීමේ සැලැස්මට සෘජු ලෙස සම්බන්ධ වෙමින් ඔවුන් වහන්සේගේ දුක්ප්‍රාප්ති ද අප ලද අනගි තිළිණය හා උරුමය මරියෝත්තමාවෝය. (ජොහාන් 19:27) එමගින් පිළිබිඹු වන්නේ විශ්ව මාතෘත්වයයි.

★ ශු. සභාව තුළ ධාර්මික දිවි පෙවතට අපට ගෙන හැර පාන සරල සුගම සළකුණ ද මරිය වහන්සේ ය. ඕතුමිය දේවමාතාවන් වූයේ ස්වකීය බැහැපත් හා සරල දිවිපෙවෙත තුළිණි. එම නිසා ඕ තොමෝ මෙන් රටට, දැයට, ලවණක් ආලෝකයක් වන්නට ද අපගේ ප්‍රසාද ස්නාපනීය කැඳවීමට ප්‍රතිචාර දක්වන්නට මෙහිදී අපට ඇරියුම් කෙරේ.

★ දේවමාතාවන් වන මරියෝත්තමාවෝ වන්දනා ගමනක යෙදී සිටින දේව ජනතාවගේ බලාපොරොත්තුවේ හා සැනසීමේ සළකුණකි. සැබෑ මධ්‍යස්ථකයාණන් වූ ජේසු සමිඳුන් වෙතට අප ගෙන යන දුබල අප වෙනුවෙන් අපගේ අවැසිතා වලදී මැදිහත් වන මරියාවන්ගේ යැදුම්, පිහිට හා සවිය නිරතුරුවම පතා සිටිමු. (L.G. 68, 69)

**(පරිශීලනය - ජාතීන්ගේ ආලෝකය (L.G.) "රෙදෙම්තෝරිස් මාතර්" හෙවත් ගැලවුම්කරුවාණන්ගේ මෑණියෝ යන විශ්ව ලේඛනය)**

**අසේල දසනායක**

# ශු. පවුලේ මංගල්‍යය

2011 දෙසැම්බර් 30 වැනිදාට ශු. පවුලේ මංගල්ලය යෙදී තිබුණි. ශු. පවුල කී සැණින්ම අපට සිහිවනුයේ ජේසු, මරිය, ජුසේ තුමන්ලා ය. ඇත්තෙන්ම මේ තුන්දෙනා වහන්සේලා එදා නාසරතයේ දී සාමාන්‍ය පවුලක් ලෙස ජීවත් විය. නමුත් ඒ පවුල තුළ සාමාන්‍ය බව ඉක්මවා ගිය සුවිශේෂී බවක්, ශුද්ධවූ බවක් පිරිපුන් බවක් විය. ඒ විශේෂත්වය එම පවුලට ලැබුණේ මිල මුදලින්වත්, බාහිර ආටෝපයෙන්වත් සමාජ බලය තුළින්වත් නොව; ජේසු සමිඳුන් නිසාය. දේව රාජ්‍යයේ ගුණාංග වලින් පිරිපුන් ජීවිත පැවැත්ම නිසාය. අද අප ජීවත්වන සමාජය තුළ "පවුල" නමැති සංකල්පය වඩා ඉස්මතු වෙමින් පමණි. අප ජීවත් වන නිවස තුළ, අප වැඩ කරන ආයතන, පැවදි පූජක සංඝවල, රටක් ලෙසත් "පවුලේ හැඟීමෙන්" එකට එකතුවී කටයුතු කිරීමේ අවශ්‍යතාවයක් ඇතිවෙමින් පවතී. එය සහජීවනයට ඉතා අවශ්‍ය සාධකයකි. නමුත් අද අපට ඇති එකම අභියෝගය අද අප ජීවත්වන පවුල ශු. පවුලක් කරගන්නට අපි කොතෙක් උත්සාහ කරනවාද යන්නයි. අද අප අතර ජේසු සමිඳුන්ම එසේ නැතිනම් උන්වහන්සේගේ ධර්මය ජීවත් කරවන්නට අප කොතෙක් සමත් වී ඇත් ද යන්න අපි එකිනෙක්කෙනාම ප්‍රශ්න කරගත යුතු යථාර්ථයකි. එම යථාර්ථයට අවදි වීමට අපි ගිහි, පැවදි, පූජක ද වැඩිහිටි ද ළමා තරුණ ද යන කිසිදු බෙදීමක් අවශ්‍ය නැත. දේවධාර්මික අතින් හෝ සභා සම්ප්‍රදායන් වලින් අප කොතෙක් උගත් වුවත් ශු. පවුලක සාමාජිකයකු වීමට ඒ කිසිදු කාරණයක් වලංගු නොවන බව මට හැඟේ. දේව රාජ්‍යයේ වටිනාකම් වලට අපේ ජීවිතය තුළ හැකි තරම් ඉඩදීම මෙම ශු. පවුලට ඇතුළත් වීමට අපට ඇති එකම මාර්ගය වේ.

එසේම ශු. පවුලේ මංගල්ලය ගැන සිහිපත් කරද්දී ශු. පවුලේ නිකායන් අපට අමතක කරන්නට බැරිය. ලෝකය පුරා විසිරී විශාල රටවල් ප්‍රමාණයක සේවයේ නියුතු ශු. පවුලේ පැවදි සංඝයේ නිර්මාතෘවරයා වූයේ වන්දනීය පීටර් බියෙන්වෙනු නොආයි නමැති පූජකතුමයි. ප්‍රංශ විප්ලව සමයේ මෙලොව ඉපදී කැඩී විසිරී ගිය මිනිස් පවුල නැවත එකමුතු කරන්නට තම ජීවිතය කැප කරන්නට මෙම තරුණ පූජකතුමාට ආනුභාවය ලැබුණේ ශු. පවුලෙනි. එතුමා දෙවිසත්හලේ ඉගෙනුම ලබන කාලයේ දී ශු. පවුල කෙරේ විශේෂ භක්තියක් දැක්වූහ. එය හුදු භක්තියකට පමණක් සීමා නොකර ශු. පවුලේ ගුණ ධර්ම වලින් තම ජීවිතය ආලෝකමත් කරගෙන එම ආලෝකයෙන් විශාල දූත කාර්යකට මූලාරම්භයක් දුනී.

15 පිටුවට

බොල්ලත
**එම්. චතුරංගනී**

# ජේසු සමිඳුන්ගේ ප්‍රේමනීය ජීවිත යාගය



ජේසු සමිඳුන් අපට ප්‍රදානය කරන ලද උතුම්ම නිධානය නම් තම ජීවිතයයි. තම ජීවිතය දේව කැමැත්තට අනුව පූජා කිරීම මඟින් මිනිසාට ගැළවීම ලැබුණි. ගැළවීම යනු දෙවියන් වහන්සේගේ මැවිල්ල ප්‍රකෘතිමත් තත්ත්වයට ගෙන ඒමයි. මිනිසා විසින් පාපයට, විනාශයට ගෙන ගිය දෙවියන් වහන්සේගේ මැවිල්ල නැවතත් ජේසු සමිඳුන්ගේ ප්‍රේමයේ ජීවිත යාගය මඟින් යථා ස්වරූපයට ගෙන එන ලදී.

ජේසු සමිඳුන් දේවත්වය ඉවතලා මනුෂ්‍යත්වය ගැනීම හා එම මනුෂ්‍යත්වය මඟින් මිනිසාට අත්කර දුන් ගැළවීම නිසා දේව සබඳතාවයෙන් දුරස්වූ මනුෂ්‍යයා නැවතත් දේව සබඳතාවයට පත් කරනු ලැබීය. ජේසු සමිඳුන් මුළුමනින්ම දේව කැමැත්තට අවනත විය. ජේසු සමිඳුන්ගේ මාංශගතවීම දේව අභිමතය වූවා සේම එතුමාගේ ජීවිත යාගය ද දේව අභිමතය විය. එය දේව අභිමතය පමණක් නොව මෙලොව මනුෂ්‍යා වෙනුවෙන් ඉදිරිපත් වීමකි. මනුෂ්‍යාව පියාණන් වහන්සේ වෙතට යොමු කරන, ළං කරන, එකම මාර්ගය ජේසු සමිඳුන් ය. ජුවාම් සුවිශේෂක කතුවරයා ප්‍රකාශ කරන පරිදි; "මාර්ගය ද සත්‍යය ද, ජීවනය ද මම වෙමි. මා මඟින් මිස කිසිවකුට පියාණන් වහන්සේ වෙතට යා නොහැකිය."

මිනිසා හා දෙවියන් වහන්සේ අතර මැදහත්කරුවාණන් ලෙස ජේසු සමිඳුන් ක්‍රියා කරමින් සිටින බව අපි දැන් අදහමු. උන්වහන්සේ මඟින් උන්වහන්සේ කෙරෙහි හා උන්වහන්සේ සමඟ මිස අපට දෙවියන් වහන්සේ වෙත නැතහොත් සදාතන ජීවිතය වෙත නැතහොත් ස්වර්ග රාජ්‍ය වෙත ගමන් කළ නොහැකි ය. ජේසු සමිඳුන් තම ප්‍රේමයේ ජීවිත යාගය මඟින් මිනිසාට ගැළවීම ලබා දුන්නා පමණක් නොව එම ගැළවීමේ පණිවුඩය ජීවමාන යථාර්ථයක් කරන්නට ද (අදහාගන්නට ද) ගැළවීමේ සුභාරංචිය සකල ලෝකයාට දේශනා කරන්නට ද සකල ලෝ වැසි කිතුනුවන්ට ආරාධනා කර ඇත.

ජේසු සමිඳුන් අවසාන රාත්‍රී භෝජනයේ (මහ බ්‍රහස්පතින්දා) රොටි සහ මිදිරස තම ශරීරය හා රුධිරය බවට පත්කරවීම මඟින් ද පසුදින (මහ සිකුරාදා) උන්වහන්සේ විසින් පෙරදින සිදු කරන ලද මේ ප්‍රේමයේ ජීවිත යාගය සිදු කරන්නට මිනිසාට ආරාධනා කරන සේක. ජේසු සමිඳුන් අවසන් රාත්‍රි භෝජනයේ දී "මා සිහි කිරීම පිණිස මෙය සිදු කරන්න" යනුවෙන් ප්‍රකාශ කරන්නේ මේ ක්‍රියාවලියයි. එනම් ජේසු සමිඳුන්ගේ ප්‍රේමයේ ජීවිත යාගය ජීවත් කරන්නට ය. නැතහොත් පිළිවෙත සිදු කිරීම එය ක්‍රියාත්මක කිරීම හා එමඟින් මිනිස් ජීවිතයේ අරමුණ / ගැළවීම පූර්ණත්වයට පත් කර ගැනීමයි. නැතහොත් සදාතන ජීවිතය /ස්වර්ග රාජ්‍යය උරුම කර ගැනීමය. පාස්කු අභිරහස සිහිපත් කිරීම නැතහොත් දිව්‍ය පූජාව පරිස්මරණය කිරීමේ පූර්ණ යථාර්ථය මෙය විය යුතුයි. එසේ නොවන්නේ නම් එය ජේසු සමිඳුන්ගේ ප්‍රේමයේ යාගය , පාස්කු අභිරහස, දිව්‍ය පූජාව ජීවමාන කරවීමක් නොවන්නා සේම එයට විශ්වාසවන්ත වීමක් ද නොවන අතර එය තමා විසින්ම තමාවම වංචාකර ගැනීමකි.

ජේසු සමිඳුන්ගේ ජීවිත යාගය දිස්වන්නේ ගැඹුරු දේව දැක්මකි. දිව්‍ය පූජාව තුළ අපි පරිස්මරණය කරනු ලබන්නේ ජේසු සමිඳුන්ගේ ප්‍රේමනීය ජීවිත යාගය වේ. එනම්, දුක් විඳීම, මරණය හා උත්ථානයයි. ජේසු සමිඳුන්ගේ මරණය භෞතික මරණයකට වඩා ආධ්‍යාත්මික මරණයකි. එතුමාණන්ගේ උත්ථානය මඟින් පැහැදිලි කරන්නේ භෞතික මරණය වැදගත් නැති බවයි. මන්දයත් භෞතික මරණය එතුමාණෝ නිෂේධ කළ බැවිනි. මෙලොව මනුෂ්‍යයාට ද භෞතික මරණය ගැන බිය විය යුතු නැත. බිය විය යුත්තේ අධ්‍යාත්මික මරණයට ය. මනුෂ්‍යයාට ගැළවීම උරුම වූයේ ජේසු සමිඳුන්ගේ ආධ්‍යාත්මික මරණය නිසාය. එතුමා ආධ්‍යාත්මිකව මෙලොව අත් විඳි මරණයේ, පූර්ණ යථාර්තය දේව ප්‍රේමය වේ. දේව ප්‍රේමය කිතුනු දිවියේ ජීවය විය යුතුයි. රුධිරය ශරීරයක සෑම අවයවයකටම ප්‍රාණය ගෙන දෙන්නාක් මෙන් කිතුනු ජීවිතයේ සෑම අංශයකටම දේව ප්‍රේමය විකාශනය කළ යුතු වේ.

**ඔස්මන් සුසන්ත විසිනි**

හදවත ශරීරයේ කේන්ද්‍රය වන්නා සේම කිතුනු ජීවිතයේ කේන්ද්‍රය, පරමාදර්ශය, ප්‍රතිමූර්තිය ජේසු සමිඳුන් විය යුතුය. කිතුනු ජීවිතය ජේසු සමිඳුන්ගේ ප්‍රේමණීය ජීවිත යාගයට අනුගත වූවක් විය යුතුය. එය ආධ්‍යාත්මික මරණයකට ජීවිත පරිත්‍යාගයකට සූදානමින් සිටින ප්‍රේමනීය මූලයක් විය යුතුය. එය සීමිත, කොන්දේසි සහිත ප්‍රේමයක් නම් ඒ තුළ ජේසු සමිඳුන්ගේ ප්‍රේමණීය ජීවිත යාගය ප්‍රාණවත් වන්නේ නැත. ජේසු සමිඳුන්ගේ ප්‍රේමණීය ජීවිතයට යාබදව ජීවත් වීමට සාක්ෂිකරුවන් වීමට සෑම කිතුනුවකුම ප්‍රසාද ස්නාපනීය කිතුනු කැඳවීම තුළ පොරොන්දු වී සිටි. කිතුනු ජීවිත පැවැත්ම තුළ අපගේ ප්‍රේමයේ අත්දැකීම් අප විකාශනය කළ යුත්තේ ජේසු සමිඳුන්ගේ ප්‍රේමයේ ජීවිතයට විශ්වාසවන්ත වෙමින් ය.

ජේසු සමිඳුන්ව අපට අත්දැකිය හැක්කේ එතුමාගේ ප්‍රේමනීය ජීවිත යාගය ජීවත් කරන්නේ නම් පමණ එය හුදෙක්ම පුද්ගලයන් තුළ පමණක් නොව සකල මැවිල්ලේ සෑම ක්‍රියාකාරිත්වයක් තුළම අත්දැකිය යුතුය. මැවිල්ල රක්ෂා කිරීම, අගය කිරීම, ප්‍රාණවත් භාවයට යොමු කිරීම යනාදී සෑම සුළු ක්‍රියාවකදීම ජේසු සමිඳුන්ගේ ප්‍රේමය විකාශනය කළ හැකිය. මනුෂ්‍යා තුළ ගැඹුරු ප්‍රේමයක් ඇත්නම් ඔහු විසින් කරනු ලබන සෑම ක්‍රියාවක්ම යහපත් වේ. මේ නිසා ජේසු සමිඳුන්ගේ ප්‍රේමය අත්දැකීම හුදෙක්ම එක් පුද්ගලයකුට දෙදෙනකුට හෝ වෛවාහක යුවළකට හෝ එක් පවුලකට, එක් ජාතියකට, සංස්කෘතියකට එක් සමාජයකට සීමා වූවක් නොව පුළුල් ලෙස විහිදුනු දේව ප්‍රේමයකි. තමාට, තම මිතුරාට, තම සහෝදරයාට, තම පවුලට, දූ දරුවන්ට සේම සකල ලෝකයේ සෑම මනුෂ්‍යයකුටම සකල ලෝකයේ සෑම මැවිල්ලකටම ජේසු සමිඳුන්ගේ ප්‍රේමයේ දැක්ම විකාශනය කළ යුතුයි. දෛනික ජීවිතය තුළ අප ජේසු සමිඳුන්ව අත්දැකිය යුතුය. ජේසු සමිඳුන්ව අත්දැකීම යනු ප්‍රේමයේ මිනුම් දණ්ඩ ක්‍රියාත්මක කිරීමකි. ප්‍රේමයේ මිනුම් දණ්ඩ ක්‍රියාත්මක කිරීම යනු කිතුනුවා අධ්‍යාත්මික ජීවිත යාගයකට පංගුකාරයන් වීමකි. එය ජේසු සමිඳුන්ගේ ආධ්‍යාත්මික ජීවිත යාගයට සාක්ෂි දැරීමක් සේම ජේසු සමිඳුන්ගේ ප්‍රේමනීය ජීවිත යාගය ජීවමාන කිරීමකි.

ජේසු සමිඳුන් මිනිසාට මෙලොව දැක්වූ ප්‍රේමය තවත් අතකින් මිනිසාගේ පාපයන්ට අසීමිත ලෙස සමාව දීමකි. එතුමාණන්ගේ මරණ මංචකය තුළ පවා එතුමා මිනිසාට දැක්වූයේ සමාව දීමේ අසීමිත භාවයයි. දෛනික ජීවිතය තුළ අප ජේසු සමිඳුන්ව අත්කින මොහොත වන්නේ තම සතුරන්ට සමාව දක්වන මොහොතය. තවද වෛර කරන්නන්ට ප්‍රේමය දක්වන, පීඩා කරන්න් උදෙසා යාච්ඤා කරන, සමාජයේ අසරණ වූවන් උදෙසා මැදිහත් වන, රෝගී වූවන්, තනි වූවන් සනසන, ජේසු සමිඳුන්ගේ ආදරය, නොලද්දන්ට එම ආදරය ගැන කියා දෙන, අසාධාරණය, අයුක්තිය වෙනුවෙන් කතා කරන, විශ්වාසයේ, ප්‍රේමයේ හා බලාපොරොත්තුවේ ජීවිතයකට සෑම කෙනෙක්වම එකමුතු කරන සෑම ක්‍රියාවකින්ම අපට ජේසු සමිඳුන්ව අත්දැකිය හැකිය. එය මුළු හදවතින්ම ඇතිවන ආධ්‍යාත්මික පෙරළියක් විය යුතු වේ. පව්කාර ස්ත්‍රිය, සකේවුස්, ශු. පාවුලු තුමා, ශු. අගුස්තීනු තුමා යන පුද්ගලයන් මෙන් ජීවිත පරිවර්තනයක් ඇති කරගැනීමයි. එය මුළුමනින්ම චින්තාවතනයක් ය. (ග්‍රීක් බසින් "මෙටනොයියා" යන අර්ථය) එය අසීමිත ප්‍රේමයක්, අසීමිත ලෙස සමාව දීමක් හා අසීමිත ආධ්‍යාත්මික මරණයක් විය හැකිය. එය වනාහි ජේසු සමිඳුන්ට සාක්ෂි දැරීමයි. ජුසේවාස් පියතුමා, තෙරේසා මව්තුමිය, අසීසියේ ප්‍රැන්සිස් තුමා, ඉග්නාසියස්හි ලොයොලා තුමා, මයිකල් රුද්‍රිගු පියතුමා, දෙවන ජුවාම් පාවුලු පාප්තුමා වැනි අය එම අසීමිත ප්‍රේමය. සමාව දීම හා ආධ්‍යාත්මික මරණය අත්දැක්ක ශ්‍රේෂ්ඨ පුද්ගලයන් ය. නැතහොත් ජේසු සමිඳුන්ව සැබවින්ම තම ජීවිත තුළ අත්දකින ලද ශුද්ධවන්තයින් ය.

අද කිතුනුවන් මෙලොව පවතින ලෞකික දේ වලට ලොල් වී සිටින බැවින් ලෝකෝත්තර ප්‍රේමයක් අත් දැකීමට නොපෙළඹේ. ලෞකික ප්‍රේමය මත නැතහොත් නැතිවී යන වස්තූන් මත අද කිතුනු ජීවිතයේ සැබෑ යතාර්ථය ආවරණය කරගෙන සිටී. කිතුනු ජීවිතයේ සැබෑ හරය ඇත්තේ දෙවිඳුන්ගේ මැවිල්ල තුළ අසල්වැසි සම්බන්ධතා තුළ දෙවිඳුන්ව මුළුමනින්ම අත්දකින විටය. නැතහොත් මොහොතේ ජීවිතය තුළ දෙවිඳුන් අත්දැකිය යුතුය. ප්‍රේම කරන්නන් පමණක් ප්‍රේමය දැක්වීම, සමාව දෙන්නන්ට පමණක් සමාව දීම, සුහදශීලි වන්නට පමණක් සුහදශීලි වීම, ප්‍රිය වන්නන්ට පමණක් ප්‍රිය වීම කිතුනුවකුගේ ගතිගුණ නොවේ. අද ලෝකයේ මිනිසා, මිනිසා අතර ඇති

☛ 15 පිටුවට

---

## ගරු හෙන්රි සිල්වා පියතුමා

**16**

# උත්පත්ති පොත



### වෘත්තාන්ත ව්‍යුහය

මානව කේන්ද්‍රිය නැතහොත් මිනිසා කේන්ද්‍ර කොටගත් කථා පුවතකි. එබැවින් අනෙකුත් මැවිලි වෙත අවධානය ඉතා අඩුය.

### 2. පණිවුඩය

1. මිනිසා මැවීම (පුරුෂයා) උත්. 2/7

මිනිසා සාදනු ලබන්නේ පොළවේ දූවිල්ලෙනි. දූවිල්ල සඳහා වන හෙබ්‍රෙව් වචනය අෆාර්ය (Aphar) එය කිසිදු වටිනාකමක් නැති දෙයක් වන අතර දිරාපත්වීම හා විනාශවීයාම සංකේතවත් කරයි. එලෙස කාලිකවූ මිනිසා, සදාකාලිකවූ දෙවියන් වහන්සේ හා විසංසන්දනය කිරීමක් සිදුවෙයි. එබැවින් මිනිසා මැරෙන සුලු බව අවධාරණය කෙරේ.

ii. දෙවියන් වහන්සේ මිනිසා නිර්මාණය කරන සේක."යාශාර්' යන හේබ්‍රෙව් වචනය යොදා ඇත. මෙය කුඹල්කරුවකුගේ ක්‍රියාවකි. එබැවින් මිනිසා සම්පූර්ණයෙන් දෙවියන් වහන්සේ මත යැපෙයි.

iii. දෙවියන් වහන්සේ මිනිසා තුළට හුස්ම හෙලන සේක.

හුස්ම, ජීවිතයේ සංකේතයයි. ජීවිතය දානය කරන්නා දෙවියන් වහන්සේය. දෙවියන් වහන්සේගේ හුස්ම මිනිසා සතු වන බැවින් දෙවියන් වහන්සේ හා මිනිසා අතර සබඳතාවයක් ඉන් අඟවයි. මෙම විශේෂ සබඳතාවය සතුන් පිළිබඳව සඳහන් නොකෙරේ. දෙවියන් වහන්සේ සතුන් නිර්මාණය කළ සේක. පොළවේ පසින් පමණකි. එබැවින් මිනිසා සතුන්ට වඩා උතුම්ය. මිනිසා සඳහා වන හෙබ්‍රෙව් වචනය ආදම්ය. පහත සඳහන් වචන දෙකෙන් එකකින් එය බිඳී එන්නක් බව කියැවෙයි. එනම් පොළොව යන අර්ථය ඇති 'අදමා' යන්නෙන් හෝ පලස්තීන පසෙහි වර්ණය වන රතු යන අර්ථය ඇති 'අදෝම්' හෝ යන්නෙන් බිඳී එන බවයි. ඉන් කුමන අර්ථයක් ගැනුනද මිනිසා පොළව හා සම්බන්ධ බව නම් පැහැදිලිය.

iv. මිනිසා තනිව විසීම සුදුසු නැත යනුවෙන් දෙවියන් වහන්-සේ පවසන සේක. හෙබ්‍රෙව් වචනය නෙකේබාය. මෙම වචන-යෙහි අර්ථය සමාජීයව අසරණ බව නැතහොත් අසම්පූර්ණ බවය.

v. ඔහුට සරිලන සහකාරියක සාදා දෙමි. 'ඒසෙර්' යන හෙබ්‍රෙව් වචනයෙහි (සහකාරයා නැතහොත් සහාය දීම) අර්ථය පූර්ණත්වයට පත් කරන්නා නැතහොත් යමක අඩුපාඩුව සම්පූර්ණ කරන්නා යනුවෙනි. ඒ නිසා ස්ත්‍රිය සමාජීය වශ-යෙන් මිනිසා පූර්ණත්වයට පත් කරන බව කියැවේ.

vi. මිනිසාට සුදුසු සහකාරියක ඔවුන් අතර සොයනු පිණිස දෙවියන් වහන්සේ සතුන් මවන සේක. සතුන් මැවීමෙන් පසු දෙවියන් වහන්සේ උන් මිනිසා වෙත ගෙන එන අතර මිනිසා සතුනට නම් තබන්නේ තමා ඔවුනට වඩා උසස් බව අගවමිනි. එ නිසා මිනිසාට සුදුසු සහකාරියක සතුන් අතර නොසිටි. මෙලෙස සඳහන් වන්නේ සමාජීයව මිනිසා සම්පූර්ණ කිරීම සඳහා ස්ත්‍රියගේ අවශ්‍යතාවය පෙන්නුම් කිරීමටය.

vii. මිනිසා බර නින්දකට පමුණුවනු ලබයි.

හෙබ්‍රෙව් වචනය, තර්දේමා ය. පුරාණ ගිවිසුම තුළ බොහෝ කලාතුරකින් දක්නට ලැබෙන වචනයකි. එය සඳහන් වන්නේ හය වතාවක් පමණකි. මෙම වචනය භාවිත වන සැමවිටම කරුණු දෙකක් අඟවනු ලැබේ.

ආ. ගැලවීමේ ඉතිහාසය තුළ දෙවියන් වහන්සේ විශේෂිතවූ නැතහොත් අභිරහස්‍යමය වු යමක් සිදු කරන සේක. උත්. 15/12 හි ආබ්‍රහම් බර නින්දකට වැටෙයි. දෙවියන් වහන්සේ පළමු වතාවට පුද්ගලයකු හා ගිවිසුමක් ඇති කර ගන්නා සේක.

ආ. බෙහෙවින් විශේෂිත දේව අනාවරණයක් දෙනු ලැබේ. "නුඹෙන් පැවතෙන පෙළපත විදේශීය රටක විදේශීකව අවුරුදු 400 ක් වහල් සේවයේ යෙදෙනු ඇත. මම ඔවුන් ගළවා..." (උත්. 15:13-16)

මෙම අවස්ථාවේ මිනිසා බර නින්දකට පත් කර, දෙනු ලබන අනාවරණය විවාහයේ ස්වභාවය පිළිබඳවය. "මිනිසකු තම පියා ද, මව ද අත්හැර සිය භාර්යාවට බැඳෙන්නේ එබැවින්ය. මෙලෙස ඔව්හු එක් කෙනෙක් (එකම මාංශයක්) වන්නෝය." (උත්. 2:24) ස්වාමි පුරුෂයා හා භාර්යාව අතර ප්‍රේමය සියලු මානුෂික ප්‍රේමයන් අභිබවා යයි. එලෙස මෙහිදි වෛවාහික ප්‍රේමය මෙන්ම විවාහය තුළ ඒකත්වය ද ප්‍රබලව ප්‍රකාශ කෙරේ.

viii. ස්ත්‍රිය මිනිසා වෙත ගෙන එන මුත් මිනිසා සෘජුව ඇයට නමක් නොතබයි. ඈට ස්ත්‍රී යැයි කියනු ඇත. එය කර්ම කාරක ව්‍යවහාරයකි. මෙම ප්‍රකාශය. 'දේව ධාර්මික කර්මකාරක යෙදුමක්' ලෙස හැඳින්වේ. එමනිසා දෙවියන් වහන්සේ කර්තෘ නැතහොත් ක්‍රියා කාරකයා වන සේක. සතුන්ට නම් තැබුවාක් මෙන් මිනිසා සෘජුව ස්ත්‍රියට නම් තැබීමක් නොකරයි. මෙය තහවුරු කරන්නේ පුරුෂයා හා ස්ත්‍රිය යන දෙදෙනාම සතු සම ගරුත්වයයි. උදාරත්වයයි.

ix. ස්ත්‍රිය මවනු ලබන්නේ මිනිසාගෙන් ගත් ඉල ඇටයකින් - සෙලා, එසෙම් යන හේබ්‍රෙව් වචනවලින් අඟවනුයේ ලේ නෑ සබඳතාවයක් නැතහොත් එකම ස්වභාවයකි. නිද. 2 සාමු 5, 1-2 .. අපි ඔබේම ලේ නෑයෝ වෙමු. "එහි ඇත්තේ එසෙම් නැමති හේබ්‍රෙව් වචනයයි." එබැවින් මිනිසා සහ ගැහැණිය අතර සම උදාරත්වය ප්‍රබලව අවධාරණය කෙරේ.

(තවත් කොටසක් ලබන සතියේ...)

# "වැටලීම", "වැලලීම" හා "ගොඩ ගැනීම"

**කතුතුමනි,**

ප්‍රිවාස හා ළමා ආරක්ෂක අධිකාරිය පසුගිය දිනෙක, රටේ මහත් ආන්දෝලනයක් ඇති කරමින් අති විශිෂ්ට ක්‍රියාන්විතයක් දියත් කරනු ලැබිය. ඒ අන් කිසිවක් නොව දේව දයාවේ අසරණ සරණ "ප්‍රේම නිවාසය" වැටලීමයි.

මේ "ප්‍රේම නිවාසය" ලොව පිළිගත් ආගමික සංවිධානයක පුන්‍ය ආයතනයකි. එය මොරටුවේ රාවතාවත්තේ පිහිටා ඇත. ළමා ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය ලබා ඇති මෙය, අප දන්නා තරමින් ජාත්‍යන්තර වශයෙන් රටවල් 125 කට අධික සංඛ්‍යාවක ක්‍රියාත්මක වෙමින් අසරණ සරණ දයා සේවාවන්වල යෙදී සිටියි. ඉටු කරනු ලබන සේවාවන්වල ගුණාත්මක භාවය නිසාම පැසසුම් ලබමින් වගකිව යුත්තන්ගේ අවධානය දිනා ගෙන ඇත. අසරණ දුවා දරුවන් පමණක් නොව, කිසිම හවිහරණක් නොමැතිව ජීවිතයත් මරණයත් අතර දෝලනය වන තරුණ ජීවිත හිමි ගැබිණි මව් වරුන්ටත් ඔවුන්ගෙන් උපදින දරුවන්ටත් රැකවරණය ද, ජීවිතයට අත්වැලක් ද සපයනු ලැබිය.

කෙසේ වෙතත් මෙම "ප්‍රේම නිවාසය" හදිසියේ වටලනු ලැබුවාය. ජනමාධ්‍ය ඉදිරියෙන්ම සිටියේය. නොයෙක් ආකාරයේ ප්‍රවෘත්තීන් ද පළ විය. ඒවා කවුරුත් දුටුවෝය. කියැවූවෝය. ඒ අනුව වගකීමෙන් තොරව මාධ්‍යයට රිසිසේ ක්‍රීඩා කළ හැකි පිටියක් නිර්මාණය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් දේව දයාවේ "ප්‍රේම නිවාසය" "බේබි ෆාම්" එකක් ද, ළමා කැපකරු මාපියන් ළමා ගැනුම් කරුවන් ද, අසරණ වූ ගැබිණියන් හා කුඩා දරුවන් රැක බලා ගැනීම ද දෝෂ දර්ශනයට ලක් විය. ඒ සමගම අසත්‍ය ප්‍රචාර හා කටකතා නිසා මෙම නිවසේ පාලිකා පැවිදි සොහොයුරියන්ගේ හොඳ නම කැලැල් විය. ආත්ම ගරුත්වය කෙලෙසිනි. එයින් මුදා හරිනු ලැබූ පිළිවන ද අති මහත්ය. මෙහි බරපතලකම නිසාම, දහසකුත් එකක් රාජකාරී කටයුතු මැද අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් අගරදගුරු හිමිපාණන්ගේ අවධානයට ලක් වීම ද සුළුකොට තැකිය යුතු කරුණක් නොවේ. වරදක් සිදු වී ඇත්නම් එය නිවැරදි කර ගත යුතුය. සිදු වී නොමැත්තේ ද එයයි. අත් අඩංගුවට ගැනීම්, මුදාහැරීම් හා සමාව ගැනීම් ගැන ද ඒ අතර අසන්නට ලැබේ.

අධ්‍යාත්මය විනාශ කරගත් සුපිරි නිවාස සංකීර්ණවල මැඩම්ලා, මත්කුඩු, හොර කසිප්පු ජාවාරම්කරුවන්, පාතාල මැරයන්, ස්ත්‍රී දූෂකයන් හා ළමා අපයෝජකයන් මෙන් දේව දයාවේ අසරණ සරණ "ප්‍රේම ළමා නිවාසයේ" පාලකයින් ද එක පෙළට සිටුවීමට තරම් අස්ථාන චෝදනා බරපතල වී ඇති සැටියෙකි. ඒ නීතියට කවුරුත් එක සමාන නිසා නොව කතෝලික දහමට, සහාවට හා දයා සේවාවට නිරපරාදේ චෝදනා එල්ල කර විනාශ කර දමන්නට වෙර දැරීමේ මානසික රෝගී තත්ත්වය නිසාවෙනි. අවසාන වශයෙන් එකක් පැහැදිලිය. එනම්, අගතියට පත්වුවන් අවසානයේ දී නිදොස් කර නිදහස් වුවත් "වැටලීම" නිසා "වැළලී" ගිය ඔවුන්ගේ "හොඳ නම" යළි "ගොඩ ගැනීම" නම් අසීරු වන බවය. ඊට වගකිව යුත්තේ කවුරුන් ද?

**ජේ. දසනායක**
**පන්නිපිටිය**



# අසරණ කාන්තාවන්ට පිහිටවීම වරදක්ද?

**කතුතුමනි,**

රාවතාවත්ත ප්‍රේම නිවාසයේ සිදු කෙරෙන ජාවාරම් පසුපස යමින් ඒවා සිදුවන බවට පූර්ව නිගමන වලට බට මාධ්‍යවේදීන් යයි කියා ගන්නා මඩ අප්පුලාට මේ රටේ දිනපතා සිදුවන අපරාධ, නීති විරෝධී ගබ්සා, ගණිකා නිවාස, නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම්, සමාජ ශාලා නොපෙනෙන්නේ මන්දැයි විමතියට කරුණකි. හදිසි ඇමතුම් අංකයට යමෙක් සැක සහිත දෙයක් සම්බන්ධව කථා කළවිට අදාල ස්ථානය ගැන රහසිගතව සොයා බලා එම ස්ථානය සම්බන්ධව එහි සිදුවන දේවල් සත්‍යතාවය සොයා බලනවා මිස මාධ්‍යවේදීන් පිරිවරාගෙන යෑමක් හා පූර්ව නිගමන මත පිහිටා මඩ ගැසීම් අප නම් අසා නැත.

මෙම නිවාසය වැටලීම හිතමතා කතෝලික පැවිදි සොහොයුරියන්ට අපහාස කිරීමක් මිස පරීක්ෂණ කිරීමක් නොවන බව පෙනී යයි. මෙය ලියන මම ද එවකට අධිකරණ සේවාවේ නියැලි අයෙක්මි. විශේෂයෙන් බම්බලපිටිය ළමා මහෙස්ත්‍රාත් අධිකරණයේ දී, අපිරිසිදු දිළිඳු විදි දරුවන්, මහ මග වැටී සිටින දිළිඳු වැඩිහිටියන් රැකබලා ගැනීමට නීත්‍යානුකූලව පැවිදි සොයුරියන් රැගෙන යන අයුරු අප දැක තිබේ. අසම්මතයේ ගැබ්ගත් තරුණියන් නීති විරෝධී ගබ්සාහල වෙන නොයවා, දිවි නසා ගැනීමට නොයවා මෙසේ පැවිදි සොයුරියන්ගේ සෙවනේ රැකවරණය ලබන්නේ ජීවිතය ගැන සියළු බලාපොරොත්තු සුන්ව සිටින අවස්ථාවලය.

ප්‍රේම නිවාසය වෙත දිනක් ගොස් දැස් හැර බලන්න. දරුවන්ට මවුවරුන්ට අවශ්‍ය සෑම පහසුකමක්ම පැවිදි සොයුරියන් සපයා ඇති සැටි දැසින්ම දැක ගත හැකිය.

ඇතැමුන් මේ සිද්ධිය සමග සෝම හාමුදුරුවන්ගේ සිද්ධිය ඈඳා ආගම් විරෝධී අදහස් දක්වා කතෝලික සභාවට එල්ල කරන මඩපහර ආපසු තමන් වෙත වදින දිනය වැඩි ඈතක නොවන බව තේරුම් ගත යුතුය.

**ප්‍රේමා හීනටිගල**
**ගල්කිස්ස**

# 'අපූරු අත්වැරැද්ද' නිවැරදි කරගන්නේ කවදා ද?

**කතුතුමනි,**

රාවතාවත්ත 'ප්‍රේම නිවාසයේ' සිද්ධිය අත්වැරදීමක් ලෙස එක්තරා ජාතික පුවත් පතක පළවී ඇත. හිතාමතා සැලසුම්කර ශාන්ත සභාවටත් රාවතාවත්ත ප්‍රේම නිවාසයටත් නිගාකිරීමේ අදහසින් කළ මෙම ක්‍රියාව කිසිසේත් අත්වැරද්දක් විය නොහැකිය.

රූපවාහිනී නාලිකා මගිනුත්, ජාතික පුවත් පත් මගිනුත් මහ ඉහලින් ප්‍රචාරය කරමින් "ප්‍රේම ළමා" නිවාසයේ සිදුවෙමි පවතිනවායැයි හුවා දැක්වූ කිසිම අයහපත් සිදුවීමක් එම ආයතනය තුළ සිදුවී නොමැති බවත්, සිදු නොවන බවත් ඉතා පැහැදිලිව ඥානාර්ථ ප්‍රදීපයේ පලවූ ලිපි කීපයෙන් ප්‍රකාශකර ඇත. හුදෙක් නිර්නාමික දුරකථන පැමිණිල්ලක් මත ළමා ආරක්ෂක අධිකාරී මණ්ඩලය පිරිවරාගෙන මේ ආකාරයෙන් සාහසිකව ක්‍රියා කිරීම සොයා බැලිය යුතු කාරණයකි. මෙය හුදෙක් අත්වැරැද්දක් යයි පැවසීම පමණක් ප්‍රමාණවත් නොවේ. මෙම වරද කළ අය ද, එයට ඉහළ ප්‍රචාරයක් දුන් මාධ්‍ය ද, දැන් එළිදරව්වී ඇති සත්‍යය ප්‍රචාරය කළ යුතුයි. මේ නිර්නාමික අසත්‍ය ආරංචිය දුන් අය සොයා බලා රටට එළිකළ යුතුයි. එසේ නොවන්නේ නම්, එතැනට කටයුතු ඉෂ්ඨ සිද්ධ කළ යුතුය.

මෙය මහින්ද චින්තනයට ද පටහැනිය. එසේ හෙයින් මේ සිද්ධිය අතිගරු ජනාධිපතිතුමා වෙත ද යොමුවිය යුතුයයි අදහස්කරමි. බ්‍රිතාන්‍ය අගමැති ඩේවිඩ් කැමරන් මහතා කිතුනුවන්ට හිරිහැර කරන්නේ නම් සියළු ආධාර නතර කරන බව ප්‍රකාශ කර ඇත. එසේනම් මෙවැනි ක්‍රියා කිරීම් එවැන්නකට අතවැනීමක් ද? ඉදිරියේ දී මෙවැනි සිද්ධීන් තව තවත් විය හැකිය. එසේ හෙයින් අප සභා ශ්‍රේෂ්ඨයින් මේ සම්බන්ධව නිසි ක්‍රියා මාර්ග යත් ගතයුතුව ඇත.

**ඩී. ජේ. ඇන්තනි**
**බටගම**



# ශ්‍රී ලංකාවේ ජන මාධ්‍යය කොයිබටද ?

**කතුතුමනි,**

ඥානාර්ථ ප්‍රදීපය මොරටුව රාවතාවත්ත "ප්‍රේම නිවාසයේ" දයා සේවාව පිළිබඳව ඇති වූ ප්‍රශ්නයේ සියළු සත්‍ය කාරණා ජනතාවට දැන ගැනීමට සැලස්වීම ප්‍රශංසා කටයුතුය.

මේ පිළිබඳව සියළු සත්‍යය කරුණු කාරණා "ප්‍රදීපය කතුවැකිය" මීගමුවේ කතෝලික ශාසනාරක්ෂක බල මණ්ඩලය හා ප්‍රදීපය සහකාර සංස්කාරක ශිරාන් මෛත්‍රී මහතා විසින් ඉතා පැහැදිලිව පෙන්වා දී ඇත්තේ, මෙරට නිහීන ජාතිවාදී, ආගම්වාදී, අන්ත දේශපාලන වාදී, ජනමාධ්‍යයන් අභියෝගයට ලක් කරමිනි. මා දකින පරිදි මේ යුගයේ නියම කිතුනු කමට සාක්ෂි දරන මාධ්‍යවේදියාගේ පරම යුතුකම වනුයේ ද එයයි.

අද මේ රටේ ජන මාධ්‍ය ඔස්සේ කිතුනු කමට ඉතා සියුම් ලෙස පහර දීමට අන්ත වාදී ආගමික කණ්ඩායම් ක්‍රියා කරන බව නොරහසකි. අද සත්‍යය කථා කිරීම යනු සිය දිවි නසා ගැනීමකි. එහෙත් ජනතාව රවටමින් බොරු ප්‍රචාර පතුරුවන මාධ්‍යය ජනතාව කවදා හෝ ප්‍රතික්ෂේප කරති.

ධර්ම ද්වීපය යැයි කියා ගන්නා මේ රටේ දිනකට දහස් ගණනින් හොර ගබ්සා මධ්‍යස්ථානවල වටිනා මිනිස් කලල විනාශ කරද්දී, සත්ත්ව කරුණාව පිළිබඳව ජනප්‍රිය දේශපාලකයින්ගේ වීර ක්‍රියාවන් රස කර ජනතාව හමුවේ තැබීමට නම් අපේ රටේ දේශපාලන ප්‍රතිරූප වල රූකඩයින් බවට පත්ව ඇති සමහර මාධ්‍ය කරුවන්ට හැකිවීම ගැන ඔවුන් ලජ්ජා විය යුතුය.

එබැවින් අප රටේ ජනතාවගේ මනසට පමණක් නොව හදවතට ද සංවේදීව සත්‍යය තොරතුරු සපයන මානව හිතවාදී සැබෑ ජන මාධ්‍ය සංස්කෘතියක් මේ වන විට නොමැතිවීම රටට ජනතාවට ඉමහත් පාඩුවකි.

**ලූෂන් ෂර්ලි එඩ්වඩ්**
**ගෝනවල**

# සුබ අනාගතයකට අපව එතෙර කරන්න


**කතුතුමනි,**

පුත්තලම දිස්ත්‍රික්කයේ නාත්තන්ඩිය මැතිවරණ කොට්ඨාශයේ මහවැව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් තොඩුවාව ධීවර ග්‍රාමයේ වැසියන්ට ඇත අතීතයේ සිට තොඩුවාව - මාදම්පේ කි.මී. 1 1/2 පමණ දුරයාමට ඇති කෙටිම මාර්ගයේ ලුණුඔයට පාලමක් නොමැතිකමින් මගී පාරුවක ආධාරයෙන් ගඟෙන් එගොඩට පාසල් දරුවන්, වැඩිහිටියන් ධීවර ව්‍යාපාරිකයින්, රෝගීන්, ගැබිණි මාතාවන්, විශාල පිරිසක් දිනපතාම උදේ සිට රාත්‍රිය දක්වාම ගමන් කිරීමට සිදුවී ඇත. අධික වර්ෂා කාලයේදී ගංවතුර අවස්ථාවලදී මෙම මගී පාරුව පෙරළී ජීවිත අහිමි වූ අවස්ථාද ඇත.

කතෝලික ධීවර ප්‍රජාවගේ දරුවන්ටඋසස්අධ්‍යාපනයසඳහා මාදම්පේ, මාරවිල, හලාවත, වෙන්නප්පුව වැනි ප්‍රදේශවල ඇති පාසල් වලට ඉතා පහසුවෙන් කඩිනමින් යාමට මේ මාර්ගය ඉතා ප්‍රයෝජනවත්වේ. එමෙන්ම දිනපතා හදිසි අනතුරුවලට ලක්වන ධීවර කාර්මිකයින්, ආබාධිතයින්, වියපත් රෝගීන්, ගැබිණි මාතාවන්, හදිසි අවශ්‍යතාවයකදී ඉතා කඩිනමින් මාදම්පේ, හලාවත, මාරවිල, රෝහල් වෙත රැගෙන යාමට පහසු කෙටිම මාර්ගය මෙය වී ඇත. එමෙන්ම ධීවර සම්පත්, ඉතා ඉක්මනින් අවට ප්‍රදේශවලට රැගෙන යාමටත් එම ප්‍රදේශවල ජනතාවට ධීවර සම්පත් සමග ව්‍යාපාරික කටයුතු කරගෙන යාමට, තොඩුවාව ග්‍රාමයට පැමිණීමටත් ඉතා කෙටි මාර්ගය මෙය බවද සඳහන් කළ යුතුය.

බොහෝ කාලයක සිට තොඩුවාව මාදම්පේ යා කිරීම සඳහා ලුණුඔයට පාලමක් ලබා නොදීමෙන් මේ ප්‍රදේශයේ ධීවර ජනතාවට බොහෝ දුක්කරදර වේදනා රාශියකට මුහුණපාන්නට සිදුවී ඇත. කි.මී. 1 1/2 පමණ මාදම්පේ නගරයට යාමට හැකියාව තිබියදී පාලම සාදා නොදීම නිසා ග්‍රාමවාසීන්ට කි.මී. 4 පමණ දුර ගෙවා මහවැව නගරයට යාමට සිදුවී ඇත. ඒ නිසා තොඩුවාව ධීවර ජනතාවගේ මේ ප්‍රාර්ථනය මල්පලගන්වා ගැනීමටත් ඔවුන් සියලු දෙනාම විජයග්‍රාහීව එතෙර කිරීම සඳහා පිපාසිත සියල්ලන්ගේ කරුණාබර හදවත් යොමුවේවා!

**ඇන්ටනි ස්ටැන්ලිකීර්ති පෙරේරා**
**කුඩාවැව**



# 2011 කිතුනු ඇසින්

## ජනවාරි මාසය

2011 වර්ෂය ආරම්භ වන්නේ ජනවාරි 1 වන දින ආගමික නිදහස කේන්ද්‍ර කරමින් අප දහසයවන බෙනඩික් සුදතුම් පියාණන් විසින් නිකුත් කළ වර්ෂයේ මංගල සාම පණිවුඩය තුළිණි. “විවිධ පීඩාවනට, භීෂණයට, හිංසාවනට අසහනයට ගොදුරු වී සිටින කිතුනු සංඝයන් ආසියාවේ, අප්‍රිකාවේ, මැද පෙරදිග මෙන්ම ශුද්ධවූ දේශයේ ද වෙසෙන අතර ඔවුන් කෙරේ අවදානය හා යාච්ඤා ද නීතිය සාධාරණත්වය ඉටු කිරීමේ අවශ්‍යතාවය ද උන්වහන්සේ ඒ තුළින් අනාවරණය කර ඇත. උන්වහන්සේගේ වර්ෂ ආරම්භක පණිවුඩයේ අන්තර්ගතයට අප ශ්‍රී ලංකාව ද වරින් වර ප්‍රායෝගිකව සංවේදී වූ බවද නොරහසකි.

හා. ජුසේවාස් මුනිවරයාණන්ගේ 300 වන ජයන්ති සංවත්සරය ජනවාරි මාසයට යෙදුන අතර එම ජාතික උත්සවය තේවත්ත පුදබිමේ අපෝස්තලික තානාපති ඇතුලු රදගුරු මඬුල්ලේ සහභාගිත්වයෙන් පැවැත්විණ. එසේම ගාල්ල විශ්‍රාමික රදගුරු අති උතුම් එල්මෝ පෙරේරා හිමිපාණන් පූජකවරයේ 50 වන සංවත්සරය ද නි.ම.නි. ප්‍රාදේශියාධිපති ලෙස ගරු ජූඩ් රෝහාන් පියතුමාගේ පත්වීම ද සිදුවූයේ ජනවාරි මාසයේ දීය. එසේම පර්ල් වීරසිංහ මහත්මිය ශ්‍රී ලංකාවේ ප්‍රථම කම්කරු කොමසාරිස් ජනරාල්වරිය ලෙස පත්වීම ද මතකයට එයි. එසේම ආසියා ජනමාධ්‍ය උලෙළේ දී හොඳම නිර්මාණාත්මක නිවේදක ලෙස කඩවත ප්‍රියන්ත විජේසිංහ මහතා ඒකමතිකව තේරීම ද ඒ හා බැඳි ඉදිරියට එයි. එසේම භක්ති ප්‍රබෝධන නව සංස්කාරක ලෙස ගරු ඩිලාන් පෙරේරා නි.ම.නි. පියතුමන්ගේ පත්වීම ද සිහිපත් වෙයි.

## පෙබරවාරි මාසය

දළුපත සාන්ත අන්තෝනි මුනිවර දෙව්මැඳුර සිද්ධස්ථානයක් බවට පත් කෙරෙයි. සිරි කුරුස පැවදි නිකායේ ප්‍රාදේශියාධිපති ලෙස ගරු පියුමා පීරිස් සොයුරිය පත්වීම් ලබයි. බර්ට්‍රම් ප්‍රනාන්දු මහතා කිතුනු කටයුතු පිළිබඳව ජනාධිපති සම්බන්ධිකාරක ලෙස පත් වෙයි. මොරටුව ජයලත් අප ස්වාමිදූ කන්‍යාරාමයේ 125 ජයන්ති සංවත්සරය යෙදිණ. අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ට රෝමයේ ලුසිනාහි සා. ලෝරන්ස් දෙව්මැඳුරේ භාරකාරත්වය හිමිවෙයි. දිව්‍ය ගැලවුම්කාරයාණන්ගේ නිකායේ නව ප්‍රාදේශියාධිපති ලෙස ගරු ශිරාන් ෆොන්සේකා පියතුමා පත්තවීම් ලබයි. වතිකානයේ සිටින රටවල් 175 ක තානාපති නිලධාරින්ගේ සංවත්සර උළෙලේ දී සුදතුම් පියාණන් ආගමික නිදහසට ඇති තර්ජනයන්හි ප්‍රවණතාවයක් ඇති බව ප්‍රකාශ කරයි.

## මාර්තු මාසය

අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් විසින් තලවිල සා. ආනා සිද්ධස්ථානයේ 250 වන ජුබිලිය සඳහා ජුබිලි වර්ෂය ප්‍රකාශයට පත් කරයි. ලංකා සභාවේ කොළඹ රදගුරු ලෙස අතිගරු ඩී. බී. කනගසබේ හිමි පත්වීම් ලබයි. රත්නපුර රදගුරු පදවියේ සහ මරිය හමුදාවේ චතාරික ධර්ම විවේකය මඩු කඳවුරේ දී පැවැත්වෙයි. කුරුණෑගල රදගුරු පදවියේ ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ගල්කැටිය සමෘද්ධි සමිති මගින් මැල්සිරිපුර සිරිහද දහම් පාසල් සිසුන් 75 කට නොමිලයේ බයිබල් පොත් පරිත්‍යාග කෙරිණි. කොළඹ අගරදගුරු පදවිය වඩාත් ශක්තිමත් කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගැනෙයි. දකුණු සුඩානයේ 37 හැවිරිදි පැවදි සොයුරිය ඝාතනය කිරීමට විරුද්ධව එහි රදගුරු අති උතුම් එඩ්වඩ් හිබෝම් හිමි විරෝධය පල කරයි. අති උතුම් 16 වන බෙනඩික් සුදොතුම් පියාණන් “නාසරෙතයේ ජේසුස්” ග්‍රන්ථයේ දෙවැනි කාණ්ඩය මුද්‍රණය කිරීමට පියවර ගැනේ.

## අප්‍රියෙල් මාසය

ල.ක්‍රි.වි. ජාතික අනුශාසක සම්මේලනය මග්ගොන විසෙන්ති නිවාසයේ නි.ම.නි. ප්‍රාදේශියාධිපති යොහාන් සිල්වා පියනමගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. සභාව තුළ ඉඳිමින් එල්ල කරන සාතන්ගේ ප්‍රහාර පිළිබඳව









අවධානය යොමු කරවීමක් තරුණ ධර්මෝපදේශ ග්‍රන්ථයට පෙරවදනක් සපයන සුදොතුම් පියාණන් විසින් සඳහන් කරයි. අග රදගුරු පදවියේ මීසම් 125 තුළ කුඩා කිතුනු සංඝ බිහිකොට ඒවා ශක්තිමත්ව කරගෙන යෑම, කිතුනු සංඝ ප්‍රවර්ධන වැඩසටහනේ ආරම්භ කෙරේ. ගුරුවරුන්ගේ සහ සිසුන්ගේ නාම සාන්තුවරයා හැටියට විරුදාවලිය ලබා සා. ජෝන් ද බැප්ටිස්ට් ද ලාසාල් මුනිතුමන්ගේ 360 වන ජන්ම සැමරුම මෙම මාසයේ අවසාන දිනට යෙදිනි. කොච්චිකඩේ සා. අන්තෝනි මුනිවර සිද්ධස්ථානයට කෞතුකාගාරයක් ඉදිකිරීමට සැලසුම් කර ඇති අතර ඒ සඳහා පළමුවන පරිත්‍යාගය සා. අන්තෝනි මුනිවර බැතිමතියක වූ ශිරන්ති රාජපක්ෂ ආර්යාව විසින් ප්‍රදානය කරනු ලැබිණ. ඇක්වයිනස් විශ්ව විද්‍යාලීය ආයතනය ප්‍රථම වරට හෙදියන් පුහුණු කරනු ලබන තුන් වස් හෙදියන් පුහුණු ඩිප්ලෝමා පාඨමාලාවක් දියත් කරයි. අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් රත්නපුර රදගුරු පදවියේ පිළිගැනීම කෑගල්ල නගරයේ දී සිදු කෙරුණු අතර ඉදිරියේ එන වෙසක් උත්සවයට ගරු කිරීමක් වශයෙන් මස් අනුභව කිරීමෙන් වළකින ලෙස කිතුනුවනට කළ ආයාචනය ද මතකයට එයි. ඒ සමඟ එංගලන්තයේ විලියම් - කේට් රාජකීය විවාහ මංගල්‍යය ද මතකයට නැගේ.

## මැයි මාසය

අති උතුම් දහසය වන බෙනඩික් සුදොතුම් පියාණන් විසින් සගසුව දිනූ දෙවන ජුවාම් පාවුළු සුදොතුම් පියාණන් භාග්‍යවරයට ඔසවන ලද බව ප්‍රකාශයට පත් කෙරිණි. කුරුණෑගල රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන් විසින් කුරුණෑගල රදගුරු පදවියේ රිදී වර්ෂය ප්‍රකාශයට පත් කරයි. ලතින් දිව්‍ය පූජාව අවැසිතා මත පැවැත්වීමේ හැකියාව පිළිබඳව සුදොතුම් පියාණන් විසින් චක්‍ර ලේඛයක් මඟින් ප්‍රකාශයට පත් කරයි. නිර්මල මරිය නිකායේ නිර්මාතෘ එව්ජින් ද මැසනොද් මුනිවරයාණන් 150 ගුණානුස්මරණය සිදුකෙරෙන කතෝලික සමාජ දහමේ පළමු ප්‍රකාශනය නිකුත් වී වසර 120 සපිරිණි. අගරදගුරු පදවියේ තේවාචාර්යවරුන් 9 ක් පූජකවරය ලබයි. කඩලාන සා. අන්තෝනි මුනිවර පිහිටාරක්ෂක සමිතියට වසර 100 සපුරයි. ජාත්‍යන්තර ආගමික නිදහස පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කොමිසම් සභාව විසින් ආගමික නිදහස විනාශ කර රටවල් 14 ලෙස බුරුමය, චීනය, ඊජිප්තුව, එරිත්‍රියාව, ඉරානය, ඉරාකය, නයිජීරියාව, උතුරු කොරියාව, පකිස්ථානය, සෞදි අරාබිය, සුඩානය, තුර්බෙකිස්ථානය, උස්බෙකිස්ථානය සහ වියට්නාමය නම් කර ඇති බව ප්‍රකාශ කර ඇත. ශ්‍රී ලංකා රදගුරු සමුළුව විසින් හිටපු හමුදාපති සරත් ෆොන්සේකා මහතාට නිදහස ලබා දිය යුතු බව අවධාරණය කර ඇත.

## ජූනි මාසය

ගාල්ල පදවියේ හත්වන රදගුරු හිමිපාණන් ලෙස අතිගරු රේමන්ඩ් වික්‍රමසිංහ පියතුමන් පත් කළ බව වතිකාන ප්‍රවෘත්ති අංශය ප්‍රකාශ කරනු ලැබීය. නාවික හමුදාවේ කමාන්ඩර් ඩේමියන් ප්‍රනාන්දු මහතා රණවිරු රියල් ස්ටාර් තරගයෙන් ප්‍රමුඛස්ථානය හිමි කර ගැණින. ශ්‍රී ලංකා පැවදි නිකා ශ්‍රේෂ්ඨයන්ගේ සමුළුව ඥානෝදයම් හිදි උත්සවශ්‍රීයෙන් පැවැත්විය. පුද්ගලික අංශයට විශ්‍රාම වැටුප් ලබාදීමේ පණතට විරෝධතාව පල කරමින් කටුනායක නිදහස් කලාපීය වැඩ කරන ජනතාව කළ උද්ඝෝෂණයේ දී පොලිස් වෙඩි පහරින් යටියන හල්ලොලුවේ රොෂාන් චානක තරුණයා මියැදින. මාරිස්ට් සහෝදර නිකාය වසර සියය සපුරයි. ශුද්ධ බයිබලය පිළිබඳව මූලික දැනුමක් ලබාදෙන බයිබල් විශාරද ආචාර්ය හෙන්රි සිල්වා පියතුමාගේ “ශුද්ධ බයිබලයට පොදු හැඳින්වීමක්” ග්‍රන්ථයේ මුල් කාණ්ඩය දොරට වැඩිණ. වසර 93 කට පසු එනම් 1918 රුසියාවේ පීටර්ස්බර්ග් නගරයේ දී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැඩම කළ දිව්‍ය සත්ප්‍රසාද පෙරහරක් පැවැත්විණ. කිතුනු පීඩනයට එරෙහි වූ “කිතුනු ආරක්ෂාව හා සහයෝගිතවය නම් සංවිධානය මඟින් සංඛ්‍යා ලේඛන සහිතව විනාඩි 5 කට එක් මනුෂ්‍යයෙක් ද වශයෙන් වසරකට ලක්ෂයකට වඩා කිතු දහම වෙනුවෙන් දිවි පුදන බව ප්‍රකාශ කරයි. සිරිලක ඉපැරණි පුවත්පත වූ “ඥානාර්ථ ප්‍රදීපය” වසර 145 සැමරීය.

## ජූලි මාසය

කතෝලික අති බහුතරයක් වෙසෙන, ලෝකයේ නවතම නිදහස් රාජ්‍ය ලෙස දකුණු සුඩානය ඉතිහාසයට එක්විණි. බොරැල්ල සියලු සාන්තුවර දෙව්මැඳුරේ 3000 වැනි සදාසරණ නුවානය හා උත්සවය කාදිනල් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි. අම්පිටිය ජාතික දෙව්සත්හලේ පුහුණුව ලද ගරු නෙවිල් ජැන්ස්, ඉග්නේෂස් සේනානායක, සුනිල් ගුණවර්ධන, බී. එල්. ඩී. පෝල්, සුනිල් වේරගොඩ, ඇන්තනි ජයකොඩි, සිස්වාන් කෲස්, ජෙරාඩ් සවරිමුත්තු, හයිසින්ත් ප්‍රනාන්දු, සිසිල් ජෝයි පෙරේරා, කැලිස්ටස් ප්‍රනාන්දු, එරික් ප්‍රනාන්දු, රෝලන්ඩ් රුද්‍රිගු, ශ්‍රියානන්ද ප්‍රනාන්දු, නන්දන මනතුංග, එල්මෝ රාජ් ප්‍රනාන්දු, නේරියෝ ඒබ්‍රහම්, අතිග රු රොබින්සන් විජේසිංහ, සගසුව දිනූ මෙරිල් විජේසිංහ පියවරු 18 දෙනකුගේ පූජාත්වර රජත ජයන්තිය යෙදුනි. මහනුවර අම්පිටිය ජාතික දෙව්සත්හලේ නව අදියුරු ලෙස අතිග රු එල්මෝ ඩයස් පියතුමා පත්වෙයි. මොරටුව සිරිහද සමිතියට 75 වසර සපුරයි. 45 වන ජාත්‍යන්තර සංනිවේදන දින සමරු උත්සව ගරු බෙනඩික් ජෝසප්, ගරු සිරිල් ගාමිණී යන පියවරුන්ගේ සහභාගිත්වයෙන් පැවැති අතර ආරාධිත තේමා දෙසුම එඩ්වින් ආරියදාස ශූරින් විසින් කරනු ලැබීය. සෞදි අරාබියේ මරණීය දණ්ඩනයට නියමිත සේවිකා රිසානා නමින් මෙනෙවියට අභයදානය දෙන ලෙස ශ්‍රී ලංකා රදගුරු සමුළුව අදාළ බලධාරින්ගෙන් ඉල්ලා සිටී. කුරුණෑගල සා. ආනා ආසන දෙව්මැඳුරේ 150 වන ජුබිලි මහෝත්සව මංගල්‍යය උත්සවශ්‍රීයෙන් පැවැත්විණ.

## අගෝස්තු මාසය

ලෝක තරුණ දිනය ස්පාඤ්ඤයේ මැඩ්රිඩ් නුවරදී පැවැත්විණි. වතිකානයේ ශුද්ධාසනය සමඟ විදේශ සම්බන්ධතා ඇතිකරගත් නූතන රාජ්‍ය ලෙස මැලේසියාව පත්වෙයි. මරිය හමුදාවට වසර 90 ක් සපිරුන අතර එහි නිර්මාතෘ ප්‍රැන්ක් ඩප් මහතාගේ චරිතාපදාන ග්‍රන්ථයක් නිකුත් කිරීමට එංගලන්තයේ ඩබ්ලින් සරසවිය පියවර ගෙන ඇත. අගරදගුරු පදවියේ දිව්‍ය සත්ප්‍රසාද වසර නිමාවීමත් සමඟ වසර දශකය ප්‍රකාශයට පත් කෙරුණ අතර පළමු තේමාව “දිව්‍ය සත්ප්‍රසාදයේ දේව මාතාවෝ” ලෙසට ප්‍රකාශ කර ඇත. ගාල්ල රදගුරු පදවියේ හත්වන රදගුරු හිමිපාණන් ලෙස අතිගරු රේමන්ඩ් වික්‍රමසිංහ පියතුමන් පදවි ප්‍රාප්ත විය. භාග්‍යවත් ජුසේවාස් දේව ධර්ම නිකේතනයේ නව අදියුරු ලෙස ගරු දයා ශෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා පත්විය. මහජන බැංකුවට වසර 50 ක් සපිරීම නිමිතිකොට ගෙන මහජන බැංකු කිතුනු









එකමුතුව සංවිධානය කළ උත්සවයට ආරාධිත අමුත්තා වශයෙන් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ සහභාගි වූ අතර මහජන බැංකු අධ්‍යක්ෂ ඩී. ඩී. ජේ. ජයකොඩි මහතා ද සහභාගි විණ.

## සැප්තැම්බර් මාසය

දිවයිනේ විශිෂ්ඨ තරුණයන් 10 දෙනා අතර පළමුවැනියා ලෙස ඩි ලාසාල් නිකායේ ගරු පුබුදු රාජපක්ෂ සහෝදරතුමා ජනපති ආර්යා ශිරන්ති රාජපක්ෂ මහත්මිය වෙතින් හිමි සම්මානය ලබා ගනු ලැබිණි. රාවතාවත්ත සුරතාවයන්ගේ රාජේශ්වරී දෙව්මැඳුරේ ස්වර්ණ ජයන්ති වසර ප්‍රකාශයට පත් කිරීම ජාතික දෙව්සත්හලේ නව අදියුරු ගරු එල්මෝ ඩයස් පියතුමා විසින් සිදුකෙරිණි.

අසරණ සරණ දූතිකාව ලෙස විරුදාවලිය ලද තෙරේසා මව්තුමියගේ 25 ගුණානුස්මරණය උත්සවශ්‍රීයෙන් පැවැත්විණ. ලංකාවේ රදගුරු පද්ධතිය ආරම්භකර වසර 125 සපිරිණ. ජාතික පවුල් හමුව තලවිල දී පැවැත්විණ. දොමිනිකාන පැවදි නිකායේ නිර්මාතෘ ප්‍රැන්සිස්කා ඩෙල් ස්ප්‍රිතු සාන්තු මව්තුමියගේ සගසුව දිනීමේ 300 සංවත්සරය යෙදුනි. උතුරේ අවතැන්වූවන්ට නිවාස 75 ක් කරිටාස් වෙතින් ගොඩනඟා බාර

## ගෙවී ගිය වසරේ සිද්ධීන් සමුදායක් වෙත කිතුනු ඇස යොමු කරමින් සැකසුණු විශේෂාංග ලිපියකි මේ...

සිදුවූ අතර එයට වතිකාන තානාපති ඇතුලු
ුරු මංඩලය, අමාත්‍ය බැසිල් රාජපක්ෂ
තා ද සහභාගි වූහ. රත්නපුර සාන්ත
සෙන්ති පාවුලා සමිතිය රජත ජයන්තිය
ැත්වීය. නැගෙනහිර කොළඹ කලාපීය
හිමි ලෙස අතිගරු ඇන්ටන් ප්‍රනාන්දු
තුමා පත්විය.

### ඔක්තෝබර් මාසය

භාග්‍යවරයට එසැවුන දෙවන ජුවාම් පාවුලු
දාතුම් පියතුමා නමින් ප්‍රථම වරට
ලයයක් ජා-ඇල, මාඑළිය ජුවාම් පාවුළු
යස්ථානයේ දී ගරු සිරිල් පෙරේරා
තුමාගේ මෙහෙයවීමෙන් පැවැත්විණ.
න්සිස්කාන කැපුචින් නිකායේ දසවන
ාත්සරය පල්ලන්සේන දෙව්සත්හල් පරිශ්‍රයේ
වුල් දිව්‍ය යාගය අපෝස්තලික තානාපති
සමග බෙල්ජියම්, පකිස්තාන, කර්ණාටක
පුචින් ප්‍රාදේශියාධිපතිවරුන් සමග
ැත්විණ.

ලෝක විවාහ හමුවේ ආසියාතික
මේලනය ඉන්දියාවේදී පැවැත්විණ. පුංචි
මය යයි විරුදාවලිය ලද මීගමු නගරාධිපති
ස ඇන්ටන් පිටිපන ජයවීර මහතා ද උප
පති ලෙස විජිත රොහාන් මහතා ද පත්වූහ.
නිස් 35 වන සිනමා සම්මාන උලෙළ
දිනල් හිමිපාණන් ආරාධිත අමුත්තා වශයෙන්
ප්‍රාප්ත වූ අතර එය බංඩාරණායක
මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණ. එහිදී
ර්ණ සම්මානයන් මහේන්ද්‍ර පෙරේරා හා
ා අබේරත්න දෙපළ ලබා ගත්හ. මීගමු
යොලා විදුහලේ ආචාරිණී ශ්‍රීනි වාසනා
රතුංග මහත්මියගේ අභිරහස් මරණය
හලය හා සංවේගය දනවන්නක් විය.
යතුමියගේ ප්‍රැන්සිස්කාන සොයුරියන්ගේ
ාය සියවස් ජයන්තිය සමරති. පළාත් පාලන
ිවරණය දින ගැටුමක දී හිටපු මංත්‍රී භාරත
ෂ්මන් මහතා මියැදුන අතර වත්මන් මංත්‍රි
න්ද සිල්වා අසාධ්‍ය තත්ත්වයේ පසුවිණ.

### නොවැම්බර් මාසය

කිසිදු පූජකවරයකුට පක්ෂ දේශපාලනය
ාහොබින බව කාදිනල් හිමිපාණෝ ප්‍රකාශ
ති. තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරයේ 60
සංවත්සරය පැවැත්විණ. දොන් බොස්කෝ
ිඳුන්ගේ ශුද්ධවූ ධාතු සිරිලකට වැඩම
රිණ. හංවැල්ල මීසමෙන් වෙන්වී රත්නපුර
මක් පත්ව වසර 125 සපිරිණි. ගරු
ට්ටනට් ගෝමිස් සොයුරිය ප්‍රැන්සිස්කාන
ායේ ශ්‍රේෂ්ඨාධිපතිනිය ලෙස පත්විණ.
ධර්මවාදීනට එරෙහි ගිහි සංවිධානයක් මීග
විදී ඇරඹිණ. අති උතුම් 16 වන බෙනඩික්
දාතුම් පියාණන් විසින් ගරු මැක්ස්වල්
වා පියතුමා හා ගරු එම්මානුවෙල් ප්‍රනාන්දු
තුමා කොළඹ අගරදගුරු පදවියේ සහයක
ුරු හිමිපාණන් ලෙස නම් කරනු ලැබිණ.
ත චෝදනා මත රාවතාවත්ත ප්‍රේම
ාසයේ ගරු සොයුරිය අත්අඩංගුවට ගෙන
ව නිදහස් කෙරිණ.

ඒ පිළිබඳව ඇති තතු හෙළි කරන තෙක්
ය උත්සව වලට සහභාගි නොවන බවට
දිනල් හිමිපාණන් කළ අභීත ප්‍රකාශය ද
කයට එයි. විපක්ෂ නායක එතෙර
ලුවකට යෑම සඳහා වැඩබලන නායක ලෙස
තෝලිකයකු වූ ජෝන් අමරතුංග මහතා පත්
ම පිළිබඳව අන්තවාදීන්ගේ විරෝධතාවයන්
ිදුවිණි. පාඩු ලබන ආයතන රජයට පවරා
ීමේ පනත හදිසි පනතක් ලෙස කඩිමුඩියේ
න ඒමත්, සුප්‍රකට ව්‍යාපාරිකයන්ගේ ලාභ
න ඇතැම් ව්‍යාපාරත් ඒ තුළට ගොනුවීම
බඳ රටේ ඇතිවූ කතා බහ ද මතකයට එයි.
මෙගම හදිසි පනතක් ලෙස පාර්ලිමේන්තුව
න ඒම උපයෝගී කරගෙන ආගම් පනත ද
ර්ලිමේන්තුවට ගෙන ඒමට දැරූ ප්‍රයත්නයන්
නමාධ්‍ය තුළින් දැක ගත හැකි විය. "සිරස"
වය කරන කතෝලික නිවේදිකාවකට සිය
ලේ කුරුසිය සහිත මාලය ඉවත් කරන
ස කළ දැන්වීම ද මතකයට නැගෙයි.

### දෙසැම්බර් මාසය

පැවදි නිකා ශ්‍රේෂ්ඨ සමුළුව තේවත්තේ
ම විවේකාගාරයේ පැවති අතර පැවදි
ායන් 56 ක් සහභාගි විය. ජේසු නිකායික
. රාසයියා පියතුමා නව සභාපති විය. නව
ික ධර්මෝපදේශ අධ්‍යක්ෂ ලෙස ගරු පියල්
ක ප්‍රනාන්දු පියතුමා පත් විය. නිර්මල









මරිය නිකායික 22 ක් දෙසැම්බරයේ භාග්‍යවරයට එසැවිනි. "සාම මිහිර", "උඳුවප් මිහිර", "උඳුවප් තරුව", "පියුම" නත්තල් සඟරා දොරට වැඩිණ. මෙම ලිපිය ලියන අවස්ථාව වන විට නයිජීරියාවේ කතෝලික දෙව්මැඳුරු තුනකට නත්තල් රාත්‍රියේ බෝම්බ ගසා 43 මියැදෙයි. 2011 නත්තල් තැපැල් මුද්දරය ලෙසින් ක්‍රිෂ්මාල් රුබේරු ශිෂ්‍යාගේ නිර්මාණයත්, හොඳම නත්තල් සුබ පැතුම් පත සඳහා සුරක්ෂිකා ජීවන්තිකා ප්‍රනාන්දු ශිෂ්‍යාවගේ නිර්මාණයත් තේරී ඇති බව වාර්තා විය.

රාවතාවත්ත "ප්‍රේම නිවාසය" සිද්ධියේ දී කතෝලිකයන් වෙනුවෙන් හඬ නැගූ සරත් ගුණරත්න, නියෝමාල් පෙරේරා, සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මෙන්ම ජෝන් අමරතුංග, ජයලත් ජයවර්ධන, ජෝශප් මයිකල් පෙරේරා යන මැති ඇමතින්ද සිද්ධිය පිළිබඳ කමාව අයැදූ තිස්ස කරලියද්ද මහතා ඇතුලු ඇතැම් ඇමැතිවරු මතකයට එයි. සුනාමි ව්‍යසනයට දෙසැම්බර් 26 දිනට වසර 7 සපිරුණ අතර එයින් ජීවිතක්ෂයට පත්ව මාතර කන්‍යාරමයේ ගරු කූල්මේයර් සොයුරිය ද, ගාල්ල, මාතර, හම්බන්තොට ඇතුලු මීසම්වල මියැදුන ජනතාව ද මතකයට එයි. එසේම පසුගිය වසරේ සගසුව දිනූ ගරු ඇල්ප්‍රඩ් ඇලෙක්සන්, නාමල් ප්‍රනාන්දු, මෙරිල් විජේසිංහ, නික්ලස් සී ලෝව්, ඇන්සලම් සිල්වා, සී. එම්. රූපසිංහ, බොබි ලකාර්වා ඩේවිඩ් ධර්මරත්න පියතුමන්ලාද මතකයට එන්නේ නිරායාසයෙනි.

සමස්තයක් වශයෙන් ගත්කල ඇතැම් අන්තවාදීන්ගේ ක්‍රියා කලාපයන් විවිධ අයුරින් දිස්වූ අතර 2011 වසර ප්‍රථම වරට ශ්‍රී ලංකාවට නවක රදගුරු හිමිපාණන් වහන්සේලා තිදෙනෙක් ලැබීම ද සටහන් කළ යුතු විශේෂ සිද්ධියක් වන්නේය. කතෝලික මුද්‍රණාලය සුවිශේෂී ප්‍රගතියක් ලබා ඇති බව කතෝලික ලේඛක සුහද හමුවේදී අනාවරණය වීම ද 2011 වර්ෂයේ සුභවාදී ජයග්‍රහණ මාවතකට යොමුවූ පැතිකඩක් ලෙසට දිස්වන්නේය.

✍ තියබෝල්ඩ් සමරතුංග

# කොටහේනේ දෙවැනි දෙව්මැඳුරේ කීර්තිය

**කොටහේනේ දෙවැනි වරට ඉදිකරන ලද සාන්ත ලුසියා දෙව්මැඳුර ඉතිහාසයෙන් ගහන වූ බව කිව යුතුයි. එම යුගයේ ජීවත් වූ කතෝලිකයෝ එම දෙව්මැඳුර ගැන සාඩම්බරයෙන් කතා කළහ. එය ඉතා ඉහළින් සැලැකූහ.**

මේ දෙව් මැඳුරේ කොටසක් වෙන්කොට එහි පැරැණි වස්තූන් ආරක්ෂිතව තබන ලදි. ආදි කතෝලික යුගයේ ඓතිහාසික වටිනාකම් ඇති කෞතුක වස්තූන් රැසක් මෙයට ඇතුළත්ව තිබිණි. ඒ අතර දිවයිනේ දහම් ප්‍රචාරක සේවා කළ ප්‍රථම කණ්ඩායමේ පියතුමකු වූ ගරු මොන්ටෙයිරෝද සෙතුවෙල් පියතුමා ගේ සොහොන් ගැබ වසා තිබුණු හිස ද විය. මෙය කොළඹ කොටුවේ බැටන්බර්ග් මුර කුටිය යට තිබී ක්‍රි.ව. 1836 දී හමු වී තිබේ. මෙය කතෝලික සභාවට බාර කරන ලදුව ඉතා ගෞරවයෙන් පෙරහැරෙන් ගෙනැවිත් මෙම ප්‍රධාන දෙව්මැඳුරේ තැන්පත් කරන ලදැයි වාර්තා වේ.

දොන් ජුවාන් ධර්මපාල රජු භූමදාන කරන ලද්දේ "ගෝඩන් ගාඩන්ස්" හෙවත් ගෝඩන් මල් උයන පිටුපස එවකට පිහිටි සාන්ත අන්තෝනි දෙව්මැඳුර ඇතුළත ය. මෙම ස්ථානයේ ද තිබී හමුවූ කතෝලික හා රෙපරමාදු කෞතුක වස්තූන් වුල්වන්ඩාල් හෙවත් "සාන්ත බස්තියම" අසළ කඳු මුදුනේ පිහිටි රෙපරමාදු දෙව්මැඳුරටත් කොටහේනේ කතෝලික දෙව්මැඳුරටත් පවරන ලදි.

දොන් ජුවාන් ධර්මපාල රජු ගේ සොහොන් හිස පසුව කතෝලික දෙව්මැඳුරට පවරන ලදැයි වාර්තා වන්නේ ය. මෙය ඉනික්බිති අද පවතින දෙව්මැඳුරේ අත්තිවාරමට සවි කරන ලදැයි ගරු එස්. ඥානප්‍රගාසර් පියතුමා සහ ජේ. පී. ලුවිස් වාර්තා කරත්. (Res. S. Gnana Pragasar - History of the Catholic Church in Ceylon සහ J. P. Lewis - Tombs and Monuments බලන්න. )

මේ අතර ලංකාවේ නැවැතී සේවා කළ ප්‍රථම රදගුරු අති උතුම් වින්සෙන්ටේ ද රොසයිරෝ හිමිපාණන් ගේ ද අති උතුම් කජෙටානෝ ඇන්ටෝනියෝ රදගුරු හිමිපාණන් ගේ ද, මීසම් බාරව සේවා කළ ගරු කැජටන් ද රොසාරියේ පියතුමන් ගේ ද ගරු මිගෙල් ද ඇල්බකර්ක් පියතුමන් ගේ ද දේහයන් එහි තැන්පත් කොට තිබුණි.



යටගිය දවස

විශ්‍රාමික අගරදගුරු අති උතුම්

**ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණෝ**

**92**

ක්‍රි.ව. 1873 මෙහි ගොඩනැගිලි ඉවත් කරන විට ඉතා වැදගත් ලේඛන රැසක් ඒවායේ සවිකැර තිබුණ බවට "ඥානාර්ථ ප්‍රදීපය" පත්‍රයේ වාර්තාකරුවෙක් සාක්ෂි දරයි. ක්‍රි.ව. 1873 "ඥානාර්ථ ප්‍රදීපය" පත්‍රයේ ඔහු ලියා ඇත්තේ "ග ඩොල් ගලවනකොට ඒවා අතරින් පතර තිබෙන ඉතා වැදගත් ශිලාලේඛන කීපයක් දුටිමි." කියා ය. ක්‍රි.ව. 1838 ජනවාරි මස 14 වැනි දා මෙහි ඉතා වැදගත් සිදුවීමෙකි. එය ශ්‍රී ලංකා කතෝලික ඉතිහාසයේ ශ්‍රේෂ්ඨතම සිද්ධිය ලෙස හැඳින්විය හැකිය. එනම් ප්‍රථමවරට දිවයින තුළ රදගුරුහිමි නමක් පදවි ප්‍රාප්ත කැර වීම යි. දිවයිනේ කතෝලික ඉතිහාසය ඈත අතීතයට ඇදී ගියත් දිවයින තුළ ම ජීවත් වෙමින් මෙහි රැඳී සේවා කළ ප්‍රථම රදගුරු හිමිපාණෝ අති උතුම් වින්සන්ටේ ඩො රොසයිරෝ හිමිපාණෝ ය. එතුමන් පත්වීම් ලැබුවේ මුළු දිවයිනේ ම අනුරදගුරු හිමිපාණන් වශයෙනි. ඉන්දියාවේ දී රදගුරු අභිෂේක ලබා දිවයිනට සැපත් වූ එතුමන් නිල වශයෙන් තම වගකීම් බාර ගැනීම සඳහා පදවි ප්‍රාප්ත වීමේ උත්සවය පවත්වන ලද්දේ මෙහිදී ය.

එ දින හෙවත් ක්‍රි.ව. 1838 ජනවාරි 14 වැනි දින පවත්වන ලද දිව්‍ය පූජා මෙහෙයයෙන් ඉක්බිති, රදගුරු හිමිපාණන් කැටුව අනුනායක පියතුමන් ද අමතර පූජාප්‍රසාදීන් වහන්සේ දස දෙනෙක් ද තමනට සූදානම් කැර තිබූ ආසන වෙත ගොස් වාඩිගත්හ. ඉන් පසු අනුනායක පියතුමා නැගිට සොළොස් වැනි ( 16 වැනි) ග්‍රෙගරි ශුද්ධෝත්තම පියාණන් වහන්සේ නිකුත් කරැති, ක්‍රි.ව. 1836 දෙසැම්බර 3 දාතමින් යුත් "කුම් අඩ් රෙජීමිනිස් බෝනුම්" නමැති නිල නිවේදනය ජනතාව ඉදිරියේ කියැවූයේ ය. ඉනික්බිති එය සිංහලයෙන් සහ දමිළ බසින් විස්තරාත්මකව කියවා ප්‍රකාශයට පත් කරන ලද්දේ 16 වැනි ග්‍රෙගරි පාප් වහන්සේ විසින් අති උතුම් වින්සන්ට් ඩො රොසයිරෝ හිමිපාණන් ටමස්සේකේ නාමධාරී සැටියටත් මුළු දිවයිනේ ම අනුරදගුරු සැටියටත් පත් කැර ඇති බව යි.

නව රදගුරු හිමිපාණෝ ඉතා සිත් ගන්නා සුලු දේශනයක් ඉක්බිත්තෙන් පැවැත්වූහ. පිළිවෙත් නිම කරමින් තුති දීමේ "ටේ ඩේයුම්" ගීතිකාව ගැයූ පසු පියතුමන්ලා සියලු දෙනා රදගුරු හිමිපාණන් වැළඳගෙන ආචාර කළෝ ය. රැස්ව සිටි සැදැහැවත්හු ද ඉමහත් ප්‍රීතියෙන් විසිර ගියෝ ය. (මෙම වාර්තාව 1838 ජනවාරි 17 වැනි දා "කලම්බු ඔබ්සර්වර්" පත්‍රයේ පල වී තිබේ)

ප්‍රථම වරට රදගුරු අබිසෙස් උළෙලක් දිවයිනේ පවත්වන ලද්දේ ද මෙම දෙව්මැඳුරේ දීම ය. මෙහි දී අභිෂේක ලද්දෝ ඔරතෝරියාන නිකායට අයත් අති උතුම් ඔරාසියෝ බෙට්ටකීනී රදගුරු හිමිපාණෝ ය. එතුමෝ පසුව යාපනය අනුපදවිය හෙවත් රදගුරු වසමේ අනුරදගුරු ලෙස වැඩබාර ගත්හ.

මෙම උත්සවය නිමිත්තෙන් මුළු නගරය ම ප්‍රීතියෙන් ඉපිල ගොස් මංගල වෙස් ගත් බව සඳහන් වන්නේ ය. එ දින පැමිණි කතෝලික මෙන් ම රෙපරමාදු විශාල ජනකාය නිසා ඇතැමුනට දෙව්මැඳුරේ ඇතුළත දැක ගන්නටවත් නො හැකි වූහ යි වාර්තා වී තිබේ.

අභිෂේක පිළිවෙත් සඳහා ප්‍රධානියා වූයේ එවකට ලංකාවේ අපෝස්තලික අනුරදගුරු අති උතුම් කජෙටානෝ ඇන්ටෝනියෝ හිමිපාණන් ය. එතුමනට සහාය වූවෝ බුරුමයේ (මියන්මාර්) අවා සහ පිගු අනුරදගුරු වසමේ ජේ. සෙරේටි රදගුරු හිමිපාණන් සහ එවකට මධ්‍යම පළාත් බාරව සිටි ඒ. රෙනෝ පියතුමන් ය.

එ වැනි ම තවත් උත්සවයක් මෙම දෙව්මැඳුරේ පවත්වනු ලැබුවේ ක්‍රි.ව. 1850 ජනවාරි 13 වැනි දා ඉරිදා ය. එය කොළඹ යුව රදගුරු වශයෙන් පත් වූ අති උතුම් ජෝසෆ් එම්. බ්‍රාවි හිමිපාණන් ගේ අභිෂේක උළෙලයි. අබිසෙස් උළෙලේ මුලසුන දරුවේ අති උතුම් කජෙටානෝ ඇන්ටෝනියෝ රදගුරු හිමිපාණන් ය. බ්‍රාවි රදගුරු හිමි සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන නිකායට (සෙ.බෙ.නි.) අයත් පියතුමෙකි.

කොටහේනේ මෙම දෙවැනි දෙව්මැඳුරු ගොඩනැගිල්ල ඉතිහාසගතව සමාප්තියට පත්විය. දුර දැක්මෙන් යුතුව, දිවයිනේ කතෝලික අභිවෘද්ධියේ අනාගතය බලා අභිමානවත් ගෙ ාඩනැගිල්ලක් ඉදි කිරීමේ වැදගත්කම පෙනී ග ියේ සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන නිකායේ අති උතුම් හිලේරියන් සිල්ලානි රදගුරු හිමිපාණන්ට යි. එතුමා ඉතා වියත්, ක්‍රියාශූර පුද්ගලයකු විය. රෝමයේ දීප්තිමත් අනාගතයක් තිබියදීත් ඒ සියල්ල ප්‍රතික්ෂේප කොට එතුමෝ ධර්ම දූත සේවාව සඳහා දිවයිනට පැමිණියෝ ය. කලක් මීගමු වැල්ල වීථියේ ද සේවා කළ පසු උන්වහන්සේ රදගුරු තනතුරට ඔසවන ලදි. මේ සඳහා අවශ්‍යතාව ඇතිවූයේ ක්‍රි.ව. 1860 දී බ්‍රාවි රදගුරු හිමිපාණන් හදිසියේ ස්වර්ගස්ථ වීම යි.

ක්‍රි.ව. 1873 අගෝස්තු මස 18 වැනි දින පැරැණි දෙව්මැඳුරු ගොඩනැගිල්ල ඉවත් කිරීමේ කටයුතු ආරම්භ විය. මේ කටයුත්ත සඳහා අලුත්කූරු කෝරළේ ජනතාව විශාල සහයක් දැක් වූ බව වාර්තා ගත යි. මෙමම ශ්‍රම සහාය විශේෂයෙන් දක්වන ලද්දේ අලුත් හෙවත් තුන් වැනි දෙව්මැඳුරු ගොඩනැගිල්ල සඳහා අත්තිවාරම් කැපීමට යි. මේ සඳහා ප්‍රබල සහයෝගයක් ලැබී ඇත්තේ නාගොඩ ජනතාවගෙන් ය. එය ඇගැයීමක් ලෙස පැරැණි දෙව්මැඳුරෙන් ගලවන ලද අල්තාරය පිටුපස බිත්තිය වසා තිබූ විසිතුරු තිරය හෙවත් ඊර්ඩෝස් තිරය නාගොඩ දෙව්මැඳුරට තිළිණ කරන ලදි. මෙම ලී තිරය විශාල පරිශ්‍රමයක් දරා ප්‍රවාහනයකොට ගෙනැවිත් ඔහු නාගොඩ දෙව්මැඳුරේ සවි කළෝ ය. මෙය නාගොඩ ජනතාව ලද වටිනා කලා වස්තුවක් බව කිව යුතුයි.

**(මෙම ලිපිය සඳහා ඉහත සඳහන් මූලාශ්‍රයන් ගෙන් මෙන් ම ඩී. ජේ. බී. කුරුප්පු - ජුබිලි) ප්‍රකාශනයෙන් ද ලබාගත් බව කෘතඥව සඳහන් කරමි)**

කලා සංග්‍රහය

# පන්තිස් වස සපිරූ උඳුවප් මිහිර

1970 දශකය මැද භාගයේ කළුතර කලමුල්ල මීසම් සේවක ලෙස කටයුතු කළ ගරු අර්නස්ට් පෝරුතොට පියතුමා ජාතික කතෝලික සිනමා පර්ෂදයේ ද අධ්‍යක්ෂ වරයා විය. කලාවට ලැදි අය එකතු කර ගෙන රටට දැයට වැඩක් කළ යුතුය යන අදහසේ පිහිටා සිටි එතුමා සෙවණේ නිතර ගුරු හරුකම් ලද යෞවනයන් අතර ශිරාන් මෛත්‍රී හා මැක්ෂිමස් රෝයි පෙරේරා ද වූහ.

'සිතැගි' නමින් සඟරාවක් කලමුල්ලෙන් බිහිවූයේ මේ යෞවනයන් දෙදෙනා අතිනි. එහෙත් කලාප දෙකකින් එම සඟරාව නතර වු ව ද ශිරාන් හා රෝයි තමන් ඉදිරියට තැබූ පය ආපස්සට ගන්නට කැමති වූයේ නැත. 1976 දී 'උඳුවප් මිහිර' නමින් ඔවුන් දෙදෙනාගේ සංස්කාරකත්වයෙන් හා ගරු පෝරුතොට පියතුමාගේ අනුශාසකත්වයෙන් අලුතින් නත්තල් සඟරාවක් බිහිවූයේ ඒ අනුවය.

ගරු පෝරුතොට පියතුමා මුල්ම රු. 100 පරිත්‍යාග කළේය. ඒ අනුව තව බොහෝ දෙනෙක් ආධාර කළහ. ජෝන් ගිල්බට් සහෝදරතුමා පිටකවරය සඳහා භක්ති ප්‍රබෝධනය බ්ලොක් එකක් ලබාදීමට තරම් පරිත්‍යාගශීලි විය. අතලොස්සක් වූ නියෝජිතයන් හා ආධාරකරුවන් නිසා එදා 1976 බිහිවූ උඳුවප් මිහිර අද 35 වන සාඩම්බර වසරට පා තබා තිබේ. උඳුවප් මිහිර තවත් සම්ප්‍රදායි නත්තල් කලාපයක් වූයේ නැත. මා 'සාම මිහිර' සංස්කරණය කළ අවධියේ අප සඟරා දෙක අතර ඉතා සමීප සබඳතා විය. ඇතැම්විට ඉඩකඩ ඇති හැකි විට අපි ලිපි නිර්මාණ පවා හුවමාරු කර ගෙන පළ කළෙමු.

මුලින් සඟරා 250 කින් ආරම්භ වූ උඳුවප් මිහිර අද රට පුරා බෙදා හරින ප්‍රබල නත්තල් වාර්ෂිකයක් බවට පත්වී තිබේ. නත්තල් මිහිරියාව ගැන කීමට කොටු නොවී සමාජ ප්‍රශ්න, සහා නවෝදය සඳහා යෝජනා, සාකච්ඡා කරන වේදිකාවක් බවට පත්වූ උඳුවප් මිහිර විශේෂයෙන් පාසල් සිසුන්ට රචනා හා චිත්‍ර නිර්මාණය සඳහා ලබාදුන් අනුග්‍රහය ද අගය කළ යුතුය.

උඳුවප් මිහිර රජත ජයන්තිය යෙදුනේ 2001 වසරේ දී ය. එවකට කොළඹ අගරදගුරු පදවිය හෙබවූ අති උතුම් නිකලස් මාකස් ප්‍රනාන්දු හිමිපාණෝ රජත ජයන්ති කලඹට අනුශාසනයක් සපයමින් කිතු සමිඳාණන් මේ ලෝකය පාපයෙන් මුදා ගැනීමේ විමුක්තිය මෙහෙවර සඳහා දේවත්වයෙන් මිනිසියාව වැළඳ ගැනීමේ උත්සවය සමරන නත්තල තුළින් ප්‍රේමයේ සුපුවත පතළ කිරීමට මෙවැනි නත්තල් සඟරා වලට කළ හැකි මෙහෙවර අපමණ බව සඳහන් කළහ. පසුගිය තිස් පස් වසර දෙස ආපසු හැරී බලන විට උඳුවප් මිහිර එම අරමුණ හරිහැටි වටහා ගෙන ඒ වෙනුවෙන් වැයවූ බව පැහැදිලිය.

උඳුවප් මිහිර බඳු නත්තල් කලාප බිහිවී පවත්වා ගෙන යන්නේ ශිරාන් - රෝයි වැනි ගිහියන් රාජ්‍ය මට්ටමින් හෝ සභා මට්ටමින් සැලකිය යුතු අනුග්‍රහයක් ලබමින් නොවේ. එබැවින් මෙවැනි නත්තල් කලාප රැක ගැනීමේ වගකීම ජනවන්දනා අංශ වල මෙන්ම ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුවේද වගකීමක් ලෙස අපි දකිමු. උඳුවප් මිහිරට චිරං ජයතු!

**කැලිස්ටස් ජයමාන්න**




# 2012 වසරට මුද්‍රාංකණ සතිය කමිටුවෙන් යෝජනා මාලාවක්!

පොත් ලිවීමේ සතිඅන්ත වැඩමුළු මාලාවක් සංවිධානය කිරීම, කතෝලික ලේඛක ලේඛිකාවන් ලියා ඇති පොත් ප්‍රකාශයට පත් කිරීම, වියපත් සහ රෝගී කතෝලික ලේඛක ලේඛිකාවන් සඳහා විධිමත් සුබ සාධක වැඩපිළිවෙලක් දියත් කිරීම, යොවුන් හා ළමා ලේඛක වැඩමුළු විධිමත්ව සංවිධානය කිරීම ඇතුළු යෝජනා මාලාවක් පසුගිය දා කොළඹ අගරදගුරු පදවි ජනසංනිවේදන කේන්ද්‍රයේ මුද්‍රාංකණ සතිය රැස්වීමේදී ඉදිරිපත් විය.

ජාතික කතෝලික ජනසංනිවේදන අධ්‍යක්ෂ හා ජාතික කතෝලික ලේඛක හවුලේ අනුශාසක ගරු බෙනඩික් ජෝශප් පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් මෙම රැස්වීම පැවැත්විණි. පසුගිය වසරේ කලකට පසුව පැවැති අගරදගුරු පදවි මුද්‍රාංකණ සතියේ අත්දැකීම් පුළුල්ව සාකච්ඡාවට බඳුන් වූ අතර එහි දී මතු වු බාධක මඟහරවාගෙන වඩාත් සාර්ථකව ලබන වසරේ දී "මුද්‍රාංකණ සතිය" සංවිධානය කිරිමට මෙහිදී තීරණය විය.

"ඥානාර්ථ ප්‍රදීපය" සංස්කාරක ගරු සාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා කතෝලික ලේඛක - ලේඛිකාවන් රටේ කාලීන ප්‍රශ්න ගැන මාධ්‍ය මගින් හෙළිකිරීමට හා විමසුමට ලක්කිරීමට මීට වඩා උනන්දුවක් දැක්වීම අත්‍යාවශ්‍ය බව අවධාරණය කළේය.

මෙම කටයුතු සඳහා තරුණ පිරිස් අවතීර්ණ කර ගැනීමේ වැදගත්කම මෙහි දී පෙන්වා දුන් ගරු බෙනඩික් ජෝශප් පියතුමා "ඥානාර්ථ ප්‍රදීපය" කවදත් අප සමඟ සිටීම ශක්තියක් බවත්. "ළමා ප්‍රදීපය" සහය සංස්කාරක කුමර නයනජිත් මහතා ද, ජාතික කතෝලික ලේඛක හවුල ද පවත්වාගෙන යන ළමා ලේඛක වැඩමුළු වැඩ පිළිවෙල අගය කරන බවත් අවධාරණය කළේය.

ගරු ඇන්ටන් ජයනන්ද පියතුමා ද, මොරිස් බොල්ලෑගල, පීටර් කැනියුට් පෙරේරා, සිරිල් එඩේරමුල්ල, ශිරාන් මෛත්‍රී. මැක්ෂිමස් රෝයි පෙරේරා, බර්ට්‍රම් ප්‍රනාන්දු, ලෙනාඩ් උදය හපුආරච්චි යන මහත්වරු ඇතුළු කීපදෙනෙක්ම මෙහිදී අදහස් දැක්වූහ.

**සී. ආර්. ඩික්සන් ඇන්ටනි**

# "සාම මිහිර" 53 කලාපය දොරට වඩී



පුරා වසර 53 ක් "සාම මිහිර" නත්තල් සඟරාව ගෙන එම ගැන නිර්මාතෘ රිචඩ් වසන්ත කුමාරයන්ගේ දරුවන්ට තුති පිදිය යුතුයි. නත්තලට වෙනත් අර්ථකථන නෑ. "නත්තල්" නත්තල හැටියටම සැළකිය යුතුයි. නත්තල් ජාතික තලයේ ජනකොටස් ඒකරාශී කරන, එකමුතු රකන උතුම් අවස්ථාවක් එයින් සාමයේ සහ මිහිරියාවේ අධ්‍යාත්මික පණිවුඩයක් ගෙන යා යුතුයි. "සාම මිහිර" සඟරාවේ අගය "නත්තල" නත්තල හැටියටම නිර්වචනය කිරීමයි. නත්තල දරුවන්ගේ, වැඩිහිටියන්ගේ හා සමස්ත පවුලේම මංගල්‍යයි."

"ඥානාර්ථ ප්‍රදීපය" සංස්කාරක ගරු සාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා එසේ පල කළේ පසුගියදා රාගම, තේවත්ත සා. ජෝශප් පෙර පාසල් ශ්‍රවණාගාරයේ දී පැවැති "සාම මිහිර" නත්තල් සඟරාව 53 වන වරටත් දොරට වැඩීමේ උලෙළේ ප්‍රධානත්වය ගනිමිනි. ගරු ප්‍රිය ජයමාන්න පියතුමා හා පැවිදි සොහොයුරියන් කීපදෙනෙක් ඇතුළු විශාල ගිහි පිරිසක් මීට හවුල් වූහ. "සාම මිහිර" සංස්කාරක ඇන්තනි ජයලත් මහතා ගරු සාන්ත සාගර පියතුමාට මුල්ම කලාපය පිළිගන්වන ලදි. සංවිධායක ජයන්ත ශ්‍රී පද්මකුමාර මහතා ප්‍රමුඛ පිරිස උලෙළ මනාව සංවිධානය කර තිබුණි.

**ඩී. ආර්. ඩික්සන් ඇන්ටනි**
**ඇන්ටන් ජයසූරිය**

ෆිලීෂන් අබයකෝන්ගේ

## සුබස 191

## ක්‍රිස්තු ජයන්තිය

ප්‍රැන්සිස් කටුකොලිහයන්ගේ ගුණසේන දෙමළ - සිංහල ශබ්ද කෝෂයේ ජයන්ති සඳහා ජන්මෝත්සවය සඳහන්ය. මදුරාසියේ මුද්‍රිත "ක්‍රියාවින් තර්කාලත් තමිල් අකරාදි නම් දමිළ ශබ්දකෝෂයේ ජයන්ති යනු සමහර දෙවිවරුන්ගේත් ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ගේත් උපන් උලෙළ යයි පහදමින් උදාහරණ ලෙස ක්‍රිෂ්ණ ජයන්ති හා ගාන්ධි ජයන්ති දක්වයි. ඩේලිනිවුස් පත්‍රයට හින්දු සමය ගැන නිතර ලියන චෙල්වතම්බි මාණික්කවාසගර් සූරිහු ක්‍රිෂ්ණ ජයන්ති ගැන කරන විස්තරයක ක්‍රිෂ්ණ දෙවියන් ලෝ පහළ වූ කල දර්ශනය වූ තාරකාමණ්ඩලය CONSTELLATION ජයන්ති නමින් හැඳින්වෙන බව පවසති. මා සතු ඉන්දියානු දින දර්ශනය'ක ගාන්ධි ජයන්තියත්, බුද්ධ ජයන්තියත් (වෙසක් දිනය), ජෛන ආගම් කතුවර මහාවීර ජයන්තියත් නිවාඩු දින ලෙස දක්වයි. මේවා ජන්ම අනුස්මරණයි. සීක් ආගමික කර්තෘ තුමන්ගේත් ක්‍රිස්තු ස්වාමිදරුවන්ගේත් උපන් දිනවලට ජයන්තිය නොයෙදුණේ ජයන්ති හින්දුන්ට පාරිශුද්ධ වදනක් නිසා විය යුතුය. හින්දු සහෝදරත්වය තුළ බෞද්ධයන්ටත්, ජෛනයන්ටත් වෙසෙස් සැලකිලි ලැබෙන අවස්ථා එමටය.

රජයේ සිංහල මහා ශබ්දකෝෂයේ ජයන්තිය ගැන ඇති සටහන සාමාන්‍ය ජනතාව දරන පටු අදහස්මය. 2500 බුද්ධ ජයන්තිය සමඟ 1956 දී ජයන්තිය පොදු වහරට එක්විය. මහාල් (මාලිගාව), සමාධි (සොහොන් ගැබ), සූරී, සමිති, මේලා, සම්මේලන මෙන් හෙළ බසේ ජයන්තිය හින්දි අනුකරණයකි. ඉන්ද්‍ර දෙවියන්ගේ හා ඉන්ද්‍රාණියගේ දූ පුතුන් වන ජයන්තත් (දිනන්නා) ජයන්තිත් (දිනන්නී) මීට සම්බන්ධ නොවෙති.


මෙලෙස නුඹලා පණස්වන අවුරුද්ද වෙන්කොට මුළු දේශය පුරා එහි සිටින සියල්ලන්ට නිදහස දීම ගැන ප්‍රකාශයක් කළ යුතුය. එම අවුරුද්ද ජුබිලියක් නිසා සැම කෙනකුම මිලදී ගත් සියල්ල පළමු හිමිකරුට හෝ ඔහුගේ පැවතෙන්නන්ට හෝ ආපසු දිය යුතුය. (ලෙවී 25:10) ජුදා සම්ප්‍රදාය අනුව යමින් සාන්ත සභාව ක්‍රි.ව. 1300 සිට ජුබිලි හෙවත් ශුද්ධ වූ වර්ෂය පවත්වයි. අවුරුදු 100 සිට 50,35,25 දක්වා එය කෙමෙන් අඩුවිය. චිරාගත චාරිත්‍ර අනුව ගම්භීරාලංකාරයෙන් සුදුතුම් පියාණෝ ම ජුබිලි වර්ෂයට මුල පුරති. ක්ෂමාව හා මනස්තාපය මුලිකවීම ශුද්ධවූ වර්ෂයක් ලෙස හැඳින්වීමට හේතුවකි. 1550 පෘතුගීසි කාලයේ කොළඹ පැවති ජුබිලි වර්ෂය ලේඛනගත වී ඇත. ජුබිලිය දැන් පොදු වහරින් අහක් වෙද්දී කිසිවක් හෝ කිසිවකු හෝ නිමිතිකොට කාලභේද රහිතව ජයන්ති පිට ජයන්ති වැළ නොකැඩී එයි. මීසමක එක සමිතියක ජයන්තිය නිමි සැණින් තවත් සමිතියක ජයන්තියකි. මරණවලට නැතත් මරණාධාර සංගම්වලට ජයන්ති ඇත.

හින්දු සමයෙහි භාවිත වන නමෝ. ආත්ම, මෝකෂ, ධ්‍යාන, වේද වැනි වදන් කිතුනු වහරේ ද දැකිය හැකිය. ජයන්තිත් කිතුනු වහරට පිවිසීමට වාරණයක් නැත. නත්තල් පෘතුගීසි බසින් උපත යනුයි. දෙසැම්බර් 25 උත්පත්ති උත්සවයට ක්‍රිස්තු ජයන්ති නාමය පිරිනැමුම දේවාතිදේව ක්‍රිස්තුස්වාමිදරුවනට නමස්කාරයකි.

# හලාවතින් මාධ්‍ය සංවිධානයක්

පුත්තලම් දිස්ත්‍රික්කයේ සමාජ සත්කාර්ය වඩා වඩාත් වැඩිදියුණු කිරීම සඳහා මාධ්‍ය සංවිධානයක් හලාවතින් බිහිවිය. පුත්තලම් දිස්ත්‍රික්කය කේන්ද්‍රකොට ගෙන හලාවත ජාතික තරුණ සේවා සභාවේදි පැවැති මාධ්‍ය හමුවකදී නව කැදවුම්කරු ලෙස පර්සි ප්‍රනාන්දු (ප්‍රදීපය) ලේකම් අමිල බුද්ධික (දිවයින) භාණ්ඩාගාරික කමල්ප්‍රියංකර (දිවයින) තේරී පත්විය.

ගණන් පරික්ෂක ජූඩ් විජේතුංග (ලක්බිම) අධ්‍යක්ෂ රෙක්සි හැරිසන් (දිවයින) ස්ටැන්ලි පතිරාජ (දිවයින) එච්. එම්. කාසිම් (තිනකුරල්) ක්‍රිස්ටි ප්‍රනාන්දු (ඩේලි නිව්ස්) ඒ. යු. ගුණපාල (ලක්බිම) ප්‍රියංගරංගාර්ව (දිවයින) අනුශාසකවරුන් ලෙස හලාවත ශ්‍රී විජයරාමාධිපති හා වයඹ පලාතේ ප්‍රධාන සංඝනායක ශාස්ත්‍රවේදි නාත්තන්ඩියේ සිරි නිවාස හිමි, හලාවත රදගුරු අති උතුම් දෙවිශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමි හා ප්‍රවීන මාධ්‍යවේදි ක්‍රිස්නිල් බෙනඩික් ප්‍රනාන්දු මහතා පත්වූහ. **පර්සි ප්‍රනාන්දු**



*රුක්මණී දේවි අනුස්මරණ සංගමය මගින් 23 වන වරටත් සංවිධානය කරන ලද ඇගේ ආත්මයට මොක්සුව පතා පැවැත්වූ දිව්‍ය පූජාව රාවතාවත්ත සුරතාවියන්ගේ රාජේශ්වරී දේවස්ථානයේ දී විල්ලෝරාවත්ත මීසම් සේවක ගරු ටෝනි පින්ටෝ පියතුමන් විසින් පවත්වන ලදි. කන්තාරු ගී ගායිකා සිරිමා ඇනස්ටා මර්සලින් සහ කන්තාරු ගී ගායක ඇන්ටන් වේවැල්දෙනිය විශ්වාසිකයන්ගේ යාච්ඤාව ඉදිරිපත් කළ අයුරු.*

**හෙන්රි ප්‍රියශාන්ත මෙන්දිස්**

153

ගරු තිලකසිරි ප්‍රනාන්දු
පැ.තු.නි සොයුරු




| | |
|---|---|
| ගිගිරි ගිගිරි ගිගිරි වලලු සර සර ගා | වැනේ |
| ටිකිරි ටිකිරි ටිකිරි මුකුළු ජර මර නෑ | වගේ |
| කැකිරි කැකිරි කැකිරි පලපු සහකාරිගෙ | අගේ |
| වැඳිරි වැඳිරි වැඳිරි වගේ දැන් දැක්කම | නගේ |
| වද හිංසා කළා මිදි ද අවුරුදු හත | අටක් |
| දැන් වත් මා දමා යන්න කිව්වට නෑ | වගක් |
| මේ විදියට වද දුන්නම ඇත්තට නෑ | සැපක් |
| එපා තවත් මට තලන්න සිරලික් මම | මවක් |

**ගායනය : සඳ (ලංකා)වේ (අම්මා)න්**

# සම්මාන පිට සම්මාන දිනු කිතුනු කලාකාරිය

වග වැලිකන්න 217/2 හි පදිංචි රීටා චාලට් වැලිවිට මහත්මිය කලාවේ විවිධ ඉසව් ඔස්සේ දස්කම් පාන කලාකාරිනියකි. සාහිත්‍ය පැහැරණිය උලෙළේ දී සීතාවක භූෂණ සම්මානයෙන් පිදුම් ලද ඇය විරිදු ගායනයෙන් පද්‍ය හා ගද්‍ය රචනයෙන් ඉහළ කුසලතා පළකරන්නීය.

ඥානාර්ථ ප්‍රදීපය පුවත්පතෙන් ලේඛන කලාවට අත්පොත් තැබූ ඇය 1968 වසරේ ප්‍රකට මරිය භටයකු වූ සිබෙල් වැලිවිට මහතා හා විවාහව ගුරු පුතුන් දෙදෙනකු හා ඉංජිනේරුවකුගේ දෙමාපියන් වීමේ වරම ලබා ඇත. සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමගි කලා සංසදයේ කාරක සභිකාවක වන රීටා චාලට් මහත්මිය තරග ගණනාවකින් ජයග්‍රහණ ලබා සිටින්නීය. ඇයට ප්‍රදීප සුපැතුම්!



**මෛත්‍රී**

බැසිල් ෆොන්සේකා විසිනි

# තෙරේසා මව මෙන් සැමදෙනා තමන් දානය කළ යුතුයි



"අන් අයගේ යහපත සඳහා සිය නොතිත් සේවය ලබා දීමෙන් පමණක් දිගුකාලීන සංතුෂ්ටිය අත් දකිනු ඇත." කල්කටා හිදී, මෙලෙස ප්‍රකාශ කළේ දලයි ලාමා තුමාය. භාග්‍යවන්ත තෙරේසා මව් තුමිය ගැන මහරු දේශනයක් කරමින් එතුමිය මෙන් ජනතා සේවයට කැප වන ලෙස ද එතුමා සියල්ලන්ට ආරාධනා කළේය.

ආත්මාර්ථකාමී චින්තනයෙන් බැහැර කරමින් උණුසුම් හා නිදහස් මනසකින් පමණක් කැපවීමෙන් ජනතා සේවය කළ හැකි බැව් ඔහු විසින් තව දුරටත් සනිටුහන් කරනු ලැබීය. "සියලු ආගම් මගින් උගන්වනු ලබන දයාව, කරුණාව, ප්‍රේමය හා මෛත්‍රිය සිය ජීවිතය තුළින් විදහා දක්වමින් විශේෂයෙන් දිළිඳු හා අසරණ ජනතාවන් සුවපත් කිරීමේ ආදර්ශය භාග්‍යවන්ත තෙරේසා මව් තුමිය විසින් ලොවට දායාද කැරුණු බැව් ද ඔහු අවධාරණය කළේය. ජේසුස් වහන්සේ සිය දිවියෙන් සපථ කළ දයා ප්‍රේමය තෙරේසා මව විසින් ලෝකය වෙත පරමාදර්ශයක් ලෙසින් ත්‍යාග කර ඇති බැව් ද ප්‍රකාශ කැරිණි. "තෙරේසා මව් තුමිය අද ජීවතුන් අතර නොමැති වූව ත් ඇගේ අමරණීය ස්ප්‍රීතුව ලොව පුරා පවතී. දිළිඳුන්ගේ සේවය සඳහා කැප වූ සියලුදෙනා එතුමියගේ ස්ප්‍රීතුවේ බලය හා ජවය තුළ ක්‍රියා කරනා බැව් ලෝකයේ නන් දෙසින් වාර්තා වේ. "ඔහුගේ එම සත්‍යයේ සිතුවිල්ල එලෙසින් ප්‍රකාශ විණි." තෙරේසා මව, මොහන්දාස් ගාන්ධි, මාර්ටින් ලූතර් කිං සහ දලයිලාමා යන අපෝස්තුළුවරුන් පවෙන් පිරි ලෝකයට අදටත් අවශ්‍යයයි." දේශණයට සහභාගි වූ දකුනු බෙන්ගාලයේ ආණ්ඩුකාර වරයා එලෙස පැවැසුවේය. මෙම කතිකාවත කැඳවා තිබුණේ භාරතයේ සුපතළ චිත්‍ර ශිල්පිනී සුනීතා කුමාරි විසිණි.


# චීනයේ නව රදගුරු හිමි ශුද්ධෝත්තම පිය අවසරයෙන්

පසුගිය නොවැම්බර් මස 30 වැනි දා චීනයේ රදගුරු හිමිවරු පස් නමක් පීටර් ලූ ෂූගාන්ග් පියතුමාගේ හිස මත අත් තබා චීනයේ දක්ෂිණ භාගයේ සිබිං හි රදගුරු හිමිපාණන් ලෙසින් පත් කළහ.

මෙම අවස්ථාවට දහසක් පමණ කතෝලිකයෝ ද, පූජකවරු 61 ක් ද කන්‍යා සොහොයුරියෝ 35 ක් ද රජයේ නිළධාරීහු ද අන්‍යාග මික නියෝජිතයෝ ද සහභාගි වූ හ. දේව මෙහෙය පවත්වනු ලැබුවේ ශත වර්ෂයක් පමණ ඉපැරණි ශාන්ත මරියා ආසන දෙව් මැඳුරේය. දෙව් මැඳුරෙන් පිටස්තරව පැවැති වාතාවරණය යටතේ යම්කිසි නොසන්සුන් භාවයක් ද සහභාගි වූවන් අතර පැවැතිනි. පොලිස් නිළධාරීන් කණ්ඩායමක් ද ආරක්ෂක භටයෝ ද පොලිස් සුනඛයෝ ද සීරුවෙන් සිටියෝය. රදගුරු ආසිරි ගැන්වීමේ මෙහෙයට පැමිණි සියලු දෙනා පැය තුනකට කලින් පැමිණීම අනිවාර්ය කර තිබිණි. සහභාගි වූ කිසිවෙකුට ජංගම දුරකථන ද කැමරා ද ඇතුළට ගෙන යාමට අවසර නොලැබිණි. එකිනෙකා පෞද්ගලිකව ද ඇඩි ශාරීරික පරික්ෂාවට පාත්‍ර කරනු ලැබීය. ශුද්ධෝත්තම පියාගේ අවසරය නොමැතිව රදගුරු පදවියට පත් කරනු ලැබූ පෝල් ලේ ෂයන් ද අවස්ථාවට සහභාගි වී සිටියේ, ඔහුගේ සහභාගීත්වය නොවිය යුතු යයි ශුද්ධාසනය විසින් නියෝගයක් දී තිබිය දී ය. නිළ අගරදගුරු හිමිවරු 4 දෙනා විසින් ද අකීකරු රදගුරු හිමියාට ඉවත් වන්නයි කියා නොමැති බැව් ද වාර්තා වේ.

නවරදගුරු හිමි ලෙසින් පත්වූ 47 හැවිරිදි පීටර් ලූ ෂූගාන්ග් හිමිපාණන් සිබිං පදවිය භාරව කටයුතු කරනු ඇත. එතුමාගේ පදවියේ කතෝලිකයෝ 30,000 ක් ද පූජක පියතුමෝ 7 නමක් ද වෙති. එතුමාගේ කෙහෙයුම් පාඨය වන්නේ "ජේසු තුමා යහපත් එඬේරා වේ" යන්නයි.

# නත්තල් ගසක් උතුරු කොරියාව ආලෝක කරයි



දකුණු කොරියාවේ කිතුනු කණ්ඩායමක් විසින් වසර ගණනාවක් මුළුලේ උතුරු හා දකුණු කොරියානු මායිමේ සුවිසල් නත්තල් ගසක් සිටුවීමට සියොල් රජයෙන් අවසර ඉල්ලා තිබුණි. මෙම නත්තලේ දී එම අවසරය ලැබී ඇත.

දෙරටේ මායිමේ එහිබොන්ග් නම් කඳු වැටි මුදුනේ මෙම නත්තල් ගස දැන් සිටුවා ඇත. නත්තල් ගස මුඳුනේ කුරුසියක් දිස් වේ. තවද දැවැන්ත නත්තල් ගස විස්තීර්ණ විදුලි ආලෝකයෙන් බබලවා ඇත. ඒ නිසාවෙන් උතුරු කොරියාවේ බොහෝ ප්‍රදේශයන් හි වෙසෙන ජනයාට එම නත්තල් ගසේ ආලෝකය නැරඹිය හැක. දෙසැම්බර් මස 31 වැනිදා දක්වා එම නත්තල් ගස දිදුළන අතර වචනයෙන් දොඩා ගන්නට බැරි සාමයේ පණිවුඩය එමගින් උතුරු කොරියානු ජනයාගේ දෙසවනට කොඳුරනු ඇතැයි කිතුනු පුවත් වාර්තා කරයි. උතුරු කොරියාවේ ආගමික නිදහසක් නොපවතී.

හොර රහසේ සිය ඇදැහිල්ල තුළ ජීවත්වීමට යත්න දරණ බොහෝ කිතුනුවන් අදටත් හිරබත් කන බැව් මේ නත්තලේ දී ද සිහි ගන්වන බැව් වාර්තා වේ.

# සමයාන්තර සුහදතා නියාමක පියතුමා පිටුවහල් කැරේ

සිරියාවේ සමයාන්තර එකමුතුව උදෙසා දශක තුනක් මුළුලේ කටයුතු කළ ඉතාලි ජාතික ජේසු නිකායේ පාවුලෝ දාල් ඔග්ලියෝ පියතුමා සිරියානු රජය විසින් පසුගිය සතියේ රටින් පිටුවහල් කොට තිබේ.

වසර 30 ක් සිරියාවේ ජීවත් වූ එතුමා සිය ආශ්‍රාමයේ ජන කණ්ඩායම සමඟ හෘද සාක්ෂියේ හා ඇදැහීමේ නිදහස තුළින් ප්‍රජාතන්ත්‍රවාදී පැවැත්මකට යා හැකි ආකාරය පිළිබඳව ජනතාව දැනුවත් කළේය. එමෙන්ම සිරියාවේ වර්තමානයේ පවත්නා අර්බුදකාරී තත්ත්වය ගැන බොහෝ දුරට රජය වගකිව යුතු බැව් ද ප්‍රසිද්ධියේ ප්‍රකාශ කොට තිබේ. එම නිසාවෙන් එතුමා රජයට එරෙහිව සටන්කාමීන්ට අනුබල දෙන බවට ද එතුමාට චෝදනා කරති. එහෙත් ජනතා යහපත සඳහා පාවුලෝ පියතුමාගේ දිවිය මහෝපකාරී වූ බැව් මුස්ලිම් හා කිතුනු ජන කොටස් එකහෙලා පවසති. තමා සිරියාවෙන් පිටුවහල් කරනු ලැබුවත් සමයාන්තර එකමුතුව සඳහා තමා ගෙනයන ක්‍රියාදාමය තව තවත් ඉදිරියට ගෙන යන බැව් ද සපථ කළේය.

# දාරක සරණය නත්තල අවධාරණය කරයි



"මේ දරුවා කෙබඳු කෙනෙක් වේ ද? යන්න ස්නාවක ජුවාම් තුමාගේ උපතේ දී හිත මිත්‍රාදීන් ඇසූ ප්‍රශ්නයකි. ජේසු තුමා උපන් රාත්‍රියේ දී ද එවැනිම සිතුවිල්ලක් මරි මව්ගේ හිත් තුළ ඇති වූ වා ට සැක නැත. අදත් දරුවෙකු උපන් විට එවැනි ප්‍රශ්න නැගෙනවාට සැක නැත.

හැම නව උපතක් තුළම එවැනි බලාපොරොත්තු මෙන්ම සංකාවන් ද පහළ වන බැව් සත්‍යයි." මෙම අදහස් ද්වාරය විවර කළේ ශුද්ධාසනයේ ප්‍රවෘත්ති අංශය භාර ජේසු නිකායික ෆෙඩ්‍රිකෝ ලොම්බාර්ඩි පියතුමාය. පසුගිය සති කීපයකට ඉහතදී XVI වැනි බෙනඩික්ට් සුද්ධෝත්තම පියා අප්‍රිකාවට සැපත් වූ අවස්ථාවේ දී කුඩා දරුවන් රංචු පිටින් ප්‍රීති සෝෂා කළ ආකාරය එතුමා ප්‍රකාශ කළේය. අප්‍රිකාවේ දරුවන් පිළිබඳ අත්දැකීම් ද සහිතව සුද්ධෝත්තම පියා විසින් "දාරක සරණය" පිළිබඳ ලේඛණයක් ප්‍රකාශයට පමුණුවා ඇත. එම ලේඛණයේ, ලෝකය පුරා අන්ත අප්‍රමාණ දුක් පීඩා විඳින ලක්ෂ සංඛ්‍යාත අංග විකල දරුවන් ද දෙමාපියන් අහිමි දරුවන් ද, වීථි දරුවන් ද, තප්පරයක් තප්පරයක් පාසා මියැදෙන කුසගිණි දරුවැන් ද බලයෙන් යුධ වද්දා ඇති දරුවැන් ද, බැලමෙහෙවරේ යොදවා ඇති දරුවන් ද බලාපොරොත්තුවේ සේයාවක් හෝ අත් නොදකින දරුවන් ද ගැන මෙම නත්තලේ දී අවධිව ක්‍රියා කරනා ලෙසට සුද්ධෝත්තම පියා විසින් ඉල්ලා සිටිනා බැව් ද අවධාරණය කළේය.

කතෝලික සභාව විසින් ලෝකය පුරා පිහිටුවා ඇති පරෝපකාර ආයතන 1,25,000 කින් 20,000 දහක්ම දාරක සරණය සඳහා බව ද මතක් කර දී ඇත. මෙම දාරක සරණය වෙනුවෙන් ජීවිත පූජාවෙන් ලෝ පුරා සේවය කරන්නාවූ ගිහි පැවිදි කාන්තාවන් ද විශාල පිරිසක් වෙති. ඔවුන් සමඟ යැදුමෙන් දයා ක්‍රියාවෙන් එකමුතු වෙමින් අප අවට පීඩා විඳින දරු දැරියන්ට කිතු උපත තුළ නව උපතක් අත්දැකීමට සරන වන ලෙසට මේ නත්තල යළිත් අපට ආරාධනා කරනා බැව් සුද්ධෝත්තම පියා අවධාරණය කරයි.

# නැටෝ ප්‍රහාරයට එරෙහිව පකිස්තාන කතෝලිකයෝ හඬ නගති

කිසිසේත්ම බලාපොරොත්තු නොවූ ආකාරයට, නැටෝ සංවිධානය විසින් එල්ල කළ ගුවන් පහරදීමෙන් එවෙලේ ආයුධ නොදරා සිටි පකිස්තාන භටයෝ 24 දෙනෙක් මරණයට පත් වූහ. ඇමෙරිකා එක්සත් ජනපදය විසින් එම පහරදීම පිළිබඳව අතිශය ශෝකය පළ කර ඇතත්, පකිස්තානය දැඩි කනස්සල්ලටත් ඇමෙරිකානු ක්‍රියා කලාපය ගැන කළ කිරීමටත් පත්ව ඇත.

දැඩි විරෝධය ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරනු ලබන ජනතාව හා කතෝලික සංඝය ද අතිනත් ගෙන සිටී. ජාතික ධජයද විරෝධතා ප්‍රකාශයන් ද රැගත් කතෝලිකයෝ කෑ මොර දෙමින් වීදි ඔස්සේ ගමන් කළහ. එම විරෝධතා පා ගමනට පූජකවරු ද පැවිදි සහෝදර සහෝදරියෝ ද කතෝලික සංගම් ගිහි නායකයෝ ද ඇදැහිළි වන්තයෝ ද සහභාගි වූහ. එම වීරෝධතා පා ගමන පකිස්තානයේ සාමය හා සාධාරණය පිළිබඳ ජාතික කොමිෂන් සභාව විසින් සංවිධානය කර තිබිණි. මේ විරෝධතා පා ගමනේ දී පකිස්තානයේ රහස් ස්ථානයන් හි පවත්නා ඇමෙරිකානු ගුවන් කඳවුරු ඉවත් කර ගන්නා ලෙසට පා ගමනේ යෙදුනු කතෝලිකයෝ කෑ මොර දුන්හ.

තව ද ඇෆ්ගනිස්ථානය පිළිබඳ ප්‍රශ්න නිරාකරණය කර ගැනීම සඳහා ඇමෙරිකාව විසින් කැඳවා ඇති සැසි වාරයට සහභාගි නොවිය යුතු යයි ද පෙළපාලි කරුවෝ ප්‍රකාශ කළහ. "අපි අපේ ආරක්ෂක භටයින්ට සහයෝගය ලබා දෙනවා. එපමණක් නොවේ, අපේ දේශය වෙනුවෙන් ඕනෑම පරිත්‍යාගයක් කිරීමට වු ව ද අපි සූදානම්." මෙලෙස පැවැසුවේ "සමයාන්තර එකමුතුව" යන සංවිධානයේ මහලේකම් තෝමස් ගුල්ෆාම් පියතුමාය. පසුගිය කාල පරාසය තුළ දී පකිස්තානයේ අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් 30,000 කට අධික පිරිසක් ජීවිතයෙන් වන්දි ගෙවා ඇත.

# බයිබලයක් තුබූ ඉන්දීය ගුරුවරයා මාලදිවයිනෙන් පන්නා දැමේ

සති කීපයකට ඉහත දී මාලදිවයිනේ පොලීසියට ලැබුණු තොරතුරක් මත ඉන්දියානු ජාතික කතෝලිකයකු වූ 30 හැවිරිදි ෂිජෝ කොක්කන්ද නම් ගුරුවරායගේ නිවස පරික්ෂා කරනු ලැබීය. එම ගෙය තුළ තුබූ බයිබලය හා ජපමාලය පොලීසිය විසින් සොයා ගන්නා ලදී. ඉස්ලාම් රාජ්‍යයක් වන මාලදිවයිනේ කිතු දහම හඳුන්වා දීමට යත්න දැරීම පිළිබඳ චෝදනා යටතේ ඔහු සිරභාරයට ගන්නා ලදී. තවද ඔහුගේ පරිඝණකය පරික්ෂා කිරීමේ දී කතෝලික ගී ද දේවමාතා පින්තූර ද එහි වූ බැව් සොයා ගනු ලැබීය.

ඔහු කැපවීමෙන් ගුරු වෘත්තියේ යෙදුණු ගුරු භවතෙකු යැයි විදුහල්පති වරයාද පවසා ඇතත් බලධාරීන් ගත් තීරණය අනුව දින 15 ක් සිරභාරයේ තබා ගැනීමෙන් පසුව රජය විසින් එම ගුරුවරයා පිටුවහල් කර ඇත. පසුගිය වසරේ දී කුරුස ලකුණ ලඟ තබා ගත්තා යන චෝදනාවට තවත් ඉන්දීය ගුරු මහතෙකු මුහුදට විසි කිරීමට යත්න දරද්දී ඔහුගේ ජීවිතය යන්තම් බේරාගෙන ඇත.

පුරවැසි ජනතාව 300,000 ක් ජීවත් වන මාලදිවයින 100% සුන්නි මුස්ලිම්වරුන්ගෙන් සමන්විත ය යි ප්‍රකාශිතය. තායිලන්තය දූපත් 1790 කින් සමන්විත වන අතර ඒ හැම දූපතක්මැ ධවළ වෙරළ වලින් යුකත් බවට ප්‍රචලිතයි. එබැවින් තායිලන්තය සංචාරකයන්ගේ පාරාදීසයක් ලෙස ගැනුණත් 2008 ව්‍යවස්ථාව අනුව රටේ පුරවැසිභාවය ලබා ගත හැක්කේ මුස්ලිම් භක්තිකයෙකුට පමණය. විදේශිකයෙකුට වුවද ඉස්ලාම් විරෝධී යයි නිගමනය කළ හැකි පොතපතද පත්‍රිකා ද නවීන සංනිවේදන තාක්ෂණ මාධ්‍යයන් ද භාවිතය තහනම් වේ. ආගමික නිදහස ගැන කථා කිරීම මරනය කැඳවීමක් වනු ඇතැයි යන්න ඇතැම් සංනිවේදකයන්ගේ හා දේශපාලන නිළධාරීන්ගේ මතය වු ව ත් එසේ කිරීම භයානකයයි ද රහසේ මුමුණනු ලබයි.


විශේෂාංග

# ගරු බී. ඒ. තෝමස් නි.ම.නි. ජපමාල තාපස නිකායික නිර්මාතෘ පියතුමන්ගේ පූජාත්වර ශත සංවත්සරය

**"ශ්‍රී ලංකාවෙන් බිහිවන ප්‍රථම ශුද්ධවරයා ගරු බී. ඒ. තෝමස් පියතුමන් වීමට පුළුවන." යන්න, එතුමන්ගේ මෘතදේහයට අවසන් ගෞරව දැක්වීමට හඬමින් වැළපෙමින් පැමිණි ජනගංගාවේ එකම අදහස සහ පැතුම විය.**

ගැඹුරු විශ්වාසයකින් සහ වීරෝධාර ප්‍රේමයකින් හෙබි ජීවිතයක් ගත කළ තෝමස් පියතුමන්ගේ දිවිය තුළ එතුමන්ගේ සමකාලිනයන් දුටුවේ ශුද්ධවන්ත භාවයයි. ක්‍රිස්තියානි පරිපූර්ණත්වයේ ධර්මගුණයන්ගෙන් පොළොඹවනු ලැබූ තෝමස් පියතුමන් එතුමන්ගේ තාපස තාපසිකාවන් හට තම විශ්වාසය, ප්‍රේමය සහ බැහැපත්කම අනුගමනය කිරීමට ලබාදුන්නේ ජීවමාන කැඳවීමකි. "දෙවිඳුන්ට සමාන කවුරුන්ද" නමැති ජපමාල නිකායිකයන්ගේ උදෘත පාඨය හේතු විරහිතව ලද පාඨයක් නොව වසර 78 ක තම දිවිය පුරා දෙවිඳුන්ට නතු වූ තෝමස් පියතුමන් ජීවත් කරවන්නට උත්සාහ දැරූ පාඨයක්ම විය.

ශ්‍රී ලංකාවේ යාපනයේ පාණ්ඩියන්තාල්වු ග්‍රාමයේ සැමගේ ගෞරවයට පාත්‍ර වූ බැතිමත් පවුලකට දාව 1886 මාර්තු 07 වන දින උපත ලැබූ එතුමන් තමන් උපත ලැබූ දිනයේදී ම බෞතිස්ම ස්නාපනය ලැබූයේ ඉතාමත් දුර්වල ශරීර සෞඛ්‍යයෙන් යුතු වූ බැවිනි. එසේ වුවද දෙවිඳුන්ගේ සුරක්ෂිත දෑතින් පෝෂණය වූ එතුමන් තමන් ප්‍රාථමික අධ්‍යාපනය ලැබූ ග්‍රාමීය පාසැල තුළත් ද්විතීයික අධ්‍යාපනය ලැබූ යාපනය ශාන්ත චාල්ස් සහ ශාන්ත පැට්‍රික් විදුහල්වලත් දිදුලන තරුවක් බවට පත්වූයේ ප්‍රඥාවෙන් එතුමන් කිසිවෙකුට දෙවැනි නොවූ හෙයිනි. තම පාසැල් අධ්‍යාපනයෙන් පසු කොළඹ පදවි දෙව්සත්හල තුළදී අධ්‍යාපන ක්ෂේත්‍රයේ එතුමන් දැක් වූ දස්කම් සුවිශේෂීය. 1912 ජනවාරි මස 06 වන දින පූජාත්වරය ලැබූ එතුමන් ශාන්ත පැට්‍රික් විදුහලේ හින්දු නේවාසිකාගාරයේ අධ්‍යක්ෂ තුමන් ලෙස තම පූජක ජීවිතයේ පළමු කාල පරිච්ඡේදය කාල වකවානුව තුළ දී, ධර්මදූතික සේවය සඳහා ශ්‍රී ලංකාවේ හා ඉන්දියාවේ ජනතාවගේ සිත් හැරීම වෙනුවෙන් යාගික වන්නාවූ දේශීය භාවනා යෝගී තාපස නිකායක් පිහිටුවීමට වූ අභ්‍යන්තර පෙළඹවීම එතුමන්ට ඇඩි සේ දැනෙන්නට විය. යාපනය රදගුරු අති උතුම් ගියෝමාර් හිමිපාණන්ගෙන් ලැබුණු ධෛර්යය සහ පෙළඹවීම එතුමන් තුළ වූ එම හැඟීම තීව්‍ර කරන්නට සමත් විය. එකොළොස්වන පියුස් ශුද්ධෝත්තම පියතුමන්ගේ "රේරුම් එක්ලේසියේ" විශ්ව ලේඛනය එතුමන් තුළ වූ එම ඇඩි ආශාව අභිමුව පැයූ පහන් තරුවක් විය. නිරන්තර යාච්ඤාවේ හා පශ්චත්තාපයේ ක්‍රියාවන් තුළ නිහඬ නිස්කලංක ජීවිත පෙවෙතකින් මිනිස් සංහතිය යළිත් දෙවිඳුන් වෙත දිනාදීමේ කාර්යයට තම පැවදිවරුන් සහ පැවදිවරියන් සහභාගි වීම එතුමන්ගේ අචල ආශාව විය.



ගරු බී. ඒ. තෝමස් නි.ම.නි.
ජපමාල තාපස නිකායික පියතුමා

1928 පෙබරවාරි 02 වන දින ප්‍රථම ජපමාල තාපසාරාමය සහ 1948 සැප්තැම්බර් 08 වන දින ප්‍රථම ජපමාල තාපසිකාරාමය පිහිට වූ දින එතුමන්ගේ සිහිනය සැබැවින්ම සැපිරිනි. පලදායී පශ්චාත්තාපික දිවිය සහ දිව්‍ය සත්ප්‍රසාදය මත පදනම් වූ මරියානු ධ්‍යානශීලි ජීවිතයක් ගත කිරීමේ අටියෙන් තෝමස් පියතුමන්ට අවශ්‍ය වූයේ දිව්‍ය සත්ප්‍රසාදය ඉදිරියේ කරන්නාවූ නිරන්තර ජපමාල උච්චාරණය තුළ තම තාපස තාපසිකාවන් දේවමාතාවන්ගේ නිර්මල හෘදය තුළින් ජේසු සමිඳුන්ගේ දිව්‍ය හෘදයට කැපවීමයි.

තම ජීවිතාදර්ශය තුළින් මෙන්ම තම ජීවිතය තුළින් ද සපුරාගත් දෑ තුළින් තෝමස් පියතුමන් තම නිකායික දූ පුතුන්ට සැබෑ ආදර්ශමත් පියෙකු වූ බව කීම අතිශයෝක්තියක් නොවේ. එතුමන්ගේ යාච්ඤාවේ ජීවිතය තුළින් විද්‍යාමාන වූයේ එතුමන් සැබවින්ම දෙවිඳුන් තුළ යැපුණු පුද්ගලයකු බවයි.

තෝමස් පියතුමන්ගේ ශුද්ධවන්ත ජීවිතය තුළ වූ මානුෂිකත්වය මෙන්ම අසල්වැසියන්ට වූ දයාව හා ලැදියාව නොකිතුණු හින්දු බැතිමතුන් තුළ පවා එතුමන් කෙරේ ශ්‍රද්ධාවක් උපදවන්නට සමත්විය. එතුමන්ගේ සම්පූර්ණ ජීවිතය කර්කෂ තාපස ජීවිතයක් වූ අතරම, සරළ දිළිඳුකමේ සහ ගැඹුරු බැහැපත්කමේ ද දිවියක් විය. තමන් සතු වූ කුඩා කුටිය තුළ වසර ගණනාවක් නිශ්චල බවේ හා නිහඬ බවේ ජීවිතයක් ගතකළ එතුමන් තමා කෙතරම් අධ්‍යාත්මිකව ධනවත් ද යන්න ලොවට කියාදෙන්නට සමත්විය.

දිව්‍ය සංරක්ෂණය එතුමන් තදින් විශ්වාස කළ දෙයකි. ජීවිතයේ අඳුරු වලාවන් සහ අන්ධකාරයේ අරගලයන් තුළ එතුමන් විශ්වාස කළේ දිව්‍ය සංරක්ෂණය පමණි. දිව්‍ය සංරක්ෂණය කෙරෙහි වූ අචල විශ්වාසය නිසාම තම ජීවිතය තුළ ප්‍රාතිහාර්යාත්මක අත්දැකීම් ලබන්නට එතුමන්ට හැකිවිය. තම ජීවිතයේ අවසාන කාල පරිච්ඡේදය තුළ තම අධ්‍යාත්මික දිවියේ වඩාත් අඳුරු යුගයකට මුහුණ දුන් එතුමන් තම මිනිස් සිරුරේ දුබලකම් මැද දෙවිඳුන් තමන් අත්හැරියේ දැයි යන්න හැඟෙන විටදී පවා දෙවිඳුන්ව විශ්වාස කරන්නට විය.

තම ජීවිතයේ වසර 30 ක කාලයක් ගත කළ රමණීය තෝලගට්ටි ආරාමය හැරදමා යාපනය රදගුරු නිවස තුළ ජීවත් වන්නට රදගුරු තුමන්ගේ ලද නියෝගය, කුරුස ගත වූ ජේසු සමිඳුන් සමග එකතු වන්නට තෝමස් පියතුමන් හට දෙවිඳුන්ගෙන් ලැබුණු කැඳවීමක් විය. තම ආදරණීය දූ පුතුන්ගෙන් ඈත්ව ගත කළ යුතු දිවිය ඉතා දුක්බර වූවක් බව එතුමන් දැන සිටියත් කිසි දිනක එතුමන් ඒ සම්බන්ධයෙන් කිසිවෙකුට චෝදනා මුඛයෙන් කතා කළේ නැත. එතුමන්ගේ ඉවසීමේ සහ දේව කැමැත්තට අවනත වීමේ වීරෝධාර ගතිය එමඟින් පිළිබිඹු විය. තම ජීවිතය අවසාන භාගය තුළ ශාරීරික සහ මානසික පීඩාවන්ට ගොදුරු වූ නමුදු ඔහු නිරන්තරයෙන්ම දේව කැමැත්තට හිස නැමීය. දුක නමැති රළ පහර ජීවිතය නමැති සයුරේ ඒ මේ අත එතුමන් රැගෙන යද්දී එතුමන්ගේ නැංගුරම වූයේ දේව කැමැත්තමය. එම දුක දේව වරප්‍රසාදයෙන් ඈත් වූවන් වෙනුවෙන් දෙවිඳුන්ට කරනු ලබන පූජාවක් වන්නට එතුමන් ඉඩහැරියේ ය. වර්ෂ 1964 ජනවාරි 26 දින ස්වාමින් වහන්සේ තමන්ගේ ජීවිතයෙන් බලාපොරොත්තු වූ එම දුබල බැහැපත් කාර්යය හමාර කොට නිහඬව මෙලොව ජීවිතයෙන් එතුමන් සමුගත්තේ සභා ඉතිහාසය තුළ නම ලියැවුණු විරල ශුද්ධවන්තයකු ලෙසය.

දේව සේවකයකුගේ මරණය ශුද්ධවන්තයකුගේ උපත විය. තම දූ දරුවන් වූ සිය ගණනක් ජපමාල තාපස තාපසිකාවන්ගේ පශ්චත්තාපය සහ යාච්ඤාවේ නිහඬ දිවිය තුළ එතුමන් අප මව්බිමෙන් බිහිවෙන ප්‍රථම ශුද්ධවරයා වනු නොඅනුමානය. එතුමන්ගේ මෙලොව ජීවිතය තුළදීම ශුද්ධවන්තයකු ලෙස බුහුමන් ලැබූ එතුමන් මෙලොව සිටියදීම දේව රැකවරණය සොයා ආ මිනිසුන්ගේ මැදහත්කරුවකු විය. තම කටුක පශ්චත්තාපී දිවිය තුළින් මෙන්ම නිරන්තර මර්ධන ක්‍රියා තුළිනුත් නොසැලෙන යාච්ඤා දිවිය තුළිනුත් එම අයැදීම් දෙවිඳුන් වෙත ගෙන යන්නට ඔහුට හැකි විය. නපුරේ බලවේග යන් පවා එතුමන්ගේ අණසකට කීකරු වූ අතරම, යක්ෂාවේශ වූවන් සුවපත් කරන්නට යාපනය පදවිය තුළ නිල බලයලත් පියතුමා වූයේද එතුමන්මය. තමන්ගේ අවසන් හුස්ම හෙලන තුරුම තමන් තෝරාගත් ජීවිත මාර්ග යේ නොසැලී ගමන් කරන්නට එතුමා තුළ වූ අධිෂ්ඨානය පුදුම සහගතය. තම මරණයෙන් පසු එතුමන්ගේ මධ්‍යස්ථකමින් පිහිට අයැදින සියල්ලන්ට තම ජීවිත කාලය තුළ දී මෙන්ම මරණයෙන් පසු ද එතුමන්ගේ මැදහත්කම තුළින් ලැබුණාවූ වරප්‍රසාද වලට තුති පුදමින් ලැබෙන ලිපි ඒ සඳහා සාක්ෂි දරති. එය සැමටත් එතුමන්ගේ මධ්‍යස්ථකමෙන් යාච්ඤා කිරීමට මහඟු රුකුලකි. එතුමන්ගේ මධ්‍යස්ථකමින් අප ලබන්නාවූ වරප්‍රසාද එතුමන්ව ඉක්මනින් ශුද්ධවරයට ඔසොවන්නට අපට මහත් පිටිවහලක් වනු ඇත.

2012 ජනවාරි මස 06 දින එතුමන්ගේ පූජකවරයේ ශත වර්ෂ පූරණය අප සමරන්නෙමු. ජපමාල තාපස නිකායිකයන් හා සමඟ එකතුව එතුමන්ගේ පූජකවරයේ කැපවීම තුළ අප ලැබුවාවූ සියලු වරප්‍රසාද වලට එතුමන්ගේ මධ්‍යස්ථකම තුළ අප ලැබුවා වූ සියළු දීමනාවන්ට අපි දෙවිඳුන්ට තුති පුදමු. ශුද්ධවූ සභාවට එවැනි ශුද්ධවන්ත කැපවුණු හා උදෙ‍යා්ගිමත් පූජකවරයකු ලබාදුන් දෙවිඳුන්ට ප්‍රශංසා කරමු.

**ගරු ජස්ටින් රාජ් ජ.නි. පියතුමා**

**පරිවර්තනය**
**ගරු සමන්ත කුරේ ජ.නි. පියතුමා**

# ස්වර්ගස්ථ වූ ජාතික ධර්මෝපදේශ සහ බයිබල් අපෝස්තලික සේවා අධ්‍යක්‍ෂ ගරු නික්ලස් සී. ලෝව් පියතුමා ගැන බිඳක්...

**ජාතික ධර්මෝපදේශ හා බයිබල් අපෝස්තලික සේවා අධ්‍යක්ෂ ගරු නික්ලස් ක්‍රිස්ටෝපර් ලෝව් පියතුමා පසුගිය නොවැම්බර් මස 07 වන දා අප අතරින් සදහටම වෙන් විය.**

රෝගීව සිට ඉතා කෙටි කලකින් එතුමා අප අතරින් වෙන්වීම ඉතාමත් කණගාටුදායක ය. ගරු නික්ලස් සී. ලෝව් පියතුමා එතුමාගේ මරණ මොහොත දක්වා සේවය කළේ ජාතික ධර්මෝපදේශ හා අපෝස්තලික බයිබල් සේවා මධ්‍යස්ථානයේ ජාතික අධ්‍යක්ෂ ලෙස ය. ඒ අතර එතුමා හලාවත පදවියේ කතෝලික අධ්‍යාපනය භාර අධ්‍යක්ෂ පියතුමා ලෙස ද කටයුතු කළේ ය.

මාරවිල පදිංචි වර්ණකුලසූරිය ස්ටීවන් ලෝව් හා රොස්ලින් ප්‍රනාන්දු යන දෙමාපියන්ට දාව සොයුරන් දෙදෙනෙක් හා එක් සොයුරියකගෙන් යුත් පවුලේ දෙවැන්නා ලෙස මෙතුමා 1955 මාර්තු මස 09 වන දින මෙලොව එළිය දිටී ය.

ගරු නික්ලස් සී. ලෝව් පියතුමා මාරවිල සා. මරියා විදුහල, මාරවිල සා. සේවියර් විදුහල හා නාත්තන්ඩිය ධම්මිස්සර විදුහල්වලින් තමාගේ මූලික අධ්‍යාපනය ලබා තම ප්‍රසාද ස්නාපනීය කැඳවීම තේරුම් ගෙන දෙව්සත්හලට ඇතුළත් වී වර්ෂ 1982 අගෝස්තු මස 07 වන දින එවකට හලාවත පදවියේ රදගුරු අති උතුම් ෆ්‍රැන්ක් මාකස් ප්‍රනාන්දු රදගුරු හිමිපාණන්ගෙන් පූජකවරය ලබා සහයක පියතුමකු ලෙස වෙන්නප්පුව හා පුත්තලම මීසම්වල ද, වයික්කාල මීසම් සේවක පියතුමා වශයෙන් ද තමාගේ ධර්මදූත සේවාව ආරම්භ කරන ලදී.

ඒ වකවානුවේ කොළඹ විශ්ව විද්‍යාලයේ ජනමාධ්‍ය ඩිප්ලෝමා පාඨමාලාව හදාරා ජනමාධ්‍ය ඩිප්ලෝමා සහතිකය දිනා ගත්තේ ය. 1987 වර්ෂයේ දී ඉන්දියාවේ සැලේසියාන පියවරුන්ගේ "විශ්ව දීප" නමැති අධ්‍යාපන නිකේතනයේ ධර්ම උපදේශක හා යොවුන් හා ළමා මනෝ විද්‍යාව පිළිබඳ පාඨමාලාව හදාරා ඩිප්ලෝමා සහතිකයක් ලබා ගත්තේ ය. ඉන්පසු මාරවිල ශා. පාවුළු සිසුහලේ එවකට අදියුරු තැන්පත් ගරු පීටර් චාල්ස් පියතුමාට සහය වෙමින් වසරක කාලයක් ගත කර 1990 රෝමයේ උර්බානියානා විශ්ව විද්‍යාලයෙන් උපාධි ලබා 1992 දී හලාවත පදවි ධර්මෝපදේශක අධ්‍යක්ෂ ලෙස පත් විය. 1999 හලාවත පදවි කතෝලික අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර දරමින් තල්විල මීසමේ සේවය කළේ ය.



2003 කන්ජුක්කුලිය මීසම් සේවකව පැමිණ එහිදී ආධ්‍යාත්මික, සාමාජීය නවෝදයක් උදා කරලීමට දායක වෙමින් පදවි අධ්‍යාපන කටයුතු වල ද නිරත විය. 2007 අප්‍රේල් මාසයේ ජාතික ධර්මෝපදේශ අධ්‍යාපන හා බයිබල් අපෝස්තලික සේවා ජාතික අධ්‍යක්ෂ ලෙස රදගුරු මණ්ඩලය මගින් පත් කරන ලදී. වර්ෂ 2009 කැලණිය විශ්ව විද්‍යාලයෙන් මනෝ විද්‍යාත්මක ඩිප්ලෝමාවක් ලබා තම අධ්‍යාපන මට්ටම දියුණු කරගන්නා ලදී.

ගරු නික්ලස් සී. ලෝව් පියතුමා එතුමාගේ අවසාන මොහොත දක්වාම ජාතික ධර්මෝපදේශ හා බයිබල් අපෝස්තලික සේවා ජාතික අධ්‍යක්ෂ තනතුරෙහි තමාගේ සේවය උපරිම ලෙස අවංකව ඉටු කරන ලද පියතුමෙකි. "මැරුණත් මළ කඳ වුනත් රාජකාරිය ඉටු කළ යුතු ය." යනුවෙන් පවසමින් අවසන් මොහොත දක්වාම තමාට පැවරුණු රාජයකාරීය ඉටු කළේය.

ජාතික ධර්මෝපදේශ සහ බයිබල් අපෝස්තලික සේවා අධ්‍යක්ෂ පියතුමා ලෙස වසර 5 කට ආසන්න කාලයක් තුළ අනගි සේවාවක් කළ ගරු ලෝව් පියතුමා සිරිලක දහම් සේවාව නංවාලීමට මහත් වෙහෙසක් දැරීය. විශේෂයෙන් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දහම් දැනුම වර්ධනය කිරීමට අවශ්‍ය නොයෙකුත් පොත පත සම්පාදනය කිරීමට මහත් වෙහෙසක් දැරීය. විශේෂයෙන් අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) කතෝලික ධර්මය හදාරන දරු දැරියන් සඳහා එම විෂයට අදාළ අතිරේක පොත් සම්පාදනයට කටයුතු කරන ලදී. දහම් පාසල් දියුණු කිරීමට, දහම් පාසල් ගුරු භවතුන්ට ඔවුන්ගේ සේවාව නියමාකාරයෙන් කරගෙන යෑමට ඔවුන්ට අවශ්‍ය භෞතික හා මානව සම්පත් ලබා දෙමින් ජාතික ධර්මෝපදේශ අධ්‍යක්ෂ පියතුමා ලෙස ගරු නික්ලස් සී. ලෝව් පියතුමා තම කාර්යය ඉතා උපරිමයෙන් කිරීමට නොයෙකුත් අපහසුතා හා දුක් ගැහැට මැද අපමණ වෙහෙස දැරීය. ඉතා දුෂ්කර කටුක ප්‍රදේශවල ජීවත්වන දරු දැරියන් සොයා ගොස් ඔවුන්ට අවශ්‍ය පාසල් උපකරණ ආදිය නොමිලයේ ම ලබා දෙන ලදී.

ගරු ලෝව් පියතුමා තුළ තිබුණු ලේඛනයේ සහජ හැකියාව ඉතා සරල භාෂාවෙන් ජනතා හදවත්වල සනිටුහන් කිරීමට ඉතාමත් නිර්මාණශීලිව කාලීන මාතෘකා ඔස්සේ කිතුනු දහදම හා මනෝවිද්‍යා උපයෝගී කරගෙන නොයෙකුත් ලිපි වර්ග විවිධ පුවත් පත් වලට සපයමින් පුවත් පත් කලාවට සම්බන්ධව කටයුතු කරන ලදී.

එමෙන්ම උන්වහන්සේගේ ධර්මෝපදේශ කාර්යය තනිවම නොව පදවියේ පූජක සංගමය සමඟ එක්ව යාව ජීව වී කළේ ය. ගරු ලෝව් පියතුමා තමා යටතේ සිටින කාර්යය මණ්ඩලය හා ගුරු භවතුන් දිරිගැන්වූහ. මඟ පෙන්වීය. පහසුකම් බෙදා දුණි. දරු දැරියන්ට දැනුම ලබාදෙන, දෙවිඳුන් හඳුන්වාදෙන කේන්ද්‍රස්ථානය බවට ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය පත් කළේ ය. පියතුමකු ලෙස ගිහි ජනතාව සමඟ අනන්‍යතාවය තහවුරු කරමින් අන්‍යෝන්‍ය සහයෝග යෙන් කටයුතු කරමින් සැබෑ එඬේරකු විය.

මෙවැනි පැතිකඩ කිහිපයකින් කිතුනු ජනතාව එක් රැස් කරමින් කතෝලික සභාව නිරත වන ධර්මදාන සේවයේ පූර්ව ආදර්ශයක් සනිටුහන් කරමින් ශ්‍රී ලංකා කිතුනු සභා ඉතිහාසයේ තවත් ජුසේවාස් පියතුමකු විය. කතෝලික ජනතාවගේ සැබෑ එඬේරෙකි. අවංක මගෝපදේශකයකු ද විය.

**ගරු නික්ලස් සී. ලෝව් පියතුමන්ට සදා මොක් සුව හිමිවේවා!**

# අවිලා හි තෙරේසාතුමිය, භාවනාශීලී යාච්ඤාව හා සංතෘප්තිය - 15

**දෙවියන් වහන්සේගේ ක්‍රියාකාරිත්වය තුළ ජීවත් වීමත්, උන්වහන්සේගේ දයා කරුණාව සහ තේජස ගැන සහ අපගේ නින්දිත බව ගැන මෙනෙහි කිරීමත් ඉතා ප්‍රයෝජනවත්ය. උන්වහන්සේට කැමති දෙයක් කිරීමට ඉඩදීමත් ඉතා යහපත්ය. අපට වඩාත්ම යහපත් දෙය කුමක්ද යන්න උන්වහන්සේ දන්නා සේක. එවිට අපට සාමය භුක්ති විඳිය හැකි අතර, යක්ෂයාට අපව මුලා කිරීමටද අවස්ථාවක් නොලැබේ.**

අප කොතරම් දුඃඛිත, අවාසනාවන්ත ජීවිතයක් මේ ලොකය තුළ ගත කරනු ලබනවාද! ඒවායින් මිදෙන අයගේ ඉරණම කොතරම් වාසනාවන්තද! එය තේරුම් ගත්තත් දෙවියන් වහන්සේට ප්‍රශංසා කරන විට එය කොතරම් ආනන්ද ජනකද! අප අපගේ මුඛයෙන් වැඩිම ප්‍රයෝජනයක් ගන්නේ දෙවියන් වහන්සේට ප්‍රශංසා කරන විටය.

ස්වාමීන් වහන්සේ විසින් එවැනි භාවනාවත්මක අත්දැකීමක් අපට දානය කරන සේක්වා! එවැනි දෙයක් අපගේ හැකියාව මගින් පමණක් ලබාගත නොහැකිය. එවැන්නක් දිව්‍යමය තිළිණයකි. එය අත්දකිනවිට තමන්ට තමන්වත්, අනෙකුත් සෑම දෙයක්ම අමතක වේ. එමෙන්ම දෙවියන් වහන්සේට ප්‍රශංසා කරනවා හැරෙන්නට වෙනත් කිසිම දෙයක් ගැන සිතීමට හෝ කතා කිරීමට උවමනාවක් ඇති නොවේ. එමඟින් ලැබෙන ගැඹුරු ආනන්දය දෙවියන් වහන්සේට තව තවත් ප්‍රශංසා කිරීමට අපව පොළඹවයි. වෙනත් කිසිම දෙයක් මීට වඩා අපව සතුටට පත් කළ නොහැකිය.

භාවනාශීලි යාච්ඤාව තුළ දෙවියන් වහන්සේව ගැඹුරින් අත්දකින පුද්ගලයා තමන්ගේ අතීත පව් වලට මනස්ථාපනය නොවිය යුතු බවට දුර්මතයක් පවතී. නමුත් එය වැරදි සහගත මතයකි. අප දෙවියන් වහන්සේගේ වරප්‍රසාද අත් දකින ප්‍රමාණය වැඩිවන තරමට, අපගේ පාප වලට මනස්ථාපනය විය යුතු ප්‍රමාණයද තව තවත් අධික විය යුතු වේ. මෙම ක්‍රියාවලිය දිගින් දිගටම සිදුවිය යුත්තකි. මෙම ක්‍රියාවලිය නවතින්නේ අප ස්වර්ග රාජ්‍යයට පැමිණිනු විට පමණි.

අපගේ පාප වලට මනස්ථාපනය නොවීම දෙවියන් වහන්සේට කරන විශාල අගෞරවයකි. එමෙන්ම එය අපගේ කළගුණ නොසැලකීමකි. අනාවරණය වී ඇති දේව අභිරහස දෙවියන් වහන්සේගේ උත්තරීත්වය ගැන අපට උගන්වා ඇත.

අපගේ ආත්මය අතීතයේදී දෙවියන් වහන්සේ කෙරෙහි තිබූ ගරුසරු නැතිකම, අවමානය සහ අගෞරවය ගැන ගැඹුරින් කම්පා වේ. අතීතයේදී කරන ලද මෝඩකම් ගැන ඉතා ශෝකයට පත් වේ. දෙවියන් වහ්නසේව අත්හැර දැමීමේ අධම බව ආත්මයට පසක් වේ. අපට ලැබී ඇති වරප්‍රසාද වලට වඩා අපගේ පාපකාරී අතීතය ගැන අපගේ මනස මෙනෙහි කරයි. ගඟක පතුලේ පවතින මඩ මෙන් අපගේ පාපවල අපගේ සිත තුළ තැන්පත් වී මතකයට විටින් විට පැමිණේ. මෙය සමහර විට දරාගැනීමට නොහැකි කුරසියක් බවට පත් විය හැකිය.

ඒ කෙසේ වුවත් හයවන මහලට ළඟා වූ කෙනෙකු තුළ අපාය පිළිබඳ බිය පහවී ඇත. දෙවියන් වහන්සේ තමන්ගෙන් ඈත් වීම නිසා, තමන්ගේ පෙර තිබූ පාපකාරී ක්‍රියාකාරකම් වලට නැවත ආපසු හැරී යෑමට ඇති හැකියාව ගැන පමණක් බියක් පවතී. ඒ නිසා එවැන්නන් තමන්ගේ දුක් වේදනාවන් හෝ පෞද්ගලික මහිමය ගැන කිසිම තැකීමක් නොකරයි.



අප කොතරම් අධ්‍යාත්මිකව වැඩි වර්ධනය වුවත්, අප කොතරම් දෙවියන් වහන්සේට ළං වුවත්, අපගේ පාපකාරී අතීතය අමතක කළ යුතු නොවේ. එසේ කිරීම ඉතාමත් භයානකය. අපගේ පාපකාරී අතීතය මතකයේ තබා ගැනීම ඉතා වේදනා සහගත වුවත්, එයින් අපට ලැබෙන යහපත ඉතා අධිකය.

අපගේ ස්වාමීන් වහන්සේ අපට සමාවදී, අපගේ පාපයන් අමතක කොට ඇතත්, අපගේ අතීතය ගැන මෙනෙහි කිරීමේදී අපට ඇති වන වේදනාව එයින් තුනී නොවේ. උන්වහන්සේ අපට දානය කර ඇති දයා කරුණාව සහ වරප්‍රසාද ගැන මෙනෙහි කිරීමේදී අපගේ පාපකාරී අතීතය ගැන ඇතිවන ශෝකය තව තවත් තිව්‍ර වේ. අපාය හැර වෙනත් කිසිම ඉරණමකට අප සුදුස්සන් නොවන බව එවිට අපට වැටහීමට පටන් ගනී.

පාවුලු තුමා සහ මරිය මග්දලේනා තුමිය තමන්ට ලැබුණු දේව වරප්‍රසාද ගැන වැටහුනු විට තමන්ගේ අතීත පාපකාරී ක්‍රියාවන් ගැන ඉතා ගැඹුරු ලෙස දුක්වේදනාවට පත් වෙන්නට ඇත. ඔවුන් දෙදෙනා තුළ දෙවියන් වහන්සේ කෙරෙහි තිබූ ආදරය ඉතා අධික වුවත්, ඔවුන් දෙවියන් වහන්සේගේ දයා කරුණාව සහ වරප්‍රසාද ඉතා ගැඹුරට අත්දැක තිබුනත්, දෙවියන් වහන්සේගේ උතුම් බව ඔවුන්ට වැටහී තිබුනත්, තම අතීත ක්‍රියාකාරකම් ගැන මෙනෙහි කරන විට ඔවුන්ට එය දරා ගැනීමට නොහැකි වන්නට ඇත. ඒවා ගැන ඉතා තියුණු ශෝකයකින් පසුතැවිලි වන්නට ඇත.

අප වැනිම මනුෂ්‍යයන් දෙවියන් වහන්සේ උදෙසා කරන විරෝධාර ක්‍රියා අප විසින් අධ්‍යයනය කළ යුතු වේ. මෙනෙහි කළ යුතුවේ. අනුගමනය කළ යුතුවේ. එය එසේ නම් අප ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ මනුෂ්‍යත්වය ගැන මෙනෙහි කිරීම අප කොතරම් තිව්‍ර ලෙස කළ යුතු වේද! උන්වහන්සේගේ මනුෂ්‍ය ස්වභාවය ගැන මෙනෙහි නොකර අපට හයවන සහ හත්වන මහල් වලට ඇතුළු විය නොහැකිය.

අපගේ සැබෑ මඟ පෙන්වන්නා වන ජේසුස් වහන්සේගේ උදව් උපකාර නොමැතිව අපගේ මාර්ගය අපට සොයා ගත නොහැකිය. එපමණක් නොව උන්වහන්සේගේ ආධාර උපකාර නොමැතිව අනෙකුත් මහලවල් වලටද ඇතුළු විය නොහැකිය. අපගේ ස්වාමීන් වහන්සේම පවසන ආකාරයට උන්වහන්සේ 'මාර්ගය' වේ. එමෙන්ම උන්වහන්සේ සඳහන් කරන ආකාරයට උන්වහන්සේ 'ආලෝකය' වේ. උන්වහන්සේ මගින් මිස කිසිවෙක් පියාණන් වහන්සේ වෙත නොපැමිණෙන්නෝය. "මා දුටු තැනැත්තේ, පියාණන් වහන්සේ දුටුවේය" (ජොහන් 14:9).

සෑම භාවනාශිලි යාච්ඤාවකම අවසාන පරමාර්ථය දෙවියන් වහන්සේව සෙවීමයි. උන්වන්සේව සොයා ගැනීමෙන් පසුව පවා, උන්වහන්සේව සෙවීමේ කාර්යය දිගටම කළ යුතුවේ. මෙහිදී ඉතා වැදගත් වන්නේ බුද්ධිය නොව චේතනාවයි. චේතනාව පිරිසිදු කර ගත් විට, බුද්ධියෙන් දෙවියන් වහන්සේ සෙවීමේ කාර්යයෙන් අප වෙහෙසට පත් නොවේ.

චේතනාව ආදරයෙන් ගිනි ගැනීමට පටන් ගත් විට, බුද්ධියේ කාර්ය භාරය නැවතීමට පටන් ගනී. අවසාන මහල් දෙකට ළඟාවීමට පෙර මෙය ඉතා අවශ්‍ය තත්ත්වයකි.


ආත්මය දෙවියන් වහන්සේට ආදරය කරනවා හැරෙන්නට වෙනත් කිසිම දෙයක් නොකිරීමට ආශා කරයි. නමුත් එය සෑම විටකම ක්‍රියාත්මක කිරීමට නොහැකි විය හැකිය. හේතුව දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීමට අප ආශා කළත්. ඒ සඳහා අවශ්‍ය අභ්‍යන්තර ගිනි දළු නැවත නැවතත් ප්‍රාණවත් කිරීම අවශ්‍යය.

දෙවියන් වහන්සේට උවමනා නම් උන්වහන්සේ එම අධ්‍යාත්මික ගිනි දළු පණ ගන්වයි. අප එවැනි වරප්‍රසාද සඳහා සුදුසු නැති බව වටහා ගැනීමත්, එමෙන්ම උන්වහන්සේගේ උදව් අපට නිතර අවශ්‍ය බව වටහා ගැනීමත්, උන්වහන්සේ අපෙන් බලාපොරොත්තු වන සේක. අපගේ සමස්ත ජීවිත කාලය තුළදීම අප මේ ආකාරයට කටයුතු කළ යුතුවේ. එවිට අප නිරන්තරයෙන්ම අප ස්වාමීන් වන ජේසුන් වහන්සේගේ මනුෂ්‍යත්වයත්, දේවත්වයත් තුළ වාසය කරයි.

අපගේ හදවත තුළ ඇති ගිනි දළු නිවී යන විට, දෙවියන් වහන්සේගේ වැඩ සිටීම අප හදවත් වලට නොදැනෙන විට, අප ඇතුලාන්තය තුළ වියළි බවක් ඇති වන විට, අප උන්වහන්සේව තව තවත් සෙවිය යුතු වේ. උන්වහන්සේ අපගෙන් බලාපොරොත්තු වන්නේද එයයි. අභ්‍යන්තර වියළි භාවයක් අපට දැනෙන විට අප අධෛර්යමත් විය යුතු නැත. අපට නොතේරුනත් දෙවියන් වහන්සේ ඊට හේතුව දන්නා සේක.

උන්වහන්සේ අපෙන් බලාපොරොත්තුවන්නේ දේව අණ පනත් ගැන මෙනෙහි කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීමයි. අනෙකුත් සියලු කරුණු උන්වහන්සේ කැමති ආකාරයට තීරණය කරන සේක.

ඉදිරි කලාපයට... »



මහාචාර්ය ඇන්ටන් මීමන

## 12 දර්ශනය යනු කුමක්ද ?

## ප්‍රඥාව, සත්‍යය සහ බුද්ධිමය නිහතමානීත්වය

**බුද්ධිමය වර්ධනයක් නොමැතිව චරිත වර්ධනයක් සිදු නොවේ. එවිට අපගේ ඥානමය ක්ෂිතිජයන් පටු වේ, අප ලෝකය හා මිනිස් ජීවිතය පිළිබඳව එළඹෙන නිගමනයන් සත්‍යයට සමීප නොවේ. ඒ අනුව පදනම් විරහිත නිගමනයන් මත පදනම් වී තීරණ ගැනීමට ඇති සම්භාවිතාව අධික වෙයි.**

අප පූර්ව මත වල එල්බගෙන ලබන තාවකාලික සුරක්ෂිතභාවයේ ප්‍රතිඵලයක් වශයෙන් බුද්ධිමත් භාවයේ වර්ධනය සම්පූර්ණ නොවේ. එම තත්ත්වය බුද්ධිමය මායාවකි, තමාවම රවටා ගැනීමකි. අසම්පූර්ණ බුද්ධිමත්භාවය තුළින් එළඹෙන නිගමන සත්‍යයෙන් බොහෝ දුරස්ථය. එම නිගමන වලට ගැඹුරු පදනමක් නොමැත. ප්‍රායෝගිකත්වයේ (Practicality) නාමයෙන් සත්‍යය සෙවීම සීමා කිරීම අතිශයින්ම භයානක තත්ත්වයකි. ප්‍රායෝගිකත්වයට සීමාවන් ඇත. එසේ නැත්නම් එය මුළු මහත් ජන සමාජයම ක්‍රමානුකූලව විනාශ කිර දැමිය හැකිය. ප්‍රායෝගිකවීමේ (Being Practical) නාමයෙන් සත්‍යය ගබ්සා කිරීම, වැසීම, යටපත් කිරීම සහ සත්‍යයට ද්‍රෝහිකම් කිරීම සමාජ පිරිහීමේ සහ විනාශයේ මුලයි. කෙටි කාලීන පෞද්ගලික වාසි සඳහා සත්‍යය පාවාදීම, වසන් කිරීම සමාජ ගැටුම්වල ආරම්භයයි.

ප්‍රශ්න ඇසීමේ මානව ලක්ෂණය සීමා කිරීම බුද්ධිමය සහ විද්‍යාත්මක ප්‍රගතිය ගබ්සා කිරීමකි. මානව පැවැත්ම සහ සත්‍යය වෙන් කළ නොහැකිය. ලෝකය ගැන කරුණු දැන ගැනීමට ඇති මානව ආශාව සීමාවිරහිත ආශාවකි. කරුණු නිවැරදිව යථාවාදීව, හරියාකාරව තේරුම් ගැනීමට ඇති උවමනාව මානවයා තුළ ඉතා ගැඹුරට පිහිටා ඇති ආශාවකි. කරුණු සම්පූර්ණයෙන්ම දැන ගැනීම මිනිසාට ස්වභාවික වු ගති ලක්ෂණයකි. පූර්ණ සත්‍යය ගවේෂණය කිරීම. එහි අවසාන ප්‍රතිඵලය කුමක් වූවත්, අසීමිත මානව පැතුමකි. අපක්ෂපාතී, කොන්දේසි විරහිත, සීමා රහිත, උපේක්ෂා සහගත ඇතුලාන්ත ආතතිය, ගැඹුරුතම ආශාව මානව දැනුමේ ආරම්භයයි. ඊට එරෙහිව යෑම පෞද්ගලික පූර්ව මතයේ ප්‍රතිඵලයකි. බුද්ධිමය ලෙස පරිණත වීම සඳහා අප තුළ පවතින මෙම පූර්ව මතය ගැන අපි සවිඥානික විය යුතු වෙමු.

**2 සාමූහික පූර්ව මතය** (Group bias)

තමා අයිති කණ්ඩායම, පක්ෂය, ආයතනය, ආගම, ජාතිය, රට, සංස්කෘතිය හෝ සංගමය විසින් කරනු ලබන ලද ඕනෑම අක්‍රමිකතාවයක්, පාපකාරී, දූෂිත, පිරිහුණු, අසාධාරණ, මානව විරෝධී ක්‍රියාවක් වැසීමට තැත් කිරීම, එය සිදු වූ බව තරයේම ප්‍රතික්ෂේප කිරීම (ඔප්පු කළ හැකි සාධක හමුවේ පවා), එය සැඟවීමට තැත් කිරීම හෝ ඒ ගැන ගොළුවත රැකීම මෙම පූර්ව මතයේ මූලික ස්වභාවයයි. එසේ වූ විට රටක් හෝ ජන සමාජයක් සාමූහිකව පිරිහෙයි, එහි සැබෑ ප්‍රගතියක් සිදු නොවෙයි. අප යම් යම් කණ්ඩායම්වල, පක්ෂවල, ආයතනවල, ආගම්වල, සමාජිකයන් විය යුතු නැතැයි මින් අදහස් නොකෙරෙයි. නමුත් අප සාමාජිකත්වය දරණ කණ්ඩායම් කෙරෙහි, ආයතන පිළිබඳව විචාරශීලී, විමර්ශණශීලී සහ විග්‍රහශීලී ආකල්පයක් දියුණු කර ගත යුතුයි. එවැනි කණ්ඩායම් පරිණත භාවයට පත්වන්නේ එවිටය. තමා අයිති කණ්ඩායම් විසින් කරන සියලුම නොපනත්කම්, අමනකම්, අසාධාරණකම් යනාදිය ආරක්ෂා කිරීම, ඒවාට සුදු හුණු ගෑම තම කණ්ඩායමට, ආයතනයට කරන මහත් විනයකි, විනාශයකි. එමගින් එහි සාමාජිකයන්ගේ චරිත වර්ධනයත්, බුද්ධිමය වර්ධනයත් තීව්‍ර නොවේ.

තම කණ්ඩායමට ආශිර්වාදයක්, ආස්වාදයක්, විය හැක්කේ ඒ දෙස විවෘත සහ අවංක මනසකින් බැලීමෙනි. විචරශීත්වය, විමර්ශණශීලීත්වය, බුද්ධිමය අවංකත්වය සැබෑ පක්ෂපාතීත්වයේ මුඛ්‍ය ලක්ෂණයයි. අන්ධ පක්ෂපාතීත්වය, අවිචාරශීලි භක්තිමත්භාවය ඇත්තන් තම කණ්ඩායමට, ආයතනයට, ආගමට බරකි, ශාපයකි, විනයකි, බාධාවකි. එවැන්නන් අතින් තීරණාත්මක දායකත්වයක්, මෙහෙවරක් මානව සංහතියට සිදු නොවේ. ඔවුන්ට ඇත්තේ ඉතා පහළ ගණයේ, ඉතා බාල වර්ගයේ, මතුපිට, පිරිහිණු, අධි සෝබන පෞර්ෂත්වයන්ය. ඔවුන් තුළ අන්‍යන්ට ආශිර්වාදයක් වීම සඳහා අව්‍ය ගුණාංග, සුදුසුකම්, චරිත ලක්ෂණ අඩංගු නොවෙති.

සැබෑ මිතුරන් සෑම විටකම එකඟ නොවේ. නමුත් එයින් ඔවුන්ගේ මිත්‍රත්වයට කිසිදු හානියක් සිදු නොවේ. සෑම විටම එකඟ වන මිතුරා සැබෑ සතුරෙකි. එවැන්නන් සමඟ ඇතිවන මිත්‍රත්වයෙන් කිසිදු චරිත වර්ධනයක් සිදු නොවේ. මිතුරන් අතර සිදුවන අදහස් ගැටීම්, මතවාදී විවාදයන් සහ විවේචනයන් මිත්‍රත්වයේ පරිණතභාවයට අත්‍යාවශ්‍ය අංගෝපාංගයන් වෙති. සාමූහික පූර්ව මතය ජයගැනීමට නම් අප චරිතයන් තුළ එහි ක්‍රියාකාරීත්වය ගැන සවිඥානික විය යුතු වෙයි.

ඉදිරි කලාපයට... »

තරුණ පරපුර යුක්තිය සහ... 3 පිටුවෙන්

**අධ්‍යාපනය**

ජීවිතයේ වඩාත් අසීරු හා උනන්දු සහගත දේ නම් අධ්‍යාපනයයි. අධ්‍යාපනයෙ'අරුත තරුණ පරපුර තම තමන් වෙතින් ඉදිරියට ගෙන යෑම, යථාර්ථය ඔවුනට හඳුන්වා දීම වර්ධනයට හේතු කාරකවන පිරිපූර්ණත්වය ඔස්සේ කටයුතු කිරීමට මඟ පෙන්වයි. මේ ක්‍රියාදාමය ද්විත්ව නිදහසක් ඔස්සේ ගලායන අතර එනම් වැඩිහිටියන් හා තරුණ පරපුර වශයෙනි. අධ්‍යාපනය ලබා ගන්නා අයගේ වගකීම් කොටසක් ලෙස එය කැඳවනු ලබන අතර යථාර්ථය පිළිබඳ දැනගන්නට ඔවුන් විවෘතව යොමුවන අතරම, අධ්‍යාපනඥයන්ගේද වගකීම් කොටසක් ලෙස ඔවුන් තමන් සතු දැනුම නොමසුරුව ලබා දිය යුතුය. මේ හේතුව නිසා අන් කවරදාවකටත් වඩා දිවැසිවර සාක්ෂිය අපට අවශ්‍ය වන අතර සාමාන්‍ය පුද්ගලයන් ලෙස නීති හා සාධක මත පමණක් කටයුතු නොකර අන්‍යයන්ට වඩා දුරදක්නා නුවණින් සාක්ෂි දැරීමේ හැකියාවක් අවශ්‍ය වී ඇත්තේ ඔවුන්ගේ ජීවිත වඩාත් පුළුල් වී ඇති හෙයිනි. සාක්ෂි දීමක් යනු මුලින් තම ජීවිතයේ අත්දැකිමින් සෙසු අය සඳහා යෝජනා කිරීමකි.

යුක්තිය හා සාමය තුළ සෑ අධ්‍යාපනයක් පවතින්නේ කොහේද? සියල්ලට ප්‍රථමනේ පවුල තුළ දෙමාපියන් මුල්ම ගුරුවරු වන්නාහ. පවුල සමාජයේ ප්‍රාථමික සෛලය වන්නේය. "දරුවන් මානව හා කිතුනු වටිනාකම් මුලින්ම ඉගෙන ගන්නේ පවුලෙන් වන අතර එය ඔවුන්ට ගොඩනැගීමේ හා සාමකාමී පැවැත්මකට හේතු කාරක වෙයි. පරම්පරාවෙන් අතර සහයෝගිතාවය නීතින්ට ගරු කිරීම, කමාදානය සහ අන්‍යයන් පිළිගන්නේ කෙසේදැයි ඔවුන් ඉගෙන ගන්නේ පවුලෙනි. (1) පවුල ප්‍රථම පාසල ලෙස යුක්තිය හා සාමය පිළිබඳව අපට පුහුණුව ලබාදෙයි.

අප ජීවත් වන්නේ පවුල් මෙන්ම එහි ජීවිතද නිරන්තරයෙන් බියගැන්වීම් වලට හා අසාමාන්‍ය අර්බුදයන්ට ගොදුරුවන ලෝකයකය. රැකියාවන්හි තත්ත්වයන් සාමාන්‍යයෙන් පවුලේ වගකීම් දරන්නට ප්‍රමාණවත් නොවන අතර අනාගතය පිළිබඳ සැක සංකාද, ජීවිතයේ උමතු මුහුණුවරද, ජීවිතය පවත්වාගෙන යෑමට නිරන්තරයෙන් එහා මෙහා යාන තත්ත්වයන්ද නිසා දරුවන්ට විශ්වාසයෙන් යුතුව කටයුතු කිරීමට හා දෙමාපියන්ගේ සහභාගිත්වය පවුල තුළ තිරසාරව පැවතීමේ තත්ත්වයක් දක්නට නැත. මේ තත්ත්වයන් ජීවිත ගමන ගැන වඩාත් ගැඹුරින් සිතන්නට අවකාශ සලසන අතර ගෙවී ගිය වසර වල අත්දැකීම් හා අවබෝධයන් එක්ම ගත කිරීමේ අවස්ථාවලදී සංනිවේදනයට පමණක් සීමාවේ. දෙමාපියන්ට මා තදින් අවවාද කරන්නේ හදවත් නැතිවුන් ලෙස නොවැඩෙන ලෙසයි. ඔහුන් තම ජීවිත ආදර්ශයන් මගින් දරුවන්ට ඔවුන්ගේ බලාපොරොත්තු දෙවියන් වහන්සේ හමුවේ තබමින් යුක්තිය හා සාමය යන සුවිශේෂි එකි සම්පතක් දිනා ගැනීමට දිරි ගැන්විය යුතුය.

අධ්‍යපනික ආයතනයන්හි ප්‍රධානින්ටද එක් වචනයක් කීමට මම කැමැත්තෙමි. එනම් වගකීම පිළිබඳ සුවිශේෂ දැක්ම මත පිහිටා සෑම පුද්ගලයකුගේම ගරුත්වය හැමවිට අගය කටයුතු බව සහතික කළ යුතුය. සෑම තරුණ තරුණියකට සිය කැඳවීම අනාවරණය කර ගැනීමට සමත් බව පිළිගනිමින් ඔහුගේ හෝ ඇයගේ ජීවිතයට දෙවියන් වහන්සේ ලබාදුන් තලෙන්තු වැඩි වර්ධනය කර ගැනීමට උදව් උපකාර කළ යුතුය. ඔවුනගේ දරුවන්ට අධ්‍යාපනය ලබාගැනීමේ හැකියාව ඒ පවුල්වලට යළි තහවුරු කරමින් ඔවුනගේ ආගමික ප්‍රතිපත්තීන් හා හෘදය සාක්ෂින් අතර ගැටුමක් ඇති නොවීමට වග බලා ගත යුතුය.

සෑම අධ්‍යපනික සැලසුමක්ම විවෘතව සහ අන්‍යයන්ට දැක ගැනීමට හැකිවනසේ සංවාදය, සංසතිය හා සවන්දීමේ තත්ත්වයන් මැද තරුණ පරපුරට සිය හැකියාවන් හා අභ්‍යන්තර පොහොසත් භාවය පිළිබඳව සෑහීමකට පත්වන්නට සිය සහෝදර සහෝදරියන් වෙතින් ඉගෙන ගන්නට හැකිවනසේ සැකසිය යුතුය. තරුණ පරපුරට සතුටේ සාරය උගන්වමින් දයාව හා කරුණාව දෛනික ක්‍රියාකාරකම් ඔස්සේ ගලා එන - අන්‍යයන්ට ලබාදෙන වඩාත් සහෝදරාත්මක හා මානවීය සමාජයක් ගොඩනැගීමට ක්‍රියාකාරි දායකත්වයකට අවකාශ සලසා දිය යුතුය.

දේශපාලන නායකයන්ගෙන් මා ඉල්ලා සිටින්නේ පවුල් වලට හා අධ්‍යාපව ආයතනවලට ශක්තිමත් සහයයන් මගින් නතාවට අධ්‍යාපනය ලබා ගැනීමේ අයිතිය හා වගකීම ලබාදෙන ලෙසය. දෙමාපියන්ට සිය වගකීම් ඉටුකිරීමට මේ ප්‍රමාණවත් සහය කිසිවිටක අපතේ නොයනු ඇත. එහෙයින් අධ්‍යාපනය ලබන්නට කිසිවකුට බාධා නොකරන අතර පවුල්වලට නිදහසේ සිය දරුවන්ට වඩාත් සුදුසු අධ්‍යාපන ක්‍රමවේයන් තෝරා ගැනීමට අවකාශ සලසනු ඇත. එමගින් ජීවිතය පවත්වා ගෙන යෑම සඳහා කරන රැකියා නිසා වෙන්වූ පවුල් යලි එකමුතු වීමට ඔවුන් කැපවිය යුතුය. එහෙයින් තරුණ පරපුරට දේශපාලනය යනු සැමට යහපත් සේවාවක් කිරීමට මඟ සලසන්නක් බවට විනිවිදව දකින්නට අවස්ථාව ලබා දිය යුතුය.

මාධ්‍ය ලෝකයට මා ඇරියුම් කරන්නේ අධ්‍යාපනය වෙනුවෙන් ඔවුන්ගේ දායකත්වය බාදෙන ලෙසය. නූතන සමාජයේ ජනසන්නිවේදය සතුවූ සුවිශේෂි භූමිකාවක් පවතී. හුදෙක් තොරතුරු සැපයීමෙන් පමණක් නතර නොවූ ජනතාවගේ මනස හා ශ්‍රාවක හදවත් මෙහෙයවමින් තරුණ පරපුරට අධ්‍යාපනය ලබාදීමේ ක්‍රියාවලියේදී මහඟු මෙහෙවරක් ඔවුනට ඉටුකළ හැකිය. මෙහිදී කිසිසේත් අමතක නොකළ යුතු සත්‍යය නම් අධ්‍යාපනය හා සංනිවේදනය අතර පවත්නා සමීප සම්බන්ධතාවයි. අධ්‍යාපනය, සංනිවේදනය ඔස්සේ ප්‍රගුණ කළ හැකි අතර පුද්ගලයකු හොඳට හෝ නරකට යොමුකිරීමටද ඊට හැකියාව පවතී.

**ඉතිරි කොටස ලබන සතියේ**

## සදු සාමය දිනයි

පවුල් සේවා උපාධ්‍ය ගරු ජුලියන් පැට්‍රික් පෙරේරා පියතුමාගේ දයාබර පියා වූ ජුලියන් මයිකල් මහතා ඉකුත් දා සග සුව දිනීය. ප්‍රදීපය පාඨක සැම පිරිවරා ශෝකය පල කර සිටී.

කතෝලික සභාවේ.... 1 පිටුවෙන්

ප්‍රසිද්ධ "බීතෝවන්" නම් සංගීතඥයාගේ නිර්මාණ රසවිඳින්න, දකින්න අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මේවා පිටුදැකිය යුතුයි. මේ අවස්ථාවට පදවි අනුනායක අතිගරු නිහාල් නානායක්කාර පියතුමා ඇතුළු පූජක, පැවදි සංඝය ද විශ්‍රාමික රදගුරු අති උතුම් එල්මෝ පෙරේරා හිමිපාණන් සමඟින් සැදැහැවතුන් අති විශාල පිරිසක් ද සහභාගි වූහ. ගරු දිස්නා පැවදි සොයුරිය නව විදුහල්පතිනිය ලෙස එදින පත්වීය.

ශු. පවුලේ මංගල්‍යය... 5 පිටුවෙන්

තරුණ කාන්තාවන් තුන්දෙනෙක්ගෙන් ආරම්භ කළ මෙම ශු. පවුලේ සංඝය විවිධ බාධක, ආශිර්වාදයන් මධ්‍යයේ ඉතා සීඝ්‍රයෙන් වැඩි වර්ධනය විය. අනාථ දරුවන්, රෝගීන්, අද්‍යාපනය, වැඩිහිටියන් රැකබලා ගැනීම වැනි විවිධ අපෝස්තලික සේවාවන් වල නිරත වන මෙම පැවදි නිකායේ සුවිශේෂීත්වය වන්නේ සමාජයේ දැනෙන අවශ්‍යතා වලට ක්ෂණිකව පිළිතුරු දීමයි. ඇත්තෙන්ම මෙම ශු. පවුලේ සංඝය පැවදි නිකායක් ලෙස විතරක්ම හැඳින්වීම අසාධාරණයි. මන්ද එහි විවිධ කණ්ඩායම් පහක් සාමාජිකත්වය දරණ නිසායි. අපෝස්තලික සොයුරියන්, ධ්‍යානශීලි සොයුරියන්, කැපවූ ගිහි සොයුරියන්, පූජක සංඝය, තරුණ, ළමා වැඩිහිටි යන ගිහි කණ්ඩායම් පහකින් මෙම ශු. පවුලේ සංඝය නිර්මාණය වී ඇත. විශ්වීය ඒකාබද්ධතාවයක් පෙරදැරි කරගෙන විවිධ සේවාවන්වල යෙදෙන මෙම සංඝය අද ලංකාවේ ද සෑම පදවියකම කැපවී සේවය කරයි. විශේෂයෙන් අන්‍ය ආගමිකයන් බහුතරයක් ජීවත් වන බරවකකුඹුක, ඇඹිලිපිටිය, තලාව, හබරණ, මොණරාගල, අනුරාධපුර වැනි ප්‍රදේශවල කිසිදු ආගමික භේදයකින් තොරව සහජීවනය වෙනුවෙන් ඔවුන් කැපවී සේවය කරති. යාපනය හා කොළඹ ලෙස ප්‍රදේශ දෙකක් යටතේ අපෝස්තලික සේවාවන් කරන මෙම පැවදි සොයුරියන් මුළු ලංකාව පුරාම විසිරී සේවය කිරීම ඉතාමත් සුවිශේෂියි. විශේෂයෙන් යාපනය ප්‍රදේශයේ ද්‍රවිඩ භාෂාව කතා කරන සොයුරියෝ පසුගිය යුද්ධමය කාලයේ දී ජනතාව සමඟ අවතැන් වී, ඉතා බිහිසුණු අත්දැකීම් වලට මුහුණ දෙමින් එම "අසරණ ජනතාව" අතර මාංශගත විය. එලෙසම අනාථ කඳවුරු වලත්, ජනතාව නැවත පදිංචි වූ ප්‍රදේශවලත් කිසිදු භේදයකින් තොරව කොළඹ ප්‍රදේශයට අයිති සොයුරියන් ගොස් කැපවී සේවය කළහ.

ජේසු සමිඳුන්ගේ....6 පිටුවෙන්

කරගන්නා සම්බන්ධතා වාණිජමය / ද්‍රව්‍යමය / භාණ්ඩමය ස්වරූපයක් ගෙන තිබේ. තම වාසිය, ලාභය, තෘප්තිය පමණක් සිතන තත්ත්වයකට පත්ව ඇත. මාටින් බූබර් නම් දාර්ශනිකයා ප්‍රකාශ කරන පරිදි "We should have a I Thou relationship with others" එය ගෞරවාන්විත වූ සබඳතාවයකි.

## පළමු වසර සිහිකිරීම



**ලීනා පෙරේරා**
**කනුවන**

ලීනා අප නිවසේ රැජිණ, 2011 දෙසැම්බර් 31 වෙනිදාට සමිඳුන් සෙවනට ගොස් වසරකි. කනුවන, ජා-ඇල සාන්ත ජෝශප් මුනිඳුන්ගේ දෙව් විමනට ඇය කල අමිල සේවය එම දෙව්මැඳුරේ මීසම් පාලක ගරු බටේපොල පියතුමා කීවේ ලීනා දෙව් විමනට කළ සේවයට ඇයට සමිඳුන් තැනක් වෙන්කර ඇත. දැන් සමිඳාණෝ එයට ඇයව කැඳවා ගත්හ. ආදරයේ මුසුවෙන් සමිඳුන්ට මිනිසුන් තුළින් සේවය කිරීමේ ආදර්ශයේ පිය සටහන් ඔබ අප වෙත තබා ගියාය. ලීනා අපි ඔබව ඉතා ආදරයෙන් හා ගෞරවයෙන් සිහිපත් කරමු. පවුලේ සැම.

(N2311)

## පවුල් ව්‍යාපාරයේ නිර්මාතෘ දිවියෙන් සමුගනී !



ශ්‍රී ලංකා ක්‍රිස්තියානි පවුල් ව්‍යාපාරයේ නිර්මාතෘ පර්සි ඒ. සිල්වා මහතා ඉකුත් දෙසැම්බර් 04 දා දිවියට සමු දුන්නේය.

1967 අප්‍රේල් 01 දා මීගමුව ක්‍රිස්තු නිවසේදී පර්සි ඒ. සිල්වා මහතා සිය බිරිඳ ඇග්නස් මහත්මිය හා තවත් යුවල 07 ක් සමග ආරම්භ කළ ක්‍රිස්තියානි පවුල් ව්‍යාපාරය කොළඹ අගරදගුරු පදවියේ මීසම් රැසක ව්‍යාප්ත විය. අති උතුම් නික්ලස් මාකස් ප්‍රනාන්දු හිමිපාණන් අගරදගුරු ධූරයට පත්වීමත් සමග නිල වශයෙන් පිළිගැනීමට ලක්වූ ක්‍රිස්තියානි පවුල් ව්‍යාපාරය ඇරඹූ විවාහාපේක්ෂක සමුළු වලට සහභාගී වූ දස දහස් සංඛ්‍යාත යුවල ඒ මගින් සිය ජීවිතය ආලෝකවත් කර ගත්හ.

කොළඹ පදවියෙන් බැහැර හලාවත, කුරුණෑගල, බදුල්ල, මහනුවර, අනුරාධපුරය යනාදී රදගුරු පදවි වලට ද එය ව්‍යාප්ත විය. ක්‍රිස්තියානි පවුල් ව්‍යාපාර ජාත්‍යන්තර බලමුළුවේ සාමාජිකත්වය දිනා ගත්තේද පර්සි ඒ. සිල්වා මහතාගේ පරිශ්‍රමයෙනි. ඇග්නස් සිල්වා මහත්මියගේ ආදරණීය ස්වාමි පුරුෂයා වූ ඒ මහතා එක් පුතකුගේ සහ දියණියන් දෙදෙනෙකුගේ ආදරණීය පියාණන් විය. කළුතර දිසානායක ගරු ජුලියන් තිසේරා පියතුමාගේ ප්‍රධානත්වයෙන් ඒ මහතාගේ අවසන් කටයුතු හල්පේ සා. ප්‍රැන්සිස් සේවියර් මුනිඳුන්ගේ දෙව්මැඳුරේ සුසාන භූමියේදී සිදු කෙරිණි. "ඥානාර්ථ ප්‍රදීපය" සිය පාඨකයන් සමග ඒ මහතාගේ ආත්මයට නිත්‍ය සුව සන්තර්පනය ප්‍රාර්ථනා කරති.

**(සී.ආර්. ඩික්සන් ඇන්ටනි, සිසිල් ඩැනීසියස්)**

**මෙවර ප්‍රදීපයට දැන්වීම් ලබා දුන් අය වෙත කරන කාරුණික නිවේදනයයි !**

**ඔබ අප ආයතනයට බාර දුන් "මංගල යෝජනා, ස්තූති කිරීම්" දැන්වීම් මෙවර පල නොවී ඇත්නම් එම දැන්වීම ලබන සතියේ පලවන බව කරුණාවෙන් සලකන්න.**

## පළමු වසර ආදර සිහිකිරීම



**මනු උපත**
**1949**
**ජුනි**
**11**

**දෙව් උපත**
**2011**
**ජනවාරි**
**01**

**කඳාන රිලවුල්ලේ විසූ**
**කේ. මැල්බන් රුද්‍රිගු මහතා**
**(කඳාන ද මැසිනොද් විද්‍යාලයේ හිටපු උප විදුහල්පති)**

වසරක් ගත වුවද හදවත වැලපෙනවා
ඔබ ගැන මතක තවමත් සිත තුළ කකියනවා
දරුවන් සමග සිටියත් ඉකිබිඳ වැලපෙනවා
දෙව්දුන් තුළ නිසා මා ජීවත් වෙනවා

අප දිවියේ මිණි පහණ ඔබමයි පියාණනී
ඔබ රැකවරණ තුළ අප සුරැකුනි පියාණනී
ඔබ දිවි දිරිය අප පන්නරයයි පියාණනී
අප සැමටම ලැබ දෙන්න දෙව් ආසිරි පියාණනී

**අප හදවත් තුළ නොමියෙන මතක සැමරුම් තබා අපෙන් සමුගත් දයාබර හිමියනි, ආදර තාත්තේ, 2012.01.01 දිනට වසරක් සපිරෙන අද දින ඔබ නොමැති අඩුව අප හදවත් තුළට දැනෙන මේ මොහොතේ පතනෙමු ඔබට දෙවිඳුන් තුළ නිති සැනසුම. මෙයට ශෝකයට පත් ආදර බිරිඳ, දරු දෙදෙනා, බෑණා සහ පුංචි මුණුබුරන් දෙදෙනා.**

(N2314)







ලැබුවා වූ නව වසර
අපගේ පාරිභෝගික භවතු හටත්
ලක් වැසි ජනතාවටත්
සාමයෙන් සතුටින් පිරි
සෞභාග්‍යමත් නව වසරකට ආසිරි
විනෝදා - පුවත්පත් හා දැන්වීම් නියෝජිත
077-9767192 / vinoda.ads@gmail.com
(Q11N3316)

